# කාර්යසාධන වාර්තාව
# 2020




මැතිවරණ කොමිෂන් සභාව

# පටුන

පිටු අංකය


1. මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය....1
2. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර ....1
3. අරමුණු හා පරමාර්ථ ....2
4. කොමිෂන් සභාවේ කාර්යභාරය ....2
5. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019 ....2
6. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2020 ....3
7. පාර්ලිමේන්තු මැතිවරණය - 2020 ....7
8. පාර්ලිමේන්තු මන්ත්‍රීධූර පුරප්පාඩු පිරවීම....15
9. පළාත් සභා ඡන්ද විමසීම....16
10. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 දරන අධිකාරය) - පුරප්පාඩු පිරවීම ....16
11. විශේෂ ව්‍යාපෘති ....16
    11.1. ආබාධිත....16
    11.2. අන්තර්ජාතික දින සැමරුම ....18
        11.2.1. නිර්ප්‍රචණ්ඩත්වය හා සාමය සඳහා වූ පාසල් දිනය සැමරීම (ජනවාරි 30)....18
        11.2.2. ලෝක සමාජ සාධාරණත්ව දිනය (පෙබරවාරි 20) ....18
        11.2.3. අන්තර්ජාතික මව්භාෂා දිනය (පෙබරවාරි 21)....18
        11.2.4. මහජන සේවා දිනය (ජුනි 23)....19
        11.2.5. ජාත්‍යන්තර ළමා දිනය (ඔක්තෝම්බර් 01) ....19
        11.2.6. ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී දිනය (සැප්තැම්බර් 15) ....19
            11.2.6.1. අම්පාර දිස්ත්‍රික්කය ....19
            11.2.6.2. අනුරාධපුර දිස්ත්‍රික්කය ....19
            11.2.6.3. කොළඹ දිස්ත්‍රික් ජාතික වැඩසටහන....20
12. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ....20
13. උපායමාර්ගික සැලැස්ම ....20
14. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ....21
15. ලේඛනාගාරය ....21
16. 2020 වසර තුළ සිදුකරන ලද විශේෂිත කාර්යයන් ....21
17. නීති කටයුතු ....22

17.1. නීතිපති උපදෙස් විමසීම ....22

17.2. නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පවත්වනු ලබන සාකච්ඡා....23

17.3. නීති සංශෝධනවලට අදාළ කටයුතු ....24

17.3.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය.... 24

17.3.2. මැතිවරණ වියදම් පාලනය සඳහා වන නීති සම්පාදනය....24

17.4. නීති උපදෙස් ලබා දීම සහ අනෙකුත් නීතිමය කටයුතු ....25

17.5. නඩු කටයුතු සම්බන්ධව .... 26

17.6. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු....26

17.7. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දේශපාලන පක්ෂ පිළිගැනීමට 7(4)අ වගන්තිය යටතේ ක්‍රියා....26

17.7.1 දේශපාලන පක්ෂ සම්බන්ධ සෙසු කටයුතු....26

17.8. නීති හා විමර්ශන අංශයට අදාළ වෙනත් කටයුතු....27

18. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු ....27

19. කාර්ය මණ්ඩල තොරතුරු ....27

19.1. නව පත් කිරීම් ....28

19.2. ස්ථාන මාරු....28

19.2.1. අභ්‍යන්තර ස්ථාන මාරු ....28

19.2.2. කොමිෂන් සභාවෙන් පිටතට ලබාදෙන ස්ථාන මාරු ....28

20. විදෙස් පුහුණු හා නිල චාරිකා....29

20.1. නිල චාරිකා ....29

20.2. පුහුණු ....29

21. පාලන අංශයේ කටයුතු ....31

21.1. කාර්ය මණ්ඩල කටයුතු....31

21.1.1. කළමනාකරණ සේවා නිලධාරි සේවය ....31

21.1.2. සංවර්ධන නිලධාරි සේවය....31

21.1.3. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය....31

21.1.4. රියදුරු සේවය....31

21.1.5. රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලැබීම මත නිදහස් කිරීම ....31

21.1.6. කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම....32

21.1.7. පුරප්පාඩු තනතුරුවල රාජකාරි කටයුතු ආවරණය කිරීම ....................32

21.1.8. විශ්‍රාම ගැන්වීම් ....................32

21.2. පවිත්‍රතා කටයුතු.................... 32

21.3. ආරක්ෂක කටයුතු....................33

21.4. පුහුණු හා වැඩමුළු .................... 33

21.5. වාහන හා පාලනය....................35

21.6 ඡන්ද විමසීම සඳහා ලබා දුන් දායකත්වය....................35

22. ඉදිකිරීම් හා වත්කම් ....................36

22.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා ....................36

23. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අළුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම ....................36

23.1.ඡන්ද විමසීම්වලට අදාළව ....................36

23.2. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමට අදාළ....................37

23.3. ඡන්ද හිමි නාමලේඛන මුද්‍රණය ....................37

23.4. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම/අළුත්වැඩියා කිරීම/නඩත්තු කිරීමට අදාළව....................37

23.5. කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම....................38

23.6. පොදු....................38

24. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය....................39

24.1. 2020 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව....................39

24.2. ඡන්දහිමි නාමලේඛන පරීක්ෂාව සඳහා ඊ-සේවාව ලබාදීමට අදාළව....................39

24.3. පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව ....................40

24.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් නිර්මාණය කර සංවර්ධනය කරනු ලබන අනෙකුත් තොරතුරු තාක්ෂණ යෙදුම් ....................40

24.5. පද්ධති නඩත්තු කටයුතු .................... 40

24.6. 2020.08.05 වන දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු ....................41

24.6.1. නිල ඡන්ද පත්‍රිකා හා තැපැල් ඡන්ද කටයුතු.................... 41

24.6.2. ප්‍රතිඵල සකස් කිරීම හා මාධ්‍ය වෙත නිකුත් කිරීම....................41

24.6.3. දේශපාලන පක්ෂ සහ තරඟ කරනු ලබන ස්වාධීන කණ්ඩායම් සඳහා අදාළ කටයුතු ....................42

24.6.4.නියමු ව්‍යාපෘති (Pilot Projects)....................42

25. මූල්‍ය හා විගණන තොරතුරු ....................42

26. මූල්‍ය ප්‍රකාශ සටහන් ....................................................................................................49

26.1.ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ....................................................................................49

26.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ..............................................50

26.3. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ...........50

26.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ................................................................51

26.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව ................................................................................................51

26.6. කාර්ය සාධන දර්ශකය .................................................................................................................51

26.6.1. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය.........................................51

26.6.2. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු.................................................................... 51

26.6.3. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර..........52

26.7. මානව සම්පත් පැතිකඩ ..................................................................................................................52

26.7.1. සේවක සංඛ්‍යා කළමනාකරණය.................................................................................................52

26.7.2. මානව සම්පත් සංවර්ධනය ...........................................................................................................52

26.8. අනුකූලතා වාර්තාව........................................................................................................................54

27. සමාප්තිය ...........................................................................................................................................59

# ඇමුණුම්

පිටු අංකය


01. 2019 ඡන්දහිමි නාමලේඛණ සහතික කිරීමට අදාළ ගැසට් නිවේදනය : අංක 2159/40 හා 2020.01.24. 61

02. 2019 පරිපූරක ඡන්දහිමි නාමලේඛණයට නම් ඇතුළත් කිරීමට අදාළ අභියාචනා කාලසීමාව පිළිබඳ ගැසට් නිවේදනය : අංක 2160/62 හා 2020.02.01 ....................69

03. 2019 පරිපූරක ඡන්දහිමි නාමලේඛණ සහතික කිරීමට අදාළ ගැසට් නිවේදනය : අංක 2162/70 හා 2020.02.15....................71

04. 2019 ඡන්දහිමි නාමලේඛණයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව අනුව, එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගැනීමට හිමිකම් තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීධූර සංඛ්‍යාව...............72

05. 2018 හා 2019 වර්ෂවලට අදාළව තෝරා පත් කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීධූර සංඛ්‍යාව පිළිබඳ සංසන්දනය....................73

06. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය ප්‍රකාරව, හිමිකම් හා විරෝධතා සංඛ්‍යාව....................74

07. එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළව බහු ලියාපදිංචිය අනාවරණය වීම හේතුවෙන් ලියාපදිංචි නොකල නම් සංඛ්‍යාව ....................75

08. 2019 ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනයේදී ජාතික හැඳුනුම්පත් අංක ඉදිරිපත් කළ ඡන්ද හිමියන් පිළිබඳ තොරතුරු....................76

09. 2010 සිට 2019 දක්වා ජාතික හැඳනුම්පත් ඉදිරිපත් කළ ඡන්ද හිමියන්ගේ ප්‍රතිශත පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යනය ....................77

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 ව්‍යවස්ථාව ප්‍රකාරව, ඡන්දහිමි නාමලේඛණයේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලැබූ සංඛ්‍යාව....................78

11. මැතිවරණ කොට්ඨාස අනුව ඡන්ද නාමලේඛණයේ ලියාපදිංචිය පිළිබඳ තොරතුරු තුලනාත්මක සංසන්දනය - 2018 – 2019....................79

12. 2019 ඡන්දහිමි නාමලේඛණය සකස් කර සහතික කරන ලද සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී නම් ලැයිස්තුව ....................80

13. 2018 - 2019 වර්ෂවලදී ඊට පෙර වර්ෂයට සාපේක්ෂව ඡන්දහිමියන්ගේ වැඩිවීමේ ප්‍රතිශත සංසන්දනය ...81

14. 2010 සිට 2019 දක්වා ඡන්ද ප්‍රදේශ අනුව ඡන්ද හිමියන් ලියාපදිංචිය පිළිබඳ තුලනාත්මක සටහන ..........82

15. 2018 හා 2019 වර්ෂවලදී පරිපූරක ඡන්දහිමි නාමලේඛණයේ ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව.............89

16. 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) ව්‍යවස්ථාව ප්‍රකාරව, එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීධූර සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන ....................90

17. 2020 වර්ෂයට අදාළ ඡන්ද හිමියන් ගණන් ගැනීම ආරම්භ කළ බවට වූ ගැසට් නිවේදනය : අංක 2178/13 හා 2020.06.01....................91

18. 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනයට අදාළ හිමිකම් හා විරෝධතා හා ක්ෂේත්‍ර පරීක්ෂණ සඳහා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ නම් ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කිරීම : අංක 2207/04 හා 2020.12.22 දින දරන ගැසට් නිවේදනය....................92
19. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය : අංක 2165/08 හා 2020.03.02 ....................93
20. පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නාමයෝජනා ක්‍රියාවලිය පිළිබඳ ගැසට් නිවේදනය: අංක 2165/17 හා 2020.03.03....................95
21. පාර්ලිමේන්තු මැතිවරණයට මැතිවරණ කොට්ඨාස සඳහා මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමට තරඟයක් පවත්වනු ලබන බව හා ඡන්ද විමසීම් දිනය ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනය : අංක 2167/12 හා 2020.03.20....................97
22. ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර නාමයෝජනා ඇතුළත් ගැසට් නිවේදනය : අංක 2167/13 හා 2020.03.20...... 99
23. ඡන්ද විමසීම කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කල් තබන ලද බවට වූ ගැසට් නිවේදනය: අංක 2167/19 හා 2020.03.21 ....................110
24. ඡන්ද විමසීම 2020.06.20 දින පවත්වනු ලබන බවට වූ ගැසට් නිවේදනය : අංක 2172/03 හා 2020.04.20....................112
25. පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන දිනය නැවත කල් දැමීමත් , ඡන්ද විමසීම 2020.08.05 දිනට පැවැත්වීමට නියමිත බවට වූ ගැසට් නිවේදනය : අංක 2179/17 හා 2020.06.10....................114
26. පාර්ලිමේන්තු මැතිවරණය 2020.08.05 දින පෙ.ව. 07.00 සිට පස්වරු 05.00 දක්වා පැවැත්වෙන බවට වූ ගැසට් නිවේදනය : අංක 2184/18 හා 2020.07.15....................115
27. ඡන්ද ගණන් කිරීම හා නියෝජිත සහභාගීත්වය පැහැදිළි කරමින් පළකරන ලද ගැසට් නිවේදනය : අංක 2186/07 හා 2020.07.27....................116
28. 2020.08.05 දින පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද පොළ හා ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාව පිළිබඳ තොරතුරු....................118
29. එක් එක් පක්ෂ කණ්ඩායම ලබාගත් සම්පූර්ණ පාර්ලිමේන්තු මන්ත්‍රීධුර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු .........119
30. මැතිවරණ කොට්ඨාස මට්ටමින් ලබා ඇති ආසන සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ....................120
31. සාධාරණ බියක් හේතුවෙන් තමාගේ ඡන්ද පොළෙන් පිටත ඡන්ද පොළකදී ඡන්දය භාවිතා කිරීම සඳහා අයදුම්පත් කැඳවීමට අදාළ ගැසට් නිවේදනය : අංක 2165/18 හා 2020.03.03 ....................121
32. 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධි විධාන ප්‍රකාරව වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීමේ පහසුකම් සැපයීමට අදාළ ඡන්දපොළ ලැයිස්තුව ....................122
33. පාර්ලිමේන්තු මන්ත්‍රී ධූර පුරප්පාඩු පිරවීම....................124
34. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (15) වගන්තිය ප්‍රකාරව පුරප්පාඩු පිරවීම සඳහා වූ ගැසට් නිවේදනය : අංක 2160/10 හා 2020.01.27 ....................125

35. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 දරන අධිකාරය) - පුරප්පාඩු පිරවීම ....................126

36. අධිකරණ ක්‍රියාමාර්ගවලට අදාළ මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ පෙරකලාසි යොමු කිරීම 141

37. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළව කරන ලද ඉල්ලීම් පිළිබඳ තොරතුරු........................................................................................................................150

38. 2020 වර්ෂයේ විශ්‍රාම ගන්නා ලද නිලධාරීන් / සේවකයන් පිළිබඳ තොරතුරු ........................................151

39. මැතිවරණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව ..............................................................................................................152

## 1. මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, අතිගරු ජනාධිපතිතුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත මැතිවරණ කොමිෂන් සභාවට වසර 05ක කාලයක් සඳහා සාමාජිකයින් තිදෙනෙකු පත් කරනු ලැබූ අතර, ඉන් එක් අයෙකු සභාපති වශයෙන් පත් කරන ලදි. ඒ අනුව 2015.11.17 වන දින රාජකාරී භාර ගන්නා ලද හා 2020.12.03 දින සිය ධූර කාලය අවසන් කළ එකී ප්‍රථම කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වේ.

- මහින්ද දේශප්‍රිය මහතා (සභාපති)
- ජනාධිපති නීතිඥ එන්.ජේ. අබේසේකර මහතා (සාමාජික)
- මහාචාර්ය එස්. රත්නජීවන් එච්. හූල් (සාමාජික)

ප්‍රථම කොමිෂන් සභාවේ කාලය වසර 05 ට සීමා වුවද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව වෙනත් කොමිෂන් සභාවක් පත් කරනු ලබන තෙක් ඔවුනට ධූර කාලය තවදුරටත් දැරිය හැකි වූ අතර, නව කොමිෂන් සභාව 2020.12.03 දින පත් කරනු ලබන තෙක් පළමු කොමිෂන් සභාව ධූර දරන ලදි.

ඡන්ද විමසීම් මෙහෙයවීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරුනු බලතල ක්‍රියාත්මක කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ වගකීම විය. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්වල ගණපූර්ණය සාමාජිකයන් තිදෙනාම වීම තුළ එක් සාමාජිකයෙකු හෝ රැස්වීමට සහභාගී නොවීම හේතුවෙන් කොමිෂන් සභාව රැස්වීමට නීතිමය හැකියාවක් නොමැතිවීම හා ගන්නා තීරණවල වලංගුභාවය පිළිබඳ ගැටළු, 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් සභාපතිවරයා ඇතුළු සාමාජිකයන් පස්දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාව සඳහා පත්කිරීමෙන් ද, එයින් තිදෙනෙකු කොමිෂන් සභා රැස්වීම සඳහා සහභාගී වීම ප්‍රමාණවත් වීම හේතුවෙන්ද ගණපූර්ණය පිළිබඳ ගැටළුව අවසන් වී ඇත.

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව 2020.12.03 දින සිට පත්කරන ලද වර්තමාන මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි වේ.

- නිමල් පුංචිහේවා මහතා (සභාපති)
- එස්.බී.දිවාරත්න මහතා (සාමාජික)
- එම්.එම්.මොහමඩ් මහතා (සාමාජික)
- කේ.පී.පී.පතිරණ මහතා (සාමාජික)
- ජීවන් ත්‍යාගරාජා මහතා (සාමාජික)

## 2. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" යන්න කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා "ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියළු පාර්ශව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙය වීම" යනුවෙන් මෙහෙවර ප්‍රකාශය වේ.

## 3. අරමුණු හා පරමාර්ථ

- සුදුසුකම් ඇති සියලුම පුරවැසියන්ට නිදහස් හා සාධාරණ ලෙස පවත්වනු ලබන්නා වූ ඡන්ද විමසීම්වලදී නොබියව, නිදහසේ, විශ්වාසයක් ඇතිව සිය ඡන්දය පාවිච්චි කිරීමට අවස්ථාව සැලසීම.
- ඡන්දය පාවිච්චි කිරීම පුරවැසියන් වෙත ඇති අන්සතු කළ නොහැකි අයිතියක් බවත්, මැතිවරණ ක්‍රියාවලිය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගී වන බවත් අවබෝධ කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ඡන්ද විමසීම් කාලසීමාව තුලදී සියලු ඡන්ද අපේක්ෂකයන්ට සම හා සාධාරණ අවස්ථා ලැබෙන පරිදි ක්‍රියාකිරීමට පියවර ගැනීම.
- සියලුම ඡන්ද විමසීම්වලට පූර්වයෙහි සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් වූ, යථාවත් කරන ලද ඡන්දහිමි නාමලේඛනයක් සකස් කිරීම.
- සමාජය තුළ ආන්තික ලෙස ජීවත්වන සියලු පුරවැසියෝ විශ්වාසවන්ත ලෙස හා ප්‍රමාණවත් ලෙස ඡන්ද විමසීම් ක්‍රියාවලියට සහභාගී කරවීමට අවශ්‍ය පියවර ගැනීම.
- මැතිවරණ ක්‍රියාවලිය දක්ෂ ලෙස හා පාරදෘශ්‍ය ලෙස පරිපාලනය කිරීම.
- ඡන්ද විමසීම් ක්‍රියාවලියට හා මැතිවරණ කොමිෂන් සභාවට අදාළ දත්ත හා තොරතුරු පාර්ශවකරුවන්ට ලබාගැනීමේ පහසුකම් කාලානුරූපව හා ප්‍රමාණවත් ලෙස සලසනු ලැබීම.

## 4. කොමිෂන් සභාවේ කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාව අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් පැවැත්වීම, කොමිෂන් සභාවේ මූලික කාර්යභාරය වේ. ඒ අනුව ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම්, පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම්, පළාත් පාලන ආයතනයන්හි ඡන්ද විමසීම් හා ජනමත විචාරණ යනාදී ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණව පැවැත්වීම ද ඊට අදාලව වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය ද සිදුකළ යුතුවේ. මෙම ව්‍යවස්ථාපිත කටයුතුවලට අමතර වශයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම, පළාත් සභා සභිකධුරවල පුරප්පාඩු පිරවීම හා පළාත් පාලන ආයතනවල සභිකධුරවල පුරප්පාඩු පිරවීම ද දේශපාලන පක්ෂ පිළිගැනීම හා ලියාපදිංචි කිරීමද යන ව්‍යවස්ථාපිත කාර්යයන්ද මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

## 5. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2019

5.1.2019 ඡන්ද හිමි නාමලේඛනය සකස් කිරිමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් අවසන් කර තිබූ බැවින්, මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි, 2019 ඡන්ද හිමි නාමලේඛනය, 2020.01.24 දින, දිවයිනේ සියලුම මැතිවරණ කොට්ඨාසවල ඒ ඒ ලියාපදිංචි කිරීමේ/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරින් මඟින් සහතික කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර,එදිනම ඒ පිළිබඳව අංක 2159/40 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ (ඇමුණුම 01) තොරතුරු පළ කිරිමට මෙන්ම භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කිරිමටත්, මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරි/ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ද මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදි.

5.2. 2017 අංක 10 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරිමේ (විශේෂ විධිවිධාන) පනත අනුව 2019 පරිපූරක නාමලේඛනය සකස් කිරිම පිළිබඳව අයදුම්පත් භාර ගැනීම 2020.01.25 දින සිට 2020.01.31 දක්වා සිදු කරන බවට අංක 2159/63 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ 2020.01.25 දින පළකරන ලද අතර, ඊට අදාළ මාධ්‍ය නිවේදනය භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරිමට කටයුතු කරන ලදි. එසේම 2020.02.01 සිට 2020.02.14 දක්වා පරිපූරක නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීම සඳහා වූ අභියාචනා කාලසීමාව පිළිබඳව අංක 2160/62 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ (ඇමුණුම 02) 2020.02.01 දින පළකරන ලද අතර, ඊට අදාළ මාධ්‍ය නිවේදනය භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම්

පළ කිරිමට කටයුතු කරන ලදි. එසේම පරිපූරක නාමලේඛනය සඳහා අයදුම්පත් වන්නි මැතිවරණ කොට්ඨාසයේ මන්නාරම දිස්ත්‍රික්කයට අදාළව පමණක් ලැබී තිබු අතර, 2019 පරිපූරක නාමලේඛනය 2020.02.15 දින වන්නි මැතිවරණ කොට්ඨාසයේ සහකාර ලියාපදිංචි කිරිමේ නිලධාරින් මඟින් සහතික කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලද අතර, ඒ පිළිබඳ වූ ගැසට් නිවේදනයක් එදින අංක 2162/70 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ **(ඇමුණුම 03)** පළ කිරිමටත්, භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරිමටත් අවශ්‍ය පියවර ගන්නා ලදි. අදාල කාලසීමාව තුළ අයදුම්පත් 21ක් ලැබුනු අතර ඉන් 11ක් ඡන්දහිමියන් ලෙස ලියාපදිංචි කිරීමට පිළිගන්නා ලදි.

2019 වර්ෂයේ මුළු ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව 16,263,885 කි.

5.3 වාර්ෂික ඡන්ද හිමි නාමලේඛනය, සකස් කර සහතික කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 98 (8) වැනි අනු ව්‍යවස්ථාව යටතේ වූ නියමය පරිදි ක්‍රියා කිරිම සඳහා සකස් කරනු ලැබූ 2019 ඡන්ද හිමි නාමලේඛනයේ ඒ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව පදනම් කරගෙන එක් එක් මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කරනු ලැබිය යුතු පාර්ලිමේන්තු මන්ත්‍රිධුර සංඛ්‍යාව දැක්වෙන ලේඛනය ඇමුණුම් ගතව ඇත **(ඇමුණුම 04 )**.

5.4 2019 වර්ෂයේ ඡන්දහිමි නාම ලේඛණයට අදාල පහත සඳහන් දත්ත සහ විස්තර, ඇමුණුම් ලෙස මෙම වාර්තාවට ඇතුලත් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ නියමය පාර්ලිමේන්තු මැතිවරණ වල දි එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගැනීමට හිමිකම් තිබෙන මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පිළිබඳ 2018 හා 2019 වර්ෂ සඳහා සංසන්දනාත්මක සටහන **(ඇමුණුම 05)**, එමෙන්ම 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉදිරිපත් කිරීම්වලට අදාළව ලද හිමිකම් හා විරෝධතා පිළිබඳ තොරතුරු **(ඇමුණුම 06)**, එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචි බව අනාවරණය වූ බැවින් ලියාපදිංචි නොකල නම් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු **(ඇමුණුම 07)**, 2019 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයින් සංඛ්‍යාව **(ඇමුණුම 08)**, 2010 සිට 2019 දක්වා වර්ෂවල ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවල දී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කල පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳ සංසන්ධනාත්මක ප්‍රකාශය **(ඇමුණුම 09)**, අපරාධ නීතිය, අල්ලස් පනත සහ මැතිවරණ නීති යටතේ ඡන්ද විමසීම් වලදී සිදුකළ වරදවල් සහ වෙනත් හේතුමත සිර දඬුවම් විඳීම හේතුවෙන් 2019 ඡන්ද හිමි නාමලේඛනයෙන් නම් ඉවත් කිරීමට සිදු වූ පුද්ගලයින් සංඛ්‍යාව පිළිබඳ විස්තර **(ඇමුණුම 10)**, මැතිවරණ කොට්ඨාස අනුව ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳ 2018 - 2019 තුලනාත්මක සටහන **(ඇමුණුම 11)**, එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති දිස්ත්‍රික් සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ නම් ලැයිස්තුව **(ඇමුණුම 12)**, 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ වැඩි වූ ඡන්දහිමියන් සංඛ්‍යාව හා එහි ප්‍රතිශතයද, 2018 ට සාපේක්ෂව 2019 වර්ෂයේ ඡන්දහිමි ප්‍රතිශතයද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත **(ඇමුණුම 13)**. ඡන්ද ප්‍රදේශ අනුව ලියාපදිංචි වී ඇති ඡන්ද හිමියන් සංඛ්‍යාව පිළිබඳ 2010 සිට 2019 දක්වා වර්ෂවලට අදාළ තුලනාත්මක සටහන **(ඇමුණුම 14)**, 2017 අංක 10 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධි විධාන) පනත ප්‍රකාරව 2018 හා 2019 වර්ෂවල ලද අයදුම්පත්‍ර සහ ලියාපදිංචි කරන ලද ඡන්ද හිමියන් සංඛ්‍යාව පිළිබඳ විස්තරද මෙම වාර්තාවට ඇතුළත් කර ඇත **(ඇමුණුම 15)**, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා තුලනාත්මක සටහන **(ඇමුණුම 16)**.

## 6. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2020

Covid -19 වසංගත තත්ත්වය පැතිරයාම හේතුවෙන් 2020 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය අභියෝගාත්මක ක්‍රියාවලියක් විය.

වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලියේදී, පළමු අදියර වශයෙන් එම වර්ෂයේ මාර්තු මාසයේදී සියලුම දිස්ත්‍රික්ක සඳහා බීසී ආකෘති රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කර අවසන් කිරීම, අප්‍රේල් මාසයේදී සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත බෙදා හැරීම මෙන්ම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් ග්‍රාම නිලධාරින්/ගණන් ගන්නා නිලධාරින්ට උපදෙස් පන්ති පවත්වා ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් සඳහා බෙදා හැරීමේ කටයුතු අවසන් කිරීම සහ මැයි මස අවසන් වනවිට දිවයිනේ සියලුම නිවස්වලට ග්‍රාම නිලධාරින්/ගණන් ගන්නා නිලධාරින් මගින් ගෘහ මූලිකයින් වෙත බෙදා හැරීම සිදු කරනු ලැබේ. නමුත් මෙම වසරේ ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු ආරම්භක කාලය වන මාර්තු/අප්‍රේල්/මැයි මාසවල Covid – 19 වසංගතය පැතිරියාම/ වසංගතය පැතිරියාම අවම කිරීම සඳහා රජය විසින් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම/ රජයේ නිලධාරින් නිවසේ සිට රාජකාරි ඉටු කිරීම/කාර්යාලවලට වාර්තා කලයුතු නිලධාරින් සංඛ්‍යාව සීමා කිරීම සහ 2020 - පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ මූලික කටයුතුවල සීමිත පිරිසක් පමණ නිරතවීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු සුපුරුදු පරිදි සිදු කිරීම දුෂ්කර විය.

එනමුත්, 2020 අප්‍රේල් මස 20 දින සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ සාකච්ජාව හා ඉන් අනතුරුව ග්‍රාම නිලධාරි වෘත්තිය සමිති නියෝජිතයින් සමඟ කරන ලද සාකච්ජාවේදී ජුනි 01 දිනට නව පදිංචියට පැමිණ ඇති තැනැත්තන්,පදිංචිය මාරුකර ඇති තැනැත්තන්,අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ගේ, මියගිය තැනැත්තන්ගේ විස්තර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ආකෘතියක් මගින් ලබා ගැනීම සිදු කළයුතු බවට හා ඊට අමතරව ඊ තාක්ෂණය ඔස්සේ ද විස්තර ලබා ගැනීම පිළිබඳව සාකච්ජාවූ අතර, ඒ අනුව මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

එසේම, 2020 මැයි මස 20 දින සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ සාකච්ජාවක් පවත්වන ලද අතර, එහිදී ඉදිරි ප්‍රතිශෝධන කටයුතු හා 2020 - පාර්ලිමේන්තු මැතිවරණය පාලිත Covid – 19 වසංගතය සමඟ පැවැත්වීමේ ක්‍රියාවලිය පිළිබඳව අදහස් ලබා ගන්නා ලදි.

තවද පසුගිය වසර කිහිපයකම ගෘහමූලික වෙත තමන්ගේ නිවසේ ලියාපදිංචිවී සිටින ඡන්ද හිමියන්ගේ තොරතුරු ලදුපතක්, නව බීසී ආකෘතිය මගින් මුද්‍රණය කර ලබාදී ඇති ආකාරයට 2020 වර්ෂය සඳහා ලබාදීම සුදුසු බවට දන්වා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල කිහිපයකින් කරන ලද ඉල්ලීම අනුව, මෙවර ද දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක සඳහා ඡන්ද හිමියන්ගේ තොරතුරු ඇතුළත් බීසී ආකෘති මුද්‍රණය කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලද අතර, එම කටයුතු රජයේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කිරීමට කටයුතු සිදු කරන ලදි.

1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තිය අනුව 2020 වර්ෂයට අදාළ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කළ බවට අංක 2178/13 හා 2020.06.01 දිනැති ගැසට් නිවේදනය (ඇමුණුම 17) ප්‍රකාශයට පත් කළ අතර, ඒ පිළිබඳව දිවයින,ඩේලි නිවුස් හා වීරකේශරි පුවත්පත්වල ද දැන්වීමක් පළකරන ලදි. එසේම,මේ පිළිබඳ වූ දැන්වීමක් සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි කාර්යාලවල/ඒ ඒ ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල/පළාත් පාලන ආයතනවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරි කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලදි.

වාර්ෂික ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව, පළමුවෙනි අදියර වශයෙන් ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කටයුතු සිදුකරනු ලබන අතර, එම කටයුතු ඉටු කරවා ගැනීම සඳහා ව්‍යවස්ථාපිතව රාජකාරි පවරන ලද ග්‍රාම නිලධරයන් සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් අවශ්‍යවන හෙයින්, මේ පිළිබඳව ලේකම්,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශය වෙත කරන ලද ඉල්ලීම අනුව, 2020 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ද ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාල

සීමාව තුළ අදාළ ග්‍රාම නිලධාරි ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ ග්‍රාම නිලධාරි කාර්යාල දින සීමා කිරීම / විශ්‍රාම ගැනීමේ කාලය දීර්ඝ කිරීම යන කරුණට අදාළව කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීම් සඳහා එම අමාත්‍යාංශය මගින් අනුමැතිය ලබාදී ඇති බැවින්, ඒ පිළිබඳව දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන් සහ එමගින් සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන් දැනුම්වත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි.

2019 - ජනාධිපතිවරණයට /2020 පාර්ලිමේන්තු මැතිවරණයට/ තමන් වෙත/පවුලේ සියලුම සාමාජිකයින් වෙත එකම ස්ථානයක දිගු කලක් පදිංචි වී සිටින නමුදු, නිල ඡන්ද දැන්වීම් පතක්/ නිල ඡන්ද දැන්වීම්පත් නොලැබුණු බවට මෙන්ම ඡන්දය ලියාපදිංචි වී නොමැති බවට ප්‍රධාන කාර්යාලයට හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලැබුණු සියලුම පැමිණිලි පිළිබඳව පෞද්ගලිකව සොයා බලා 2020 වර්ෂය සඳහා ඡන්ද හිමියෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට සුදුසුකම් සපුරා තිබේනම් හා අවශ්‍යවූ විට ස්ථානීය පරීක්ෂණ ද සිදුකර එවැනි තැනැත්තන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම්වත් කරන ලදි.

2020 - ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති බවටත්, ඒ සඳහා පිළිගත් දේශපාලන පක්ෂවලින් නිරීක්ෂණ කටයුතු සඳහා නියෝජිතයින් 2020.08.10 දින හෝ ඊට පෙර නම් කර, ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට යොමු කරන ලෙසට සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන්ට හා මැතිවරණ නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන්/සම්බන්ධිකාරකවරුන් වෙත පිටපතක් සහිතව සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට 2020.07.24 දිනැතිව ලිපියක් යවන ලද නමුත්, දේශපාලන පක්ෂවල ක්‍රියාකාරි නියෝජිතයින් 2020 පාර්ලිමේන්තු මැතිවරණ කටයුතුවල නියැලී සිටින හෙයින්, එම කාලය දීර්ඝ කර දෙන ලෙසට සමහර දේශපාලන පක්ෂවල කරන ලද ඉල්ලීම අනුව එම කාලය දීර්ඝ කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අතර, ඒ පිළිබඳව ද සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට 2020.08.10 දිනැතිව ලිපියක් යවන ලදි.

ගණන් ගන්නා නිලධාරින්/ග්‍රාම නිලධාරින් විසින් ගෙයින් ගෙට ගොස් වාර්ෂිකව සිදුකෙරෙන ඡන්ද හිමියන් ගණන් ගැනීම, සෑම වර්ෂයකම ජූනි මස 01 වන දින ආරම්භ කිරීමට පැවති සම්ප්‍රදාය Covid – 19 වසංගතය පැතිරියාම අවම කිරීම සඳහා ග්‍රාම නිලධාරින් ඒ ආශ්‍රිත රාජකාරිවල නිරත කරවීමද, රජය විසින් නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, රජයේ නිලධාරින් නිවසේ සිට රාජකාරි ඉටු කිරීම, කාර්යාලවලට වාර්තා කලයුතු නිලධාරින් සංඛ්‍යාව සීමා කිරීම සහ 2020 - පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ මූලික කටයුතුවල සීමිත පිරිසක් පමණ නිරතවීම හේතුවෙන් ප්‍රමාද වූ 2020 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කරන ලෙසට දන්වා, ඉදිරි වැඩ සැලැස්ම හා අදාළ ආකෘති හා උපදෙස් සමඟ සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන් වෙත 2020.08.17 දිනැතිව උපදෙස් චක්‍රලේඛය නිකුත් කරන ලදි.

2020 - පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කටයුතු සඳහා ඡන්ද පොල කාර්ය මණ්ඩල වෙත යවා භාවිතයෙන් තොරව ආපසු ලැබුණු සහ ගබඩාවල ඉතිරිව තිබූ මුහුණු ආවරණ, මුඛ ආවරණ හා විෂබීජ නාශක දියර වැනි Covid – 19 සෞඛ්‍යාරක්ෂිත ද්‍රව්‍ය ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කාර්යය කරන දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරින්/විශේෂ ගණන් ගන්නා නිලධාරින් වෙත ලබාදීමට කටයුතු කරන ලදි.

2020 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත 2020.10.07 දිනැතිව ලිපියක් යොමුකර ඇත. එම ලිපියේ ඡන්ද හිමියන් ගණන් ගැනීමට අදාළව ක්ෂේත්‍ර කටයුතු නිරීක්ෂණය සඳහා ග්‍රාම නිලධරයන් සමඟ ගෘහයෙන් ගෘහයට යෑමට නියෝජිතයින් සහභාගි නොවන්නේ නම් අවම වශයෙන් ග්‍රාම නිලධාරි කාර්යාලයේදී හෝ එකි ලේඛන පරීක්ෂා කිරීම සිදු කරන

ලෙස දන්වා ඇති අතර, අදාළ ලේඛන ග්‍රාම නිලධාරි විමසා ග්‍රාම නිලධාරි කාර්යාලවලදි හෝ පරික්ෂා කිරිම් කරන ලෙස දේශපාලන පක්ෂ ලේකම්වරුන්ට උපදෙස් ලබාදෙන ලදි.

එසේම, ගණන් ගන්නා නිලධාරින්ට (ග්‍රාම නිලධාරින්ට),වැඩ බලන වසම්වල ග්‍රාම නිලධාරින්ට සහ විශේෂ ගණන් ගන්නා නිලධාරින්ට ඡන්ද හිමියන් ගණන් ගැනීම වෙනුවෙන් ගෙවනු ලබන දීමනා ආයතන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වර්ෂ කිහිපයකට පසුව කොමිෂන් සභාවේ ඉල්ලීම මත වැඩි කර ඇති බැවින්, ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා පැවරි ඇති ප්‍රදේශයේ ඡන්ද හිමියන් පදිංචි සියළුම නිවාසවල ගෘහ මූලිකයින් වෙතින් ලැබෙන "බීසී" ආකෘති පත්‍රවල අදාළ නිර්දේශ ද ඇතුළත් කොට "අ" "ආ" ලැයිස්තු සහ සංඛ්‍යා ලේඛන හා අනිකුත් වාර්තා මැතිවරණ කාර්යාලයට භාරදීමට නියම කර ඇති දිනයේ දී (ඇඳිරිනීතිය හා සංචරණ සීමා සැලකිල්ලට ගෙන) නිසිලෙස භාරදෙනු ලබන ගණන් ගන්නා නිලධාරින්ට,වැඩ බලන වසම්වල ග්‍රාම නිලධාරින්ට සහ විශේෂ ගණන් ගන්නා නිලධාරින්ට පහත වගුවේ සඳහන් පරිදි අදාළ දීමනා වැඩිකර ඇති බවට සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත 2020.11.11 දිනැති ලිපිය මගින් යැවීමට කටයුතු කරන ලදි.

| අදාළ කාර්යය | 2019 දක්වා ගෙවූ දීමනාව | 2020 අනුමත දීමනාව |
|---|---|---|
| ග්‍රාම නිලධාරින්ට තම ස්ථිර වසමට අදාළව ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා එක් බීසී පත්‍රයක් වෙනුවෙන් | රු.9.50 | රු.13.00 |
| ග්‍රාම නිලධාරින්ට තම ස්ථිර වසමේ වතුවල ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා එක් බීසී පත්‍රයක් වෙනුවෙන් | රු.10.00 | රු.14.00 |
| ග්‍රාම නිලධාරින්ට වැඩබලන වසම්වලට අදාළව ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා එක් බීසී පත්‍රයක් වෙනුවෙන් | රු.9.50 | රු.15.00 |
| විශේෂ ගණන් ගන්නා නිලධරයන්ට ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා එක් බීසී පත්‍රයක් වෙනුවෙන් | රු.15.00 | රු.20.00 |

ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2020 ට අදාළව 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 13 වන වගන්තිය යටතේ සකස් කරන ලද "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම සහ පනතේ 14 වගන්තිය යටතේ නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා හිමිකම් සහ විරෝධතා භාර ගැනීම පිළිබඳව විස්තරාත්මක උපදෙස් ලිපියක් 2020.12.08 දිනැතිව සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරිමේ නිලධාරින්ට හා නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මේ පිළිබඳව දැනුම්වත් කර සියලුම දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත 2020.12.26 දිනැතිව ලිපියක් ද යොමුකර ඇත.

ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2020 ට අදාළව 8(1) වගන්තිය අනුව හිමිකම්, විරෝධතා හා ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම සඳහා සහකාර ලියාපදිංචි කිරිමේ නිලධාරින් අංක 2207/4 සහ 2020.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් (ඇමුණුම 18) නමින් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇත.

ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2020 ට අදාළව හිමිකම්/ විරෝධතා ඉල්ලුම්පත් භාර ගැනීම හා ඒ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම යන මාතෘකාව යටතේ සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරිමේ නිලධරයන් වෙත 2020.12.31 දිනැතිව උපදෙස් ලිපියක් මගින් දැනුම් දෙන ලද අතර 1980 අංක 44 දරණ ඡන්ද හිමියන් ලියාපදිංචි කිරිමේ පනතේ 18(2) හා 18(3) උපවගන්ති අනුව Covid – වසංගත 19 තත්ත්වය මත ගණන් ගැනීම නිසියාකාරව සිදු නොවූ එහෙත් සුදුසුකම් ලබන ඕනෑම තැනැත්තෙක් නාමලේඛනය සහතික කිරිමට පෙර ලිපි දෝෂ නිවැරදි කිරීම සහ සටහන් නිවැරදි කිරීම යටතේ නමක් ඇතුළත් කිරිමට හෝ ඉවත් කිරිමට කල හැකි බව හා එම ලිපි දෝෂ, සටහන් නිවැරදි කිරිම වෙනත්

දිස්ත්‍රික්කයක් සම්බන්ධවන විට, ඒ පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට තොරතුරු ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය බවට සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි/සහකාර ලියාපදිංචි කිරීමේ නිලධරයන් වෙත උපදෙස් ලිපියක් මගින් දැනුම් දෙන ලදි.

අර්ධ වශයෙන් හා සම්පූර්ණ වශයෙන් නැවත පදිංචි කිරීමේ කටයුතු අවසන් නොවූ ප්‍රදේශවල ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සම්බන්ධව විවිධ වැඩසටහන් දියත් කල අතර මෙහිදී මෙම ඡන්දහිමියන් ජීවත් වීම සම්බන්ධව තහවුරුවක් ලබාගැනීමට කටයුතු කරන ලදි.

## 7. පාර්ලිමේන්තු මැතිවරණය - 2020

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 9 වැනි පාර්ලිමේන්තු මැතිවරණය 2020 අගෝස්තු 05 වැනි දින පෙරවරු 7.00 සිට පස්වරු 5.00 දක්වා ඡන්ද මධ්‍යස්ථාන 12954 කදී සිදුකරන ලදි.

7.1 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලැබී ඇති බලතල අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් 2020.03.02 දිනැති අංක 2165/8 දරණ ගැසට් නිවේදනය (ඇමුණුම19) මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදි. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණය 2020.04.25 දින පැවැත්වීමටත් අභිනව පාර්ලිමේන්තුව 2020.05.14 දින රැස්වීම සඳහා කැඳවන බවට ප්‍රකාශයට පත්කිරීමත් සමඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ මූලික කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදි.

7.2 එසේම, පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නාමයෝජනා ක්‍රියාවලිය සම්බන්ධයෙන් අංක 2165/17 හා 2020.03.03 දිනැති ගැසට් පත්‍රය (ඇමුණුම 20) මගින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා නාමයෝජනා පත්‍රයට ඇතුළත් කළයුතු අපේක්ෂක සංඛ්‍යාව හා ස්වාධීන කණ්ඩායම් විසින් ඇප තැන්පත් කළයුතු තොරතුරු සහිතව ගැසට් පත්‍රයක් පළකරන ලදි.

7.3 ඒ අනුව, දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22 ක තේරීම්භාර නිලධාරි කාර්යාලයේ දි 2020.03.03. සිට 2020.03.19 දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප තැන්පත් භාර ගැනීමට කටයුතු කරන ලද අතර, පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2020.03.12 දින සිට 2020.03.19 මධ්‍යාහ්න 12.00 දක්වා කාර්යාල දිනවලදි තේරීම්භාර නිලධාරින් විසින් නාමයෝජනා භාර ගැනීමට කටයුතු කරන ලද අතර, Covid -19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් 2020.03.16 දින රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනය ලෙස ප්‍රකාශයට පත්කල බැවින් එදින නාමයෝජනා භාර ගැනීම හෝ ඇප තැන්පත් භාර ගැනීම සිදු නොකරන ලදි.

7.4 එමෙන්ම, නාමයෝජනා භාර ගැනීමේ කටයුතු 2020.03.19 දින මධ්‍යාහ්න 12.00 ට අවසන් කරන ලද අතර, මුළු දිවයින සඳහාම පිළිගත් දේශපාලන පක්ෂ 40 කින් හා ස්වාධීන කණ්ඩායම් 358 කින් නාමයෝජනා පත්‍ර 697 ක් ලැබුණු අතර, එහි නාමයෝජනා 617ක් පිළිගත් බවට හා නාමයෝජනා 80 ක් ප්‍රතික්ෂේප කළ බවට ඒ ඒ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරින් විසින් මැතිවරණ කොමිෂන් සභාවට වාර්තා කර ඇත. ඒ අනුව තරඟ කරනු ලබන මුළු අපේක්ෂක සංඛ්‍යාව 7452 කි. 2020.04.25 දින පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන බව අංක 2167/12 හා 2020.03.20 දිනැති ගැසට් පත්‍රයෙන් (ඇමුණුම 21) නිවේදනය කරන ලදි.

7.5 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුර සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 22 කින් අපේක්ෂකයින් 418 දෙනෙකුගේ නම් ලැයිස්තු 2020.03.19 දින මධ්‍යාහ්න 12.00 වනවිට මැතිවරණ කොමිෂන් සභාවට භාරදී ඇති අතර, එම ජාතික ලැයිස්තු නාමයෝජනා පිළිබඳව අංක 2167/13 හා 2020.03.20 දිනැති ගැසට් පත්‍රය (ඇමුණුම 22) මගින් තොරතුරු පළකර ඇත.

7.6 කෙසේවුද Covid - 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජය විසින් මුළු දිවයිනටම ඇඳිරි නීතිය ප්‍රකාශ කිරීම, සංචරණ සීමා පැනවීම සහ රජයේ සියලු කටයුතු දැඩි සීමා කිරීම හා අත්‍යවශ්‍ය සේවාවන්ට පමණක් අවසර දීම යන කරුණු හේතුවෙන් 2020.04.25 දින ඡන්ද විමසීම් පැවැත්වීමට නොහැකි බව හා ඡන්ද විමසීම් දිනය 2020.04.30 දිනය පසු වී දින 14 කට පසු දිනයක් නියම කරනු ලබන බව මැතිවරණ කොමිෂන් සභාව තීරණය විසින් නිවේදනය කරන ලදි. එම නිවේදනය 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(3) වගන්තිය යටතේ අංක 2167/19 හා 2020.03.21 දිනැති ගැසට් පත්‍රය (ඇමුණුම 23) මගින් ප්‍රසිද්ධ කරන ලදි.

7.7 2020 - පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නාමයෝජනා භාර ගැනීමට කටයුතු අවසන් වනවාත් සමගම Covid – 19 වසංගතය පැතිරියාම/ වසංගතය පැතිරියාම අවම කිරීම සඳහා රජය විසින් ඇඳිරිනීතිය පැනවීම/ රජයේ නිලධාරින් නිවසේ සිට රාජකාරි ඉටු කිරීම/කාර්යාලවලට වාර්තා කලයුතු නිලධාරින් සංඛ්‍යාව සීමා කිරීම යන ආදි කරුණු හේතුවෙන් පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ රාජකාරි කටයුතු සිදු කිරීම ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හා අනිකුත් රජයේ කාර්යාලවල හා මැතිවරණ රාජකාරියට අදාළ පුද්ගලික ආයතනවලද ඊට අදාළ කාර්යයන් සිදු කිරීම තාවකාලිකව නතර කිරීමට සිදුවූ අතර, මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 2020 අප්‍රේල් මස 01 වන දින සිට සති දෙකක් පමණ සම්පූර්ණයෙන්ම වසා තැබීමට කටයුතු කරන ලද අතර, අප්‍රේල් මස අවසානයේදී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරින් විසින් ප්‍රධාන කාර්යාලට භාර දෙන ලද පිළිගත් නාමයෝජනා පත්‍ර කොරෝනා වසංගතය පැතිරියාමේ අවදානම් තත්ත්වය මත සීමිත කාර්ය මණ්ඩල යොදවා පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කර, ගැසට් කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත භාර දෙන ලදි.

7.8 පාර්ලිමේන්තු මැතිවරණය 2020.06.20 වන දින පවත්වනු ලබන බව අංක 2172/3 හා 2020.04.20 දිනැති ගැසට් නිවේදනය (ඇමුණුම 24) මගින් ප්‍රසිද්ධ කරන ලදි.

7.9 පාලිත කොරෝනා වසංගතය සමඟ 2020 - පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව /සෞඛ්‍ය බලධාරින් හා මෙයට සම්බන්ධවන වෙනත් පාර්ශව සමඟ දීර්ඝ වශයෙන් සාකච්ඡා පවත්වන ලදි. නාමයෝජනා භාරදී ඇති සියලුම පක්ෂ ලේකම්වරුන් සමඟ ද සාකච්ඡා පවත්වන ලද අතර, සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කර, ඡන්ද විමසීම් පැවැත්වීම පිළිබඳව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/කොරෝනා වසංගත රෝග වැලැක්වීමේ ජාතික මධ්‍යස්ථානයේ ප්‍රධානින් සමඟ ද සාකච්ඡා වට කිහිපයක්ම පවත්වන ලද අතර, මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා දේශපාලන පක්ෂවල යෝජනා/අදහස් ලිඛිතව ලබා ගැනීමට කටයුතු කර, නැවත මූලික කටයුතු ඉටු කිරීමට ආරම්භ කරන ලදි.

7.10 පාලිත කොරෝනා වසංගත තත්ත්වය යටතේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමේ මාර්ග සිතියම් සකස් කිරීමේ මූලික සාකච්ඡා කොළඹදී හා දිස්ත්‍රික් කිහිපයකදී පවත්වා අවසානයේ මැතිවරණය පැවැත්වීමේ මාර්ග සිතියම සකස් කරන ලදි. එමෙන්ම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුව පෙරහුරු ඡන්ද විමසීම් දිස්ත්‍රික් මට්ටමෙන් පවත්වා ඒ පිළිබඳව ඉදිරි මැතිවරණය සඳහා යෝජනා/ අදහස්/ නිරීක්ෂණ ලබාගන්නා ලදි.

7.11 මෙම සියලු කරුණු සලකා එම තත්ත්වය මත පාර්ලිමේන්තු මැතිවරණ ඡන්ද විමසීම පැවැත්වීම 2020.08.05 දින සිදු කරන බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරන ලද අතර, ඒ සඳහා අංක 2179/17 හා 2020.06.10 දිනැති ගැසට් පත්‍රය (ඇමුණුම 25) මගින් නිවේදනය කිරීමට කටයුතු කරන ලදි.

7.12 තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම/තැපැල් ඡන්ද ලේඛන සහතික කිරීමේ කටයුතු අවසන් කර ඇති හෙයින්, තැපැල් ඡන්ද නිකුත් කිරීම/ තැපෑලට භාරදීම 2020 ජූනි 30 හා 2020 ජූලි 01 සහ 02 දින සිදුකරන ලදි.

7.13 තැපැල් ඡන්ද සලකුණු කිරීම 2020 ජූලි 13,14,15 හා 16 දිනවල යොදා ඇති අතර, සලකුණු නොකරන ලද තැපැල් ඡන්ද සඳහා 2020 ජූලි 20 හා 21 යන දින වෙන් කරන ලද අතර, මේ පිළිබඳව සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි/නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් වෙත

උපදෙස් ලබා දෙන ලදි. Covid 19 වසංගතය හේතුවෙන් මැතිවරණ ඡන්ද විමසීම් දින සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රියාවට නැංවීම සඳහා යොදවන ලද මත සෞඛ්‍යය අංශ කාර්යය මණ්ඩලයට තැපැල් ඡන්ද අයිතිය ලබාදීම මෙම මැතිවරණයේදී සිදුවිය.

7.14 පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන කාලසීමාව 2020.08.05 දින පෙ.ව. 7.00 සිට ප.ව. 5.00 දක්වා බව අංක 2184/18 හා 2020.07.15 දිනැති ගැසට් නිවේදනයෙන් (ඇමුණුම 26) දැනුම් දෙන ලදි.

7.15 ඡන්ද ගණන් කිරීම 2020.08.06 දින සිදු කරන බව හා 2020.08.05 සහ 06 දිනවල ඊට අදාලව නියෝජිතයින් පත් කිරීම හා ඔවුන් සහභාගී විය හැකි ආකාරය පැහැදිලි කරමින් අංක 2186/7 හා 2020.07.27 දිනැතිව ගැසට් පත්‍රයක් (ඇමුණුම 27) පළ කරන ලදි.

7.16 එමෙන්ම පසුගිය 2019 ජනාධිපතිවරණයේදී කටයුතු කල ආකාරය අනුව ලබාගත් අත්දැකීම් ද පදනම් කරගෙන 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ද දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල ලැබුණු/ අනුමත කළ නාමයෝජනා සංඛ්‍යාව පරිදි ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් මෙවර ද කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ඡන්ද පොල වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. ඡන්ද ගණන් කිරීමේ කටයුතු ඡන්ද විමසීමේ දිනට පසුදින යොදාගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව කළ තීරණය අනුව ගණන් කිරීමේ ශාලාවල භාවිතා කළ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ආරක්ෂිතව හා පක්ෂ නියෝජිතයන් ඉදිරියේදී මුද්‍රා තැබීමේ කටයුතු සඳහා ප්‍රමාණයෙන් විශාල කාඩ්බෝඩ් ධාරක ද සියළුම ගණන් කිරීමේ ශාලා සඳහා ලබාදීමට ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලබාදීමට කටයුතු කරන ලදි.

7.17 එමෙන්ම, 2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව සිදුකළයුතු ඉදිරි කටයුතු පිළිබඳව උපදෙස්/චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරින් හා නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මෙම මූලික කටයුතුවලට සහායවීම සඳහා මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍යවන ප්‍රමාණයට විශ්‍රාමික නිලධරයන්/අනියම් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදි. එසේම, මැතිවරණය පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍යවන සියලුම ලිපි ලේඛන / ආකෘති ද මුද්‍රණය කිරිමට කටයුතු කරන ලදි. එසේම ඡන්ද විමසීම්, ඡන්ද ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් සම්බන්ධ සියලුම ලිපි ලේඛන/ඡන්ද පත්‍රිකා/කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි/ඡන්ද කුටි මෙන්ම මුඛ ආවරණ,මුහුණු ආවරණ, විෂබීජ නාශක දියර,අත්වැසුම් ඇතුළු Covid – 19 සෞඛ්‍යාරක්ෂිත උපකරණ/බඩු බාහිරාදිය ඒ ඒ අංශය මගින් නියමිත දින වකවානුව තුල සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදීමට කටයුතු කරන ලද අතර, 2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව දිවයිනේ ඡන්ද පොලවල් 12984 ක ඡන්ද විමසීම් 2020.08.05 දින සාර්ථකව පැවැත්වීමට කටයුතු කරන ලදි.ඡන්ද විමසීමෙන් පසු ඡන්ද පෙට්ටි ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය භාරගෙන සුරක්ෂිතව විශාල කාඩ්බෝඩ් පෙට්ටියක් තුළ තැන්පත් කර පසුදින දක්වා සුරක්ෂිතව තබන ලදි. දිවයිනේ සාමාන්‍ය ඡන්ද ගණන් කිරීමේ ශාලා 2367 ක් හා තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා 444 ක් යන ආදි වශයෙන් එකතුව 2811 ක ඡන්ද ගණන් කිරීමේ කටයුතු ද 2020.08.06 දින සාර්ථකව සිදු කරන ලදි. (එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ඡන්ද පොළවල් සංඛ්‍යාව හා ගණන් කිරීමේ ශාලා පිළිබඳ විස්තර **ඇමුණුම 28** හි දැක්වේ.)

7.18 2019 - ඡන්ද හිමි නාමලේඛනය අනුව ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව 16,263,885 ක් වන අතර,එම ලේඛනය පදනම් කරගෙන, 2020.08.05 දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේදී, 12,343,302 (75.89%) මුළු ප්‍රකාශිත ඡන්දය වන බවත්, එම ප්‍රකාශිත ඡන්ද අතරින් 11,598,929(71.32%) වලංගු ඡන්ද වූ අතර, 744,373 (4.58%) ප්‍රතික්ෂේපිත ඡන්ද විය, තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂ/ස්වාධින කණ්ඩායම් අතරින් ඡන්ද 68,53,690 ක් (59.09%) ලබාගත් පිළිගත් දේශපාලන පක්ෂයක් වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය ආසන 145 ක් ලබාගෙන ජයග්‍රහණය කර, 16 වැනි පාර්ලිමේන්තුවේ ආණ්ඩුවක් පිහිටුවා ඇති අතර. ඒ ඒ පක්ෂවලට ලැබුණු ඡන්ද සංඛ්‍යාව හා ආසන සංඛ්‍යාව පිළිබඳ විස්තර **ඇමුණුම 29** ට ඇතුළත්ය. ඊට අදාළ මැතිවරණ කොට්ඨාසවල තොරතුරු , **ඇමුණුම 30** ට ඇතුළත් වේ.

7.19 ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර ලබාගත් පක්ෂ අතුරින් එක්සත් ජාතික පක්ෂය 2020.12.31 දින වන විටත් එම මන්ත්‍රී ධුරය කිසිවෙකු නම් කර නොමැත.

**7.20 මැතිවරණ නිරීක්ෂණ කටයුතු**

වර්ෂ 1980 ගණන්වල සිට මෙරට පැවති මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා, එම මැතිවරණ සඳහා තරඟ කළ පාර්ශවයන්ගේ ද එකඟතාව ඇතිව මැතිවරණ දෙපාර්තමේන්තුව/ මැතිවරණ කොමිෂන් සභාව විදේශීය මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම්වලට ආරාධනා කරන ලද අතර, ඉන් අනතුරුව දේශීය විවිධ රාජ්‍ය නොවන සංවිධාන (Non-Government organizations) හා වෙනත් ප්‍රජාතන්ත්‍රීය සම්ප්‍රදායයන් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව කටයුතු කරන දේශීය සංවිධානද, ඡන්ද විමසීම් අවස්ථාවල දී එම කටයුතු නිරීක්ෂණය සඳහා අවසරය ඇතිව ඉදිරිපත් විය.

**7.20.1 දේශීය නිරීක්ෂණ කණ්ඩායම්**

2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණයේ නිරීක්ෂණය සඳහා අදාළ අවසරය ඉල්ලා සිටි පහත දැක්වෙන සංවිධානවලට, එම සංවිධානවල මෑත ක්‍රියාකාරකම් හා අදාළ ක්ෂේත්‍රයේ ලබා තිබූ අත්දැකීම් සැලකිල්ලට ගෙන පහත ආකාරයට නිරීක්ෂණ කටයුතු සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන ලදි.

(අ)

I. නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය
People's Action for Free and Fair Elections (PAFFREL)

II. මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
Centre for Monitoring Election Violence (CMEV)

ඉහත සඳහන් නිරීක්ෂණ සංවිධාන දෙක සඳහා තැපැල් ඡන්ද කටයුතු නිරීක්ෂණයට, ඡන්ද පොළවල කටයුතු ජංගම නිරීක්ෂකයන් මාර්ගයෙන් නිරීක්ෂණයට, ඡන්ද පොල ස්ථිතික නිරීක්ෂකයන් යෙදවීමට, ඡන්ද ගණන් කිරීමේ ශාලා නිරීක්ෂණයට සහ එම ආයතන දෙකේ විධායක අධ්‍යක්ෂවරුන්ට ඡන්ද මධ්‍යස්ථානවලට ඇතුළු වී නිරීක්ෂණය කිරීමට හා ඡන්ද ගණන් කිරීමේ ශාලා පිහිටි පරිශ්‍රයන්ට සහ ගණන් කිරීමේ ශාලාවලට ඇතුළු වී නිරීක්ෂණ කටයුතු කිරීමට අවසර ලබා දෙන ලදි.

(ආ)

I. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකා
Transparency International Sri Lanka (TISL)

II. ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය
National Polls Observation Centre (NPOC)

III. ලක්බිමේ මව්වරු හා දියණියෝ සංවිධානය
Mothers and Daughters of Lanka (MDL)

IV. නිදහස් සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය
Campaign for Free and Fair Election (CaFFE)

මෙම නිරීක්ෂණ සංවිධාන සිය නිරීක්ෂණ කටයුතු සඳහා අවසරය ඉල්ලා තිබූ දිස්ත්‍රික්කවල පිහිටි ඡන්ද මධ්‍යස්ථානවල ඡන්ද විමසීමේ කටයුතු ජංගම නිරීක්ෂකයන් යොදවා පමණක් නිරීක්ෂණය සිදු කිරීමට අවසර දෙන ලදි.

මැතිවරණ විමසුම සඳහා ස්වේච්ඡා මුලපිරුම
Volunteer Initiatives for Election Watch

මෙම නිරීක්ෂණ සංවිධානය ද මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහා අවසර ඉල්ලා තිබූ අතර මෙම සංවිධානය සඳහා ඡන්ද මධ්‍යස්ථාන පරිශ්‍රයේ පිවිසුම දක්වා පමණක් නිරීක්ෂණයට අවසර ලබාදෙන ලදි.

### 7.20.2 විදේශීය නිරීක්ෂණ කණ්ඩායම්

2020.08.05 දින පවත්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණය නිරීක්ෂණය කිරීමට යුරෝපානු සංගමයට (EU) සහ පොදුරාජ්‍ය මණ්ඩලයේ රටවල්වල (Commonwealth) විදේශීය මැතිවරණ නිරීක්ෂකයන් හට දිවයිනට පැමිණෙන ලෙස ආරාධනා කරන ලදි.

එම කාලය තුළ COVID 19 වසංගත තත්වය ශ්‍රී ලංකාවට ද බලපා තිබූ අතර, ඉහත සංවිධානවල මැතිවරණ නිරීක්ෂකයන් එම තත්වය හමුවේ වුවද දිවයිනට පැමිණීමට කැමැත්ත පළකර තිබූ අතර, මෙරට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ උපදෙස් මාලාව පිළිපදිමින් ඔවුන් දිවයිනට පැමිණීමට නියමිත විය.

එසේ වුවද, Covid 19 තත්වය දිවයින පුරා පැතිරයාමේ තර්ජනය සහ ගුවන්තොටුපල වසා දැමීම්, විදේශීය නිරීක්ෂකයන් හට නවාතැන් පහසුකම් සැලසීම සඳහා හෝටල් පහසුකම් ලබාදීම යන අභියෝග රැසක් ඇතිවීම හේතුවෙන් විදේශීය නිරීක්ෂකයන් දිවයිනට ගෙන්වා ගැනීම බරපතල ගැටළුවක් වූයෙන් මෙවර පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දේශීය නිරීක්ෂණ සංවිධාන සඳහා පමණක් අවසර ලබාදීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

### 7.21 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන ප්‍රකාරව වෙනත් ඡන්ද පොළක දී ඡන්ද දීමේ පහසුකම් සැපයීම.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ(1) වගන්තිය ප්‍රකාරව තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොට ගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකුට තමාගේ ඡන්දය මැතිවරණ කොමිෂන් සභාව තම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකිය.

ඒ අනුව, එවැනි ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් සතියක් ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව විසින් එම ඉල්ලුම් පත්‍රය භාරගත් හෝ ප්‍රතික්ෂේප කරන බවට අදාළ ඡන්ද හිමියා වෙත දැනුම් දිය යුතුය.

ඒ අනුව, මෙම ඡන්ද හිමියන්ගේ ඡන්දය භාවිතා කිරීම සඳහා ඉල්ලුම්පතක් ඉදිරිපත් කර ඇති ලිපිනයට ආසන්න විශේෂ ඡන්ද පොළ සකස් කර අදාළ ඡන්ද දායකයා හට තම ඡන්දය භාවිතා කිරීම සඳහා පහසුකම් සැපයීම සිදු කරයි. මෙම ඡන්ද ගණන් කිරීම අදාළ විශේෂ ඡන්ද පොළ පිහිටා ඇති දිස්ත්‍රික්කයේ විශේෂ ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී ගණන් කර එය අදාළ ඡන්ද හිමියාගේ නම ඡන්ද හිමි

නාමලේඛනයේ ලියාපදිංචි කර ඇති මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද ප්‍රතිඵලය වෙත එකතු කිරීම සිදු කරනු ලැබීය.

2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව අංක 2165/18 හා 2020.03.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය (ඇමුණුම 31) පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ ඡන්ද විමසීම් පහත ප්‍රකාරව, සාධාරණ බියක් පැවතීම හේතුවෙන් තමාගේ ඡන්ද පොළන් පිටත ඡන්දය භාවිතා කිරීම සඳහා අයදුම්පත් ලබා ගත හැකි ස්ථාන හා අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2020.03.10 දින බවත් ප්‍රසිද්ධ කර ඇත. ඒ අනුව පහත පරිදි අයදුම්පත්‍ර ලැබී ඇත.

| මැතිවරණ කොට්ඨාසය | ඡන්ද ප්‍රදේශය | ලැබුණු අයදුම්පත් ගණන | පිළිගත් අයදුම්පත් ගණන |
|---|---|---|---|
| වන්නි | මන්නාරම | 6045 | 5807 |
| | මුලතිව් | 490 | 463 |
| | වවුනියාව | 6 | 5 |
| යාපනය | කිළිනොච්චි | 4 | 3 |

ඒ අනුව මෙම පිළිගත් අයදුම්කරුවන් 6278 දෙනෙකු සඳහා ඡන්ද පොළ පුත්තලම දිස්ත්‍රික්කය තුළ පිහිටුවන ලදි. (ඇමුණුම 32)

### 7.22 නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

2020 අගෝස්තු මස 05 වන දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ දී නිවේදිත ඡන්ද කාර්යාල යන්න සැලකීමේදී නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරිට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දීම වන අතර ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ.මෙහිදී පළාත් පාලන ඡන්ද විමසීම් අංශය ප්‍රධාන වශයෙන් සිදුකලයුතු වූයේ නිවේදිත ඡන්ද කාර්යාල වර්ග, ඒ ඒ නිවේදිත ඡන්ද කාර්යාල වලට අදාල නෛතික තත්වය පහදා දීමත්, නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීමට අදාල උපදෙස් හා ඉල්ලුම් පත්‍ර සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීධුර අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිත හා බලයලත් නියෝජිතයන් වෙත ලබා දීම වැනි කරුණුය. මේ සම්බන්ධයෙන් සියලුම උපදෙස් අඩංගු ලිපියක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීධුර අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිත හා බලයලත් නියෝජිතයන් වෙත නිකුත් කරන ලද අතර එහි පිටපත් දැනගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා පහත සඳහන් තනතුරුධාරින්ට ද යොමුකරන ලදි.

1. පොලිස්පති
2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (මැතිවරණ)
3. සියලුම තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඡන්ද විමසීම් නීති උල්ලංඝනය වීම් පිළිබඳව විමර්ශනය කිරීමේ නිලධාරින්
4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්

5. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන්
6. නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන්
7. මැතිවරණ මහලේකම් කාර්යාලයේ පැමිණිලි විමර්ශන කමිටු ප්‍රධානි

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තිය යටතේ පවත්වාගෙන යා හැකි ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් වූ විධි විධාන අනුව පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල පිහිටුවීමට බලය ඇති අය, කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය, කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය, පිහිටුවිය හැකි කාර්යාල ගණන ඇතුළත් ලේඛනයක් සකස් කර බෙදාහරින ලදි. එක් එක් කාර්යාල වර්ගය පිහිටුවීමට අවසර ලබා ගැනීමට අවශ්‍ය අයදුම් පත්‍ර හඳුනාගැනීමේ පහසුව තකා වර්ණ සහිත කඩදාසි වල මුද්‍රණය කරනු ලැබිණි. එමගින් කාර්යාලයට අදාල නිවැරදි ඉල්ලුම් පත්‍රය නොපිරවීම නිසා ඇතිවන දෝෂය අවම කරගත හැකි වූ අතර අනෙක් අතට කාර්යාල වර්ගීකරණය අනුව සංඛ්‍යාත්මක අගයන් විමසීමේ දී එය කාර්යක්ෂමව සිදුකිරීමට මෙලෙස වෙනස් වර්ණයන්ගෙන් යුතු කඩදාසි වල මුද්‍රණය කිරීමට හේතු විය. ඒ අනුව නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලය සඳහා අයදුම්පත් කහ පැහැති කඩදාසියේද, නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල සඳහා සුදු පැහැති කඩදාසියේද, අපේක්ෂකයින් සඳහා මැතිවරණ කොට්ඨාසය සඳහාම නිහඬ කාල සීමාවේදී ස්ථාපනය කෙරෙන ශාඛා මැතිවරණ කාර්යාල සඳහා ලා රෝස පැහැ කඩදාසියේද, අපේක්ෂකයන් පදිංචි නිවසේ ප්‍රචාරණ කාර්යාලයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ලා දම් පැහැයෙන් ද වූ වර්ණයන්ගෙන් යුත් කඩදාසියේද අයදුම්පත් මුද්‍රණය කරන ලදි.

මීට අමතරව එම ලිපියේ කරුණු පැහැදිලි කිරීම යටතේ **මැතිවරණ කොට්ඨාස, ඡන්ද ප්‍රදේශ හා ඡන්ද කොට්ඨාස යන භූමි ප්‍රදේශ සහ ඡන්ද නියෝජිත, බලයලත් නියෝජිත හා ප්‍රාදේශීය නියෝජිත** යන තනතුරු මොනවාද යන්න පිළිබඳව පැහැදිලිව විස්තර කිරීමක් සිදු කරන ලද අතර එමගින් මැතිවරණ කටයුතුවලට අදාලව යෙදෙන මෙම වචන භාවිතයන් නුහුරු නිසා සිදුවන දෝෂ අවම කර ගැනීමට හැකිවිණි.

තව ද මෙම උපදෙස් ලිපිය හරහා නිවේදිත කාර්යාලවල ප්‍රචාරක පුවරු, ධජ, අපේක්ෂකයාගේ ඡායාරූපය වැනි දෑ ප්‍රදර්ශනය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳ දැනුම් දෙනු ලැබූ අතර මෙමගින් මැතිවරණ සමයකදී බහුලව සිදුකෙරෙන මැතිවරණ නීති උල්ලංගණයක් වන නීති විරෝධී ප්‍රචාරක කටයුතු පිළිබඳ පැමිණිලි නිවේදිත කාර්යාල සම්බන්ධයෙන් අවම කර ගැනීමට බලාපොරොත්තු විණි. තව ද බලයේ සිටින කණ්ඩායම විසින් රජයට අයත් භූමි ප්‍රදේශ, ආයතන වැනි පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක කටයුතු වලට අයුතුව යොදාගැනීම වැලක්වීම සඳහා රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පෙර කී කිසිදු කාර්යාලයක් සථාපිත කල නොහැකි බව දන්වන ලද අතර රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් ප්‍රචාරක කාර්යාලයක ලෙස භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව ද,නිවේදිත කාර්යාලයකට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදිය ප්‍රචාරණ කටයුතු සඳහා යොදාගැනීම පිළිබඳව, යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ප්‍රචාරක කටයුතු කිරීම වැනි නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් මෙමගින් පැහැදිලි කල අතර නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නෛතික ක්‍රියා මාර්ග ගන්නා බවට ද අදාල පාර්ශව දැනුවත් කෙරුණි.

ඍජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනයක් ආසන්නයේ නිවේදිත ඡන්ද කාර්යාලයක් පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු නියමිත දුර ප්‍රමාණයන් සඳහන් කිරීමෙන් එක් පක්ෂයකට කණ්ඩායමකට වාසි සහගත තත්වයක් ඇතිවීම හැකිතාක් අවම කිරීමටත්, රජයේ පාසල්, රෝහල්,

අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබාගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරත වන දරුවන්ට බාධා වන සේ රජයේ පාසල් ආසන්නයේම ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැලකී සිටින ලෙස ස්වකීය ප්‍රාදේශීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුවත් කරන ලෙස සියලුම අපේක්ෂකයන්ගෙන්/ ඡන්ද නියෝජිතයන්/ බලයලත් නියෝජිතයන්ගෙන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටීම මඟින් පොදු මහජනතාවට සිදුවන බාධා අවහිරතා අවම කරගැනීමටත් බලාපොරොත්තු වූ අතර මෙම නීති හා ඉල්ලීම් පැනවීමේ ඒකායන අරමුණ වූයේ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් යන අවධාරිත මූලික කරුණ ආරක්ෂා කර ගැනීමය.

සෑම අවසරලත් කාර්යාලයකම අවම වශයෙන් තිබිය යුතු ඝන අඩි ප්‍රමාණය සඳහන් කිරීමෙන් කුඩා තාවකාලික ටකරන් මඩු නැතහොත් එවැනි කුඩා පොල්අතු පැල්පත් හෝ අත්හැර දමා ඇති ගොඩනැගිලි නිවේදිත කාර්යාලයක් ලෙස සාවද්‍ය ලෙස පෙන්වා නීතිය හැල්ලු කිරීම යම් තාක් දුරට පාලනය කිරීමට හැකි වූ අතර මෙම කාර්යාල වලදී කිසිම විටක ශබ්ද විකාශන යන්ත්‍ර හෝ කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රතිඋත්පාදනය කරන මෙගා ෆෝන් වැනි යන්ත්‍ර හෝ භාවිතා කිරීම තහනම් කිරීම පැය 0600 සිට පැය 2200 දක්වා වූ කාලසීමාවෙන් බැහැරව ඡන්ද කාර්යාල විවෘතව තැබීම වැළක්වීම ඡන්ද කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ වාහන නවතා තැබීම,ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්වීම යන කරුණු වලින් වැලකිය යුතු බවට දැනුම් දීම හරහා මහජනතාවට කිසිදු ආකාරයක අපහසුතාවක් ඇතිවීම අවම කරගැනීමට උත්සහ දැරූ අතර මෙම නියම කිරීම් හේතුවෙන් පූර්ව ඡන්ද විමසීම්වලදී කලක් තිස්සේම ඡන්ද කාර්යාල ලෙස පවත්වනු ලබන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇතිවේනම් ඒ සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කර මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාවක් ලබාදීම මඟින් අපේක්ෂක පාර්ශවයන්ට අගතියක් සිදුවීම වැලක්වීමටද පියවර ගන්නා ලදි.

මීට අමතරව ආගමික සිද්ධස්ථාන සතු ඉඩම්වල හෝ ආගමික ස්ථාන සතු ගොඩනැගිලිවල ඡන්ද කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා ගතයුතු ක්‍රියා මාර්ගද මෙමඟින් දැනුම්වත් කල අතර 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 79 (2) උප වගන්තියේ සඳහන් අයුතු බලපෑම් සම්බන්ධයෙන් වූ නියම වලට අනුකූල ක්‍රියා සිදුවිය හැකි ස්ථානවලදී ඡන්ද කාර්යාල පිහිටුවීමට හෝ ඡන්ද කාර්යාලයක් ලෙස පවත්වාගෙනයෑමට අවසරය ඉල්ලීමෙන් වැලකී සිටින ලෙස ද දන්වා සිටීම මඟින් කාර්යාල ස්ථාපිත කිරීමේදී ඇතිවිය හැකි ගැටළු සහගත අවස්ථා වලක්වා ගැනීමට බලාපොරොත්තු විය.

නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම් දීම සඳහා ඉහත සඳහන්කල වර්ණයන්ගෙන් යුතු ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් හතරකින් (4) සම්පූර්ණ කර තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වූ අතර, ඉන් එක් පිටපතක් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවණ කාර්යාලය විසින් රඳවා ගෙන ඉතිරි පිටපත් තුන (3) අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු වූ අතර පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් තුන මඟින් කාර්යාලය පිහිටුවීමට අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන ඉතිරි පිටපතක් දෙක ඉල්ලුම්කරු වෙත ලබා දිය යුතු අතර ඉන් එක් පිටපතක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට භාරදිය යුතුය. ඉතිරි පිටපත (එසේ ලබා දෙනු ලබන අවසරය ඇතුළත් ආකෘතිය) සෑමවිටම කාර්යාලය පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ කාර්යාලයේ නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි අයුරින් තබා ගත යුතු විය.

ඉහත සඳහන් කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම සඳහාය.

නිවේදිත ශාඛා කාර්යාල පිහිටුවීමෙන් පසුව විවිධ ප්‍රදේශ වලින් කාර්යාල සම්බන්ධව විවිධ ගැටළු පිළිබඳ පැමිණිලි ලද අතර ඒ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව හරහා නිවැරදි උපදෙස් ලබාදීමට පළාත් පාලන ඡන්ද විමසීම් අංශය ක්‍රියා කරනු ලැබිණි.

## 7.23 ආරක්ෂක කටයුතු

ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල ප්‍රකාශ කොට, සතියක කාලයක් ගතවන තෙක්ම ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත පොලිස්පතිවරයා වෙත පැවරේ. ඒ අනුව, මැතිවරණ කොමිෂන් සභාව, තේරීම්භාර නිලධාරීන් මෙන්ම, තරඟ කරනු ලබන දේශපාලන පක්ෂ නායකයන් හා අපේක්ෂකයන්ද, මැතිවරණ නීතිය බලාත්මක කිරීමට අදාළ රාජකාරී පොලිස් නිලධරයන් විසින් ඉටුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමත් සමඟම, මැතිවරණ මහලේකම් කාර්යාලයේ මෙන්ම, දිස්ත්‍රික් මට්ටමින්ද,පැමිණිලි විමර්ශන ඒකක පිහිටුවීම සිදුවේ, මීට අමතරව දිස්ත්‍රික්කයේ විශාලත්වය සහ විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතුව ඇතැයි තීරණය කරනු ලබන ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ වෙනත් රාජ්‍ය ආයතනවල විශේෂ සම්බන්ධීකරණ ඒකකද පිහිටුවීමට පියවර ගන්නා ලදි.

එමෙන්ම, ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධරයන් යොදාගන්නා ලද අතර, පොලිස් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මට්ටමේ සියලුම නිවේදිත නිලධරයන් සහ පොලිස් ස්ථානාධිපතිවරුන් සඳහා ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම පිළිබඳ පවත්වන ලද උපදෙස් පන්ති, සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් පැවති අතර, ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් ද, දේශකයන් ලෙස සම්පත් දායකත්වය ලබාදෙන ලදි.

# 8. පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම

1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වගන්තිය යටතේ වූ පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම, 2020 පළමුවන කාර්තුවේදි සිදුවිය. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ එක්සත් ජාතික පක්ෂයෙන් නම් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ (ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයෙකු වූ) ජයම්පති වික්‍රමරත්න මහතා 2020 ජනවාරි මස 21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි තම පාර්ලිමේන්තු අසුනෙන් ඉල්ලා අස්වූ බවට , පාර්ලිමේන්තු මහ ලේකම්ගේ 2020 ජනවාරි 21 වෙනි දිනැති ලිපිය මගින් මැතිවරණ කොමිෂන් සභාවට දන්වා ඇත. ඒ අනුව, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් වෙත එම පුරප්පාඩුව පිරවීම පිණිස සුදුසු නාමයෝජනාවක් ලබා දෙන ලෙසට දන්වන ලදි, ඒ අනුව එම පක්ෂයෙන් වැලිගොඩගේ සමන් රත්නප්‍රිය සිල්වා මහතාගේ නම යෝජනා කර මැතිවරණ කොමිෂන් සභාවට වාර්තාව ඉදිරිපත් කොට තිබූ හෙයින්, (ඇමුණුම 33) එකී පනතේ 64(5) වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාවට පැවැරි ඇති බලතල ක්‍රියාත්මක කරමින් අටවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස වැලිගොඩගේ සමන් රත්නප්‍රිය සිල්වා මහතා තෝරාපත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් කටයුතු කොට ඇති අතර එය 2020.01.27 දිනැති අංක 2160/10 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මඟින් (ඇමුණුම 34) ප්‍රකාශයට පත්කර ඇත.

**9. පළාත් සභා ඡන්ද විමසීම**

1988 අංක 02 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කරමින් 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් සංශෝධන පනත ව්‍යවස්ථාදායකය විසින් සම්මත කිරීමෙන් පසුව, එකී සංශෝධන පනත, ප්‍රකාරව පළාත් සීමා නිර්ණය සඳහා, සීමා නිර්ණය කමිටුවක් පත් කළ අතර, එම කමිටුව විසින් අදාළ සීමා නිර්ණය කොමිෂන් සභා වාර්තාව 2018 පෙබරවාරි මස, භාර දෙන ලද නමුත්, එම වාර්තාව පාර්ලිමේන්තුව සම්මත නොකිරීම හේතුවෙන් 2019.10.08 දින වන විට, ක්‍රියාත්මකව පැවති අවසන් පළාත් සභාවේ එනම් ඌව පළාත් සභාවේ ද නිල කාලය අවසන් වූව ද, මේ දක්වා පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීමට කටයුතු යොදා නොමැත. මැතිවරණ කොමිෂන් සභාව විසින් ද වරින් වර, මේ පිළිබඳව අතිගරු ජනාධිපතිවරයා, ගරු අග්‍රාමාත්‍යවරයා, අමාත්‍ය මණ්ඩලය හා පාර්ලිමේන්තුවේ නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ නායකයන්ගේ අවධානය යොමු කරන ලද අතර, පළාත් සභා ඡන්ද විමසීම නියමිත කාලවකවානුවේ නොපැවැත්වීම සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව ද, ජනතාවගේ දෝෂ දර්ශනයට ලක්ව ඇත. කෙසේ වෙතත් පළාත් සභා ඡන්ද විමසීම නොපවත්වා, මහජන නියෝජිතයන් වෙනුවට නිලධාරීන් මඟින් පළාත් සභා ක්‍රමය පවත්වාගෙන යාම පිළිබඳව කොමිෂන් සභාවේ විරෝධතාව හා අප්‍රසාදය අදාළ බලධාරී ආයතන වෙත යොමු කරනු ලැබ ඇත.

**10. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 දරන අධිකාරය) - පුරප්පාඩු පිරවීම.**

2020 වර්ෂය තුළ පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර ඇත. ඒ පිළිබඳ තොරතුරු **ඇමුණුම 35** හි ඇතුළත් කර ඇත.

**11. විශේෂ ව්‍යාපෘති**

මැතිවරණ කොමිෂන් සභාව විසින් පවත්වන ලද විශේෂ ව්‍යාපෘති බොහොමයක් සඳහා IFES (මැතිවරණ කටයුතු පිළිබඳ ජාත්‍යන්තර ආයතනය) විසින් තාක්ෂණික සහයෝගය ලබා දෙන ලද අතර, 1987 දී ආරම්භකර රටවල් 140 කට වැඩි ප්‍රමාණයකට මේ වන විට, මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව තාක්ෂණික සහයෝගීතාව ලබාදෙන මෙම ආයතනය, 2005 වර්ෂයේ සිට, එවකට පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා ද, 2015 වර්ෂයේ දී මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසුව ද, සියළුදෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට ක්‍රියාකර ඇත.

**11.1 ආබාධිත**

ආබාධ සහිත තැනැත්තන් අන්තර්කරණය වු මැතිවරණ ක්‍රියාවලියක් සඳහා සිදුකරනු ලැබූ ක්‍රියාකාරකම්:

මාතලේ දිස්ත්‍රික්කයේ ආබාධ සහිත තැනැත්තනගේ ඡන්දය භාවිත කිරීමේදී මුහුණපාන පොදු ගැටළු විසඳීමේ අරමුණින් දිස්ත්‍රික් මට්ටමින් ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන නියෝජිතයින් හා මාතලේ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් සමග සාකච්ඡාවක් 2020 පෙබරවාරි 19 වන දින සිදු කරන ලදි. මාතලේ දිස්ත්‍රික්කයේ ආබාධ සහිත පුද්ගලයින් ඡන්දය සළකුණු කිරීමේදි මුහුණදෙන ගැටළු සහ ඉදිරියේදි ඒ සඳහා තිරසාර විසඳුම් ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම පිළිබදව එහි දී සාකච්ඡා කරන ලදි.

ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාවට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමේ කමිටුවේ (DIESL- TWG) නිලවරණය සහ දිස්ත්‍රික් මට්ටමින් කමිටුව ස්ථාපනය කිරීම 2020/02/27 වන දින පැවැත්වන ලදි. ජාතික මට්ටමේ තාක්ෂණික කමිටුව සඳහා එනෙබල් ලංකා පදනම කැඳවුම්කාරීත්වයෙන් යුතු සංවිධාන හතකින් සමන්විත කමිටුවක් තෝරාපත් කරන්නා ලදි. තවද කිළිනොච්චිය, මඩකලපුව, අනුරාධපුර, මාතලේ, කුරුණෑගල, පුත්තලම,

මහනුවර, කොළඹ, ගම්පහ, රත්නපුර, පොලොන්නරුව, මොනරාගල, නුවරඑළිය, හම්බන්තොට, මාතර, ගාල්ල සහ කළුතර යන දිස්ත්‍රික්කයන් හි දිස්ත්‍රික් කමිටු නායකයින් තෝරාපත් කරන්නා ලදි. ඒ සඳහා මූල්‍ය දායකත්වය IFES ආයතනය විසින් ලබාදෙන ලදි.

2020- 2021 වර්ෂ තුළ ආබාධ සහිත ඡන්දදායකයින්ගේ ඡන්ද අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ යුතු සැළසුම සකස් කිරීම පිළිබඳ මූලික සාකච්ඡාවක් 2020 මාර්තු මස 10 වන දින IFES ආයතනයේ දී පැවැත්විණ. එය ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් ශ්‍රී ලංකා මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ තාක්ෂණික ක්‍රියාකාරි කමිටු (DIESL- TWG) සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් සිදු කරන ලදි. එහිදි 2020 සහ 2021 වර්ෂයන් තුළ පැවැත්වෙන මැතිවරණ සඳහා ආබාධ සහිත තැනැත්තන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්විම සහ ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රවේශ පහසුකම් සකස් කිරීම සඳහා තිරසාර ක්‍රමෝපායික සැළසුමක අවශ්‍යතාව පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරන ලදි.

2020 පාර්ලිමේන්තු මැතිවරණය පාලිත කොරෝනා තත්ත්වය තුළ පැවැත්වීමට තීරණය කිරීමත් සමඟ ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් කිරීම සඳහා අවධානය යොමු කළ යුතු සුවිශේෂි කරුණු පිළිබද මැතිවරණ කොමිෂන් සභාවට යෝජනා ලබාදිමේ අරමුණින් 2020/06/03 වන දින ZOOM තාක්ෂණය ඔස්සේ ආබාධ සහිත තැනැත්තන් ඇතුළත් ශ්‍රී ලංකා මැතිවරණ ක්‍රියාවලියක් සඳහා වූ තාක්ෂණික ක්‍රියාකාරි කමිටු (DIESL- TWG) සාමාජිකයන් සමග සාකච්ඡාවක් පැවැත්විය. එහිදි ඔවුන්ගෙන් ලබාගත් යෝජනා හා අදහස් මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය පිණිස යොමු කරන ලදි. ඒ අනුව 2020 පාර්ලිමෙන්තු මැතිවරණයේ දී පාලිත තත්ත්වයන් තුළ ආබාධ සහිත ඡන්ද දායකයින්ට සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් සහිතව සිය ඡන්දය සළකුණු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙලක් ඡන්ද මධ්‍යස්ථාන තුළ ස්ථාපිත කරලීමට හැකි විය.

2020 පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව ඡන්දය සළකුණු කිරීමේදි අනුගමනය කළ යුතු නිසි සෞඛ්‍ය ක්‍රමවේදයන් හා එය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුව පැවැත්වෙන ආකාරය පිළිබඳ ඌව, මධ්‍යම සහ දකුණු පළාත් තුළ ජීවත්වන ආබාධ සහිත ඡන්දදායකින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදි. 2020 ජුලි මස 24 වන දින සිට 30 වන දින දක්වා බුත්තල, වැල්ලවාය, බිබිල, තණමල්විල, මහනුවර, මාතලේ, තංගල්ල සහ මාතර යන ස්ථානයන්වල දී නිසි සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්විය. එහිදි අත්පත්‍රිකා සහ මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව සකස් කරන ලද වීඩියෝපට දැනුම්වත් කිරීමේ මෙවලම් ලෙස භාවිතා කරන ලදි. ආබාධ සහිත ඡන්ද දායකයින් 250කට ආසන්න සංඛ්‍යාවක් දැනුම්වත් කළ අතර ඔවුන් මඟින් ග්‍රාමීය මට්ටමේ ප්‍රජාව දැනුම්වත් කිරීමට කටයුතු කරන ලදි. මෙම වැඩසටහන් සංවිධානය කිරීම ඒ ඒ ප්‍රදේශවල ආබාධ සහිත පුද්ගල සංවිධාන සහ ශ්‍රී ලංකා මැතිවරණය ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරී කමිටු දිස්ත්‍රික් නායකයින්ගේ දායකත්වයත්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල සම්පත්දායක්වය සහ IFES ආයතනයේ මූල්‍ය අනුග්‍රහකත්වයත් සහිතව සිදු කරන ලදි.

දෘශ්‍යාබාධ සහිත පුද්ගලයින් සිය ඡන්දය සළකුණු කිරීමේදී වෙනත් අයකු විසින් සළකුණු කිරීම නිසා දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ගේ ඡන්දය සළකුණු කිරීමට අදාළ රහස්‍යභාවය ආරක්ෂා නොවීම ප්‍රධාන ගැටලුවක් වේ. එයට පිළියමක් ලෙස, 2020 පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව දෘශ්‍යාබාධ සහිත ඡන්ද දායකයින් හා වැඩිහිටි පුරවැසියන්ගේ පහසුව සඳහා ඡන්ද පත්‍රිකාව බහාලීම සඳහා ස්ටෙන්සිල් හදුන්වා දිමේ නියමු ව්‍යාපෘතිය නුවරඑළිය දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන සිදු කරන ලදි. එහි දී ස්ටෙන්සිල් උපකරණය හදුන්වාදිම සහ පෙර පුහුණු වැඩසටහන 2020/08/03 වන දින නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාර ශාලාවේ දි පැවැත් වූ අතර එම අවස්ථාවට පූර්ණ දෘශ්‍යාබාධ සහිත, අර්ධ දෘශ්‍යාබාධ සහිත සහ වැඩිහිටි ඡන්දදායකයින් සහභාගි වූ අතර ඔවුන්ට මෙම ක්‍රමය හඳුන්වාදි පෙර පුහුණුව ලබා දෙන ලදි. එදින ලබා දුන් පුහුණුවත් සමග 2020/08/05 වන දින පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණයේ දි එම පුහුණුව සඳහා සහභාගී වූ දෘශ්‍යාබාධ සහිත ඡන්ද දායකයන් සහ වැඩිහිටි

ඡන්දදායකයින් ඡන්දය සළකුණු කරන ඡන්ද මධ්‍යස්ථාන වලදී එම ඡන්ද පත්‍රිකාව ස්ටෙන්සිල් ලබාදීමට කටයුතු කරන ලදි. එදින ලද අත්දැකීම් හා එම ස්ටෙන්සිල් ප්‍රායෝගික භාවිතය පිළිබඳ අදහස් ලබාගැනීමේ පසුවිපරම් කිරීමේ වැඩසටහනක් 2020/08/23 වන දින නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. ඒ අනුව මෙවර ඡන්දය සළකුණු කිරීමේදි කිසිදු බාධාවකින් තොරව රහස්‍යභාවය සුරක්ෂිත වන පරිදි වලංගු ඡන්දයක් තමන්ට සළකුණු කිරීමට හැකි වූ බව ඔවුන් ප්‍රකාශ කරන ලදි.

## 11.2 අන්තර්ජාතික දින සැමරුම්

### 11.2.1 නිර්ප්‍රචණ්ඩත්වය හා සාමය සඳහා වූ පාසල් දිනය සැමරීම (ජනවාරි 30)

නිර්ප්‍රචණ්ඩත්වය හා සාමය සඳහා වූ පාසල් දිනය සැමරීම්වස් කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් 2020.02.06 දින මතුගම ශාන්ත මේරි විද්‍යාලයේදී පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදි.

### 11.2.2 ලෝක සමාජ සාධාරණත්ව දිනය (පෙබරවාරි 20)

ජාතීන් අතර සාමකාමී හා සමෘද්ධිමත් සහජීවනය ඇති කිරීම සඳහා පවත්නා මූලධර්මයකි. සමාජ සාධාරණත්ව මූලධර්මය අනුගමනය කිරීම මගින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය මෙන්ම ආදිවාසීන්ගේ අයිතිවාසිකම් සහ සංක්‍රමණිකයන්ගේ අයිතිවාසිකම් ද සුරකේ. ස්ත්‍රී පුරුෂභාවය, වයස, ජාතිය, වාර්ගිකත්වය, ආගම, සංස්කෘතිය හෝ ආබාධිතභාවය හේතුවෙන් මිනිසුන් මුහුණ දෙන බාධක ඉවත් කිරීම මගින් සමාජ සාධාරණත්වය වඩාත් තහවුරු වේ. මෙහි ප්‍රධාන අරමුණ වන්නේ සමාජ ආරක්ෂණය, සමාජ කතිකාව සහ රැකියා කිරීමේ මූලික අයිතිවාසිකම් සඳහා සියල්ලන්ටම සාධාරණ අවස්ථා ලබා දීම වේ.

පෙබරවාරි මස 20 වැනි දිනට යෙදී ඇති ලෝක සමාජ සාධාරණත්ව දිනය සැමසීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් 2020.02.20 දින ගිරිබාව, වන්නිකුඩාවැව සිරිසඟබෝ විද්‍යාලයේ දි වැඩසටහනක් පවත්වන ලද අතර, නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් ගල්ලැල්ල බෝධිරුක්ඛාරාමයේදී ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2020.02.23 දින පවත්වන ලදි.

### 11.2.3 අන්තර්ජාතික මව්භාෂා දිනය (පෙබරවාරි 21)

භාෂාමය හා සංස්කෘතික විවිධත්වය සහ බහු භාෂා භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා පෙබරවාරි මස 21 ජාත්‍යන්තර මව්භාෂා දිනය ලෙස 2000 වර්ෂයේ සිට සෑම වසරකම සමරනු ලැබේ. මව්භාෂාව තමන්ට උපතින් හිමි වන භාෂාව එසේත් නැතිනම් උපතේ සිට තීරණාත්මක කාලයක් තුළ මුලින්ම ඉගෙනගන්නා භාෂාව වශයෙන් සරලව අර්ථ ගන්වා ඇත.

පෙබරවාරි මස 21 දිනට යෙදී ඇති අන්තර්ජාතික මව්භාෂා දිනය සැමරීම සඳහා කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් මතුගම, ගල්ලෙනකන්ද ප්‍රාථමික විදුහලට පුස්තකාලයක් සකස් කර පොත් ප්‍රදානය කිරීමේ වැඩසටහනක් 2020.02.25 දින පවත්වන ලදි.

### 11.2.4 මහජන සේවා දිනය (ජුනි 23)

මහජන සේවා දිනය පදනම් කරගනිමින් මහජනතාව සමග සුහදව, කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම වැඩිදියුණු කරගැනීමට අවශ්‍ය දැනුම වර්ධනය කර ගැනීම පිණිස මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් සඳහා 2020.09.25 දින පුහුණු වැඩසටහනක් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි.

### 11.2.5 ජාත්‍යාන්තර ළමා දිනය (ඔක්තෝම්බර් 01)

දීර්ඝ ළමාවියක් සහිත මිනිස් දරුවා ඒ දිගු ළමාවිය පුරා රැස්කරගනුයේ අනාගත විශ්වයෙහි ප්‍රභාවයි. කුතුහලයෙන් ඇවිළුණු දෑසින් ද විශ්මයෙන් අයාගත් මුවින් ද යුතුව විශ්වයේ අරුමැසි රටා වියමින් වටහාගන්නා දරුවන්ට නිදහසේ දැනුම රැස්කර ගැනීමටත් පරිකල්පනයටත් ආශ්වාදයටත් ඉඩකඩ සකසාදීම වැඩිහිටි අපගේ වගකීමයි.

එම තේමාව යටතේ ලෝක ළමාදිනය සැමරීම් වස් කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් මතුගම ගල්ලෙනිකන්ද ප්‍රාථමික විද්‍යාලයේ දී පොත් බෙදාදීමේ වැඩසටහනක් 2020.10.06 දින පවත්වන ලදි.

### 11.2.6 ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී දිනය (සැප්තැම්බර් 15)

ප්‍රජාතන්ත්‍රවාදය සහ එහි මූලධර්මයන් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත්, සැප්තැම්බර් 15 දිනට යෙදී ඇති ජාත්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදී දිනය නිමිත්තෙන් **"ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා තරුණ ප්‍රජාව"** මැයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදි.

ඒ අනුව විශ්වවිද්‍යාල සිසුන්, කාර්මික විද්‍යාලවල සිසුන්, යොවුන් පළාත් සභා නියෝජිතයන්, ජාතික තරුණ සේවා සභාව, යොවුන් පාර්ලිමේන්තුව, මැතිවරණ නිරීක්ෂකයින් වැනි විවිධ තරුණ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් වැඩසටහන් ත්‍රිත්වයක් මැතිවරණ කොමිෂන් සභාව සහ IFES සංවිධානය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලදි.

#### 11.2.6.1 අම්පාර දිස්ත්‍රික්කය

අම්පාර දිස්ත්‍රික්කය තුළ මෙම වැඩසටහන මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු කොමසාරිස් ජනරාල් එම්.එම්.මොහමඩ් මහතාගේ මූලිකත්වයෙන් 2020.09.17 දින පෙ.ව. 10.30 සිට ප.ව. 1.30 දක්වා Ainah Beach Resort හි පැවැත්විණි. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා, සහකාර මැතිවරණ කොමසාරිස් ශ්‍රීන් යාපා බොරලැස්ස, අම්පාර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තිලිණ වික්‍රමරත්න යන මහත්වරු ද ඊට සහභාගීවී සිටියහ. මෙම වැඩසටහන සඳහා තරුණ තරුණියන් 114 දෙනෙකු සහභාගිවීම විශේෂත්වයකි.

#### 11.2.6.2 අනුරාධපුර දිස්ත්‍රික්කය

මෙම වැඩසටහන තරුණයින් 130 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2020.09.18 දින පෙ.ව. 10.30 සිට ප.ව. 1.30 දක්වා Heritage Hotel හිදී පැවැත්විණි.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩසටහන පැවැත්වූ අතර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා, සහකාර මැතිවරණ කොමසාරිස් ශ්‍රීන් යාපා බොරලැස්ස, අනුරාධපුර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එම්.බී.එම්.සුහියාන් යන මහත්වරු ද ඊට සහභාගීවී සිටියහ. මෙහිදී "ප්‍රජාතන්ත්‍රවාදය තුළ තරුණ සහභාගිත්වය" මැයෙන් සභාපතිවරයා විසින් විශේෂ දේශනයක් පවත්වනු ලැබීය.

### 11.2.6.3 කොළඹ දිස්ත්‍රික් ජාතික වැඩසටහන

මෙම වැඩසටහන 2020.09.27 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ශ්‍රවණාගාරයේ දී ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. අදියර දෙකකින් මෙම වැඩසටහන පැවැත්වූ අතර ගරු නාමල් රාජපක්ෂ, ගරු ජීවන් තොණ්ඩමාන්, ගරු කාවින්ද ජයවර්ධන, ගරු සානක්කියන් රාජපුත්තිරන් ඉරාසමාණික්කම් තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා මණ්ඩපයක් ද පැවැත්විණි. මෙහිදී "ප්‍රජාතන්ත්‍රවාදය තුළ තරුණ සහභාගිත්වය" මැයෙන් ද, තරුණ පිරිස්වල දේශපාලන ක්‍රියාකාරිත්වය අනාගතයේදී වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද විවිධ අදහස් ප්‍රේක්ෂකයන් වෙතින් ඉදිරිපත්වීම විශේෂත්වයකි.

මෙම වැඩසටහනේ දෙවන අදියරය යටතේ වෙසෙසින්ම ස්වයං රැකියා, මාධ්‍ය වැනි කරුණු අළලා සාකච්ඡාවක් පැවැත්වූ අතර තනික පෙරේරා මහතා, ප්‍රසාන් ඩි විසර් මහතා, කුමරිනී ප්‍රතාපසිංහ මෙනවිය, ජනිත් පෙරේරා මහතාගේ සහභාගීත්වයෙන් පැවති අදහස් හුවමාරුව ගැඹුරු සාකච්ඡාවක ස්වරූපයක් ගෙන තිබූ අතර එයට බොහෝ ප්‍රේක්ෂක ප්‍රතිචාර ලැබුණි.

තවද මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතාගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් වන ජනාධිපති නීතිඥ නලින් අබේසේකර මහතා, මහාචාර්ය රත්නජීවන් එච්.හූල් මහතා මෙන්ම, මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා ඇතුළු අතිරේක/නියෝජ්‍ය සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ඇතුළු 300 කට ආසන්න පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම වැඩසටහන පැවැත්විණි.

මෙහිදී **"ප්‍රජාතන්ත්‍රවාදය තුළ තරුණ සහභාගිත්වය"** මැයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා විශේෂ දේශනයක් පැවැත්විය.

## 12. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

12.1 මැතිවරණ කොමිෂන් සභාවේ සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාලවල සහාය ඇතිව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සිදුකරන ලද අතර උපාය මාර්ගික සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම සිදු කරන ලදි.

12.2 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට අදාළ කටයුතු 2020 වර්ෂයේ දෙසැම්බර් මස වනවිට අවසන් අදියරට පැමිණ තිබුණි.

## 13. උපායමාර්ගික සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්මේ දක්වා ඇති ආකාරයට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හරහා කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන්, ඡන්ද විමසීම් නීතිරීති, මැතිවරණ ක්‍රම හා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය පිළිබඳව විද්‍යාර්ථීන්/ ශිෂ්‍ය ප්‍රජාව / විවිධ ආයතනවල /සංවිධානවල නිලධාරීන් /පොදු මහජනතාව/ ස්වේච්ඡා සංවිධානවල සාමාජිකයන් දැනුම්වත් කිරීමේ වැඩමුළු, දේශන, චිත්‍ර හා පෝස්ටර් තරඟ, දැනුම මිනුම තරඟ පැවැත්වීමට සහාය වීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදුවිය.



## 14. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු

කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් පිළිබඳව, 2020 පාර්ලිමේන්තු මැතිවරණය, 2020 ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය, මාධ්‍ය උපමාන සහ ඡන්ද විමසීම් කාල සීමාවේ දී විද්‍යුත් මාධ්‍ය භාවිතාව පිළිබඳව ඡන්ද විමසීම හා සබැඳි වෙනත් කරුණු පිළිබඳව සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතනවල මාධ්‍ය ආයතන ප්‍රධානීන්/ විධායක නිලධාරීන්/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරුන්/ ප්‍රවෘත්ති සංස්කාරකවරුන්/ කර්තෘ සංසදය, මාධ්‍ය උපමාන පිළිබඳ නිත්‍ය නියෝජිත කමිටුව හා මැතිවරණ කොමිෂන් සභාවේ මාධ්‍ය ආවරණ කටයුතුවල නිරත මාධ්‍යවේදීන් දැනුම්වත් කිරීමට 2020 වර්ෂයේදී මාධ්‍ය සාකච්ඡා වට 06 ක් පවත්වා ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජිකයන් සහභාගි වන රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම හා අදාළ පරිදි මාධ්‍ය නිවේදන නිකුත් කිරීමද සිදුකරන ලදි.




## 15. ලේඛනාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ කාර්යයන් නව පරිශ්‍රයක ස්ථාපිත කොට වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍ය වන පරිදි ඕනෑම පාර්ශවයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදි.

මෙම කාර්යය සඳහා පූර්ණ කාලීනව නිලධාරියකු අනුයුක්ත කර ඇති අතර ලේඛනාගාර කටයුතු පිළිබඳ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිලධාරියාට විධිමත් පුහුණුවක් ලබා දී ඇති අතර එමගින් ලේඛනාගාරයේ සේවාවන් වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට ක්‍රියා කර ඇත.

## 16. 2020 වසර තුළ සිදුකරන ලද විශේෂිත කාර්යයන්

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදි. එහි හතරවන වෙළුමේ පළමු හා දෙවන කලාප ( ජනවාරි - අගෝස්තු ) එක් කලාපයයක් ලෙස නිකුත් කරන ලදි. 2020 තෙවන කලාපය හෙවත් අවසාන කලාපය 2021 ජනවාරි මාසයේ දී මුද්‍රණය කිරීම සඳහා කෙටුම්පත සකස් කොට අවසන්ව ඇත.





පාර්ලිමේන්තුවට වසර 70ක් පිරීම නිමිති කරගෙන 1947 සිට 2015 දක්වා පැවැති පාර්ලිමේන්තු මැතිවරණවල ප්‍රතිඵල ඇතුළත් කර සකසන ලද ත්‍රෛභාෂික ග්‍රන්ථය මුද්‍රණය කරන ලදි.




## 17. නීති කටයුතු

### 17.1 නීතිපති උපදෙස් විමසීම

පහත පරිදි ඒ ඒ අධිකරණයට අදාළ වන ආකාරයෙන් නීතිපති උපදෙස් ලබාගැනීමට ක්‍රියාකර ඇත.

- ඇල්කඩුව වැව්ලි සමාගමට එරෙහිව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති නඩුව සම්බන්ධව උපදෙස් විමසමින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2020.06.09 දිනැති ලිපිය යොමු කරන ලදි.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 ට අදාළව පුද්ගල ඒකරාශී වීම් සහ පක්ෂ අපේක්ෂක රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් නෛතික තත්ත්වය පිළිබඳව නීතිපති උපදෙස් විමසමින් ලිපියක් 2020.06.20 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදි.

- ජනාධිපතිවරණය 2019 කාලසීමාවේ දී LED තිරවල මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදු කිරීමට අවසර නොදීම සම්බන්ධව ගොනු කර තිබූ SC/ Writ/08/2019 ට අදළව සහ මෙවර පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව LED තිරවල ප්‍රචාරක කටයුතු සිදු කිරීමට ඇති නීතිමය තත්ත්වය පිළිබඳ උපදෙස් විමසමින් ලිපි දෙකක් 2020.06.16 සහ 2020.06.22 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට ක්‍රියාකර ඇත.

- වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ඡන්ද ගණනය කිරීමේ දෝෂය සම්බන්ධයෙන් නීතිපති උපදෙස් මින් පෙර විමසා තිබූ අතර, ඒ පිළිබඳ ගණනය කිරීම් සහිත ලේඛනයක් නීතිපති දෙපාර්තමේන්තුවේ පරිශීලනය සඳහා 2020.06.20 දිනැතිව ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥ ආචාර්ය අවන්ති පෙරේරා වෙත යොමු කරන ලදි. මේ සම්බන්ධයෙන් විමර්ශන කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව ලද විගස එය යොමු කිරීමට ක්‍රියා කර ඇත.

- රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභාපති සුදත් දිසානායක මහතා සහ කළුආරච්චිගේ රණවක කළුආරච්චි යන අය විසින් සභිකධූරය දැරීමට නුසුදුස්සන් වන බවට කරන ලද පැමිණිල්ල සම්බන්ධව නීතිපති උපදෙස් විමසමින් ලිපියක් 2020.07.12 දිනැතිව යොමු කරන ලදි.

- නිරෝධායනය වෙමින් සිටින ඡන්දදායකයන් සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් ලබා දීම සම්බන්ධව උපදෙස් විමසමින් ලිපියක් 2020.07.28 දිනැතිව යොමු කිරීම.

- අපේ ජනබල පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සම්බන්ධව උපදෙස් විමසමින් ලිපියක් 2020.08.11 දිනැතිව යොමු කිරීම

- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය රාජ්‍ය භාරකාරත්වයක් දරන ආයතනයක් ද නැතහොත් පෞද්ගලික ආයතනයක් ද යන්න සම්බන්ධව උපදෙස් විමසමින් ලිපියක් 2020.08.14 දිනැතිව යොමු කිරීම

- වැලිගම නගර සභාවේ සභාපතිවරයා පාර්ලිමේන්තු මැතිවරණය සඳහා අපේක්ෂකයකු ලෙස කටයුතු කරමින් දේශපාලන ප්‍රවර්ධන කටයුතු සඳහා සිය තනතුර භාවිතා කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් ලිපියක් 2020.08.19 දිනැතිව යොමු කිරීම.

- 2020 වර්ෂය සඳහා නව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් ලිපියක් 2020.09.07 දිනැතිව යොමු කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී තනතුර පත් කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් 2020.10.19 දිනැතිව ලිපියක් යොමු කිරීම.

- රත්නපුර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සහ තවත් සභිකයකුගේ සභිකත්වය දැරීමට ඇති නුසුදුසුකම් සම්බන්ධව අප වෙත ලැබී ඇති පැමිණිලි සම්බන්ධව නීතිපති උපදෙස් විමසමින් ලිපියක් 2020.12.09 දිනැතිව යොමු කිරීම.

- පුත්තලම දිස්ත්‍රික්කයේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස ප්‍රතිඵල ගණනය කිරීම දෝෂ සහිත වීම සම්බන්ධව නැවත උපදෙස් විමසමින් ලිපියක් 2020.11.27 දිනැතිව යොමු කිරීම.

### 17.2 නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පවත්වනු ලබන සාකච්ඡා සඳහා සහභාගී වීම

මැතිවරණ ක්‍රියාවලියට අදාළ නීති සංශෝධන, නඩුවලට අදාළ උපදෙස් ලබාගැනීම සඳහා පහත ආකාරයට ක්‍රියාකර ඇත.

- SC/ FR/83/2020, SC/ FR/85/2020, SC/ FR/86/2020, SC/ FR/87/2020, SC/ FR/88/2020, SC/ FR/89/2020, SC/ FR/92/2020 සහ SC/ FR/115/2020 යන ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවාර සඳහා 2020.05.22 දින සහකාර මැතිවරණ කොමසාරිස් (නීති) විසින් සහභාගී වී ඇත.

- නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට අදාළව ගොනු කර ඇති නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නීතිඥ නවෝදි ද සොයිසා මෙනවිය සමඟ සාකච්ඡාවක් 2020.06.02 දින පැවැත්වූ අතර, මේ සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් (නීති) ධරනි උපේකා වීරසේකර මහත්මිය ද සහභාගී විය.

- පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රචාරක සීමා සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් (නීති) ධරනි උපේකා වීරසේකර මහත්මිය, නීතිපති දෙපාර්තමේන්තුවේ ආචාර්ය අවන්ති පෙරේරා මහත්මිය සහ ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සුරේන් ඥානරාජ් මහතා හමු විය. 2020.06.26 දින නීතිපති දෙපාර්තමේන්තුවේ දී මෙම සාකච්ඡාව පැවැත්විණි.

- SC/FR/221/2020 නඩුවට අදාළව අතිරේක සොලිසිටර් ජනරාල් ඉන්දිකා දේමුණි ද සිල්වා මහත්මිය සමඟ 2020.08.14 දින පවත්වනු ලැබූ සාකච්ඡාව සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් (නීති) ධරනි උපේකා වීරසේකර මහත්මිය සහභාගී වීම.

- DSP/10/2020 නඩුවට අදාළව රාජ්‍ය නීතිඥ මේධක ප්‍රනාන්දු මහතා සමඟ 2020.08.28 දින පවත්වනු ලැබූ සාකච්ඡාව සඳහා සහභාගී වීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 ට අදාළව රත්නපුර දිස්ත්‍රික් කොළොන්න ඡන්ද ප්‍රදේශයේ මනාප සංඛ්‍යාව සම්බන්ධව සණී රෝහණ කොඩිතුවක්කු යන අය විසින් ගොනු කර ඇති CA/ Writ/237/2020 නඩුව සම්බන්ධව සාකච්ඡාවක් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් විවේකා සිරිවර්ධන මහත්මිය සමඟ පැවැත්විය. මේ සඳහා රත්නපුර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් සුරංග අඹගහතැන්න මහතා ද සහභාගී විය.

**17.3 නීති සංශෝධනවලට අදාළ කටයුතු**

**17.3.1 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත සංශෝධනය කිරීම**

1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධන පනත් කෙටුම්පත 2019.09.18 දින ගැසට් පත්‍රයේ අතිරේකයක් ලෙස පළ වූ නමුත් පනතක් ලෙස සම්මත වීම සඳහා ක්‍රියාත්මක වීමක් සිදු නොවූ හෙයින් නව කැබිනට් මණ්ඩලය වෙත නැවත ඉදිරිපත් කර ක්‍රියාත්මක කර ගැනීමට කටයුතු සිදු කර ඇත.

**17.3.2 මැතිවරණ වියදම් පාලනය සඳහා වන නීති සම්පාදනය**

මේ වන විට මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ වියදම් පාලනයට අවශ්‍ය නීති සම්පාදනය කරමින් සකස් කළ පනත් කෙටුම්පත නිරීක්ෂණය කර ඊට අදාළ සංශෝධන ඇතුළත් කරමින් නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත. ඉන් පසුව එය නීතිපතිවරයා වෙත යොමුකර ඔහුගේ ද එකඟතාවය ලැබුන ද, නව ආණ්ඩුව පත්වීම හේතුවෙන් එය නැවත නව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වන නිසා මේ පිළිබඳව ජනාධිපති ලේකම්වරයා දැනුම්වත් කරමින් නව කැබිනට් මණ්ඩලයට අදාළ කෙටුම්පත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසට ලිපියක් මඟින් දන්වා යවා ඇත.

**17.3.3** නීති සංශෝධනයන්ට අදාළව අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ වැඩිදුර පැවැති සාකච්ඡාවක් පැවති අතර එකී සාකච්ඡාවේ දී තීරණය කළ පරිදි නීති සංශෝධනයට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ යෝජනා ඇතුළත් වාර්තාවක් එම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලදි.

**17.3.4** කඩිනමින් සිදු කළ යුතු මැතිවරණ නීති සංශෝධන පිළිබඳව අතිගරු ජනාධිපතිතුමන්ගේ කාරුණික අවධානය යොමු කිරීමට කටයුතු කරන ලෙසට දන්වමින් ජනාධිපත් ලේකම් වෙත 2020.02.12 දිනැතිව ලිපියක් යොමු කිරීම.

### 17.4 නීති උපදෙස් ලබා දීම සහ අනෙකුත් නීතිමය කටයුතු

- සේවය තාවකාලිකව අත්හිටුවීම් සහ ඡන්ද විමසීම කාල සීමාවන්හි දී පත් කිරීම සම්බන්ධව උපදෙස් විමසමින් පැමිණෙන ලිපි සඳහා අවශ්‍ය නීති උපදෙස් ලබා දෙන ලදි.

- ජනාධිපතිවරණය 2019 ට අදාළව සහ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ බී. සී පත්‍ර අපහරණය සම්බන්ධව අනුරාධපුරය, මොණරාගල , නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, ගාල්ල, කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් විමසා ඇති උපදෙස් ලිපි සම්බන්ධව නිරීක්ෂණ ජාතික මැතිවරණ අංශය වෙත ලබා දීම.

- වෙනත් ආයතන වෙතින් සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් යොමු කරනු ලබන නාමයෝජනා පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධව, ස්ථානමාරු කිරීම් සම්බන්ධව සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නීති උපදෙස් ලබා දීම් සිදු කරන ලදි.

- සිර දඩුවම් විඳින පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය ලබා දීම සම්බන්ධව අනුරාධපුර මහාධිකරණය විසින් යොමු කර ඇති වාර්තාව පරීක්ෂා කර බලා ජාතික මැතිවරණ අංශය වෙත අදාළ නිරීක්ෂණ ලබා දීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව පවරා ඇති නඩු සම්බන්ධයෙන් සහ සභිකධුර පුරප්පාඩු පිරවීම සම්බන්ධව පළාත් පලන අංශයට උපදෙස් ලබා දීම.

- පාර්ලිමේන්තු මැතිවරණ 2020 නාමයෝජනා පත්‍ර භාර දීමේ දී ව්‍යාජ අත්සන් යෙදීම සම්බන්ධව ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අංශ වෙත යොමු කිරීම.

- ගල්කිස්ස මහේස්ත්‍රාත් අධිකරණය මඟින් නඩු කටයුත්තකට අදාළව ඉල්ලා ඇති ඡන්දහිමි නාමලේඛන ආශ්‍රිතව වාර්තාවක් ලබා දීම.

- මාතලේ දිස්ත්‍රික්කයේ මනාප ප්‍රතිඵල දෝෂ සහිත බව දන්වමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවන ලද ලිපියට අදාළව මාතලේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී සහ සහකාර තේරීම්භාර නිලධාරී වෙතින් වාර්තාවක් ලබා ගැනීම.

- 2020 පාර්ලිමේන්තු මැතිවරණ සඳහා අපේක්ෂකයන් ලෙස තරඟ කරන ලද රාජ්‍ය සේවකයන්ගේ වැටුප් සම්බන්ධව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත 2020.09.15 දිනැතිව ලිපියක් යොමු කිරීම.

- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව මාතර, කළුතර, ගම්පහ උතුර සහ රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් කරනු ලැබූ උපදෙස් විමසීම් සම්බන්ධව අදාළ නීති උපදෙස් ලබා දීම.

- අනුරාධපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මඟින් පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වීම සම්බන්ධව ඇති නීතිමය තත්ත්වය පිළිබඳව උපදෙස් විමසමින් එවන ලද ලිපිය සඳහා උපදෙස් ලබා දීම.

- වෙනත් පාර්ශව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත එවන ලද ලිපි සඳහා උපදෙස් ලබා දීම සහ අවශ්‍ය අංශ වෙත යොමු කිරීම.

- 2020 පාර්ලිමේන්තු මැතිවරණ රාජකාරිවලට සහභාගී නොවූ රජයේ නිලධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කිරීමට අදාළව වාර්තාවක් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙසට දන්වමින් ලිපියක් අදාළ විනය බලධරයන් වෙත යොමු කිරීම.

**17.5 නඩු කටයුතු සම්බන්ධව**

2020 වර්ෂයේ දී ලද නඩු සංඛ්‍යාව - 54, එයින් නඩු 24 ක් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේද, නඩු 14 ක් අභියාචනාධිකරණය හමුවේද, එකක් මහාධිකරණයේද, 15 ක් දිසා අධිකරණ තුළද ගොනු කර ඇත.

2020 වර්ෂයේ ලැබුණු නඩුවලින් 2020.12.31 දින වන විට අවසන් වී ඇති නඩු සංඛ්‍යාව 17 කි.

මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ පෙරකලාසි යොමු කිරීම ඇමුණුම 36 ලෙස මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

**17.6 අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සම්බන්ධ කටයුතු**

පළාත් පාලන ආයතන සභිකයකු සම්බන්ධයෙන් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම සම්බන්ධව අදාළ අංශ දැනුවත් කිරීම සිදු කරන ලදි.

**17.7 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දේශපාලන පක්ෂ පිළිගැනීමට 7(4)අ වගන්තිය යටතේ ක්‍රියා කිරීම.**

2020 වර්ෂයේ දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කරමින් ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව 156 ක් වූ අතර කමිටුව විසින් මුල් අවස්ථාවේම ප්‍රතික්ෂේප කල සංඛ්‍යාව අයදුම්පත් 40 කි. මුල් අවස්ථාවේම ප්‍රතික්ෂේප කළ අයදුම්පත් 40 අතරින් අයදුම්පත් 06 ක් නැවත සලකා බැලීම සඳහා ඉදිරිපත් කළ අතර ඒ අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ මුළු අයදුම්පත් ගණන 121 කි. එම අයදුම්පත් පිළිබඳව සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, අදාළ ලේඛණ පිරික්සීම ආදී දීර්ඝ ක්‍රියාවලියකින් පසු පිළිගත් දේශපාලන පක්ෂ ලෙස පහත සඳහන් පක්ෂ පිළිගැනීම පිළිබඳ නිවේදනය 2020.10.14 දින අංක 2197/19 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන ලදි.

- අරුණළු ජනතා පෙරමුණ
- ජනතා සේවක පක්ෂය
- නව ප්‍රජාතන්ත්‍රවාදී මාක්ස් ලෙනින් වාදී පක්ෂය
- පිවිතුරු හෙළ උරුමය
- සමත්තුව කච්චි
- සිංහල රාවය

**17.7.1 දේශපාලන පක්ෂ සම්බන්ධ සෙසු කටයුතු**

- දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ නිත්‍ය නියෝජිතයන් සමඟ රැස්වීමක් 2020.02.26 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්වීමට කටයුතු කිරීම.
- ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ගැටළු සම්බන්ධයෙන් 2020.01.20 සහ 2020.03.10 යන දිනයන්හී දී ප්‍රතිවිරුද්ධ පාර්ශව කැඳවා සාකච්ඡා කිරීම.
- අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය, එක්සත් ලංකා පොදුජන පක්ෂය, එක්සත් ලංකා මහා සභා පක්ෂය, ලිබරල් පක්ෂය සහ ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ යන අභ්‍යන්තර අර්බුද සහිත දේශපාලන පක්ෂවල පාර්ශවයන් සමඟ සාකච්ඡාවක් 2020.03.10 දින පැවැත්විණි. ඒ අනුව 2020 පාර්ලිමේන්තු මැතිවරණය

සඳහා නාමයෝජනා අත්සන් කිරීමේ බලය ලබාදීම සඳහා පමණක් අභිල ඉලංගෙයි මහජන කොංග්‍රස පක්ෂ නායක රිෂාඩ් බදියුදීන් මහතා වෙත ද, ඊලවර් ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ පක්ෂයේ රාජනාදන් ප්‍රබාහරන් මහතා වෙත ද පවරන ලදි.

- අභ්‍යන්තර අර්බුද සමථයකට පත් කර ගෙන නොමැති හෙයින් එක්සත් ලංකා පොදුජන පක්ෂය, එක්සත් ලංකා මහා සභා පක්ෂය සහ ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ මෙවර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ වැදීමට හිමිකම් රහිත පක්ෂ ලෙස දන්වන ලදි. එමෙන්ම අභ්‍යයන්තර ආරවුල් සමථයකට පත් කර ගැනීම හේතුවෙන් ලිබරල් පක්ෂයට පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ වැදීමේ හැකියාව පවතින බව දන්වන ලදි.

- 2020 පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව සංශෝධිත දේශපාලන පක්ෂ ලැයිස්තුව යාවත්කාලීන කරනු ලැබූ අතර, දේශපාලන පක්ෂ ලේඛනය ගැසට් නිවේදනයක් මඟින් පළ කරන ලදි.

### 17.8 නීති හා විමර්ශන අංශයට අදාළ වෙනත් කටයුතු

නීති පුස්තකාලය ස්ථාපිත කිරීමට අදාළව මේ වන විට මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, අදාළ නඩු වාර්තා සහ ව්‍යවස්ථාපිත පනත් සම්බන්ධව විමසමින් රජයේ මුද්‍රණාලයාධිපති වෙත ලිපියක් යොමු කර ඇති අතර මේ වන විට එකී ලිපිය සඳහා පිළිතුරු ලිපියක් අප වෙත යොමු වී ඇත. ඉදිරියේ දී අවශ්‍ය වාර්තා, පනත් සහ අනෙකුත් පොත් මිළදී ගැනීමට නියමිතය.

### 18. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

- 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනත යටතේ 2020.12.31 දින වන විට තොරතුරු ඉල්ලීම් 80 ක් ලැබී ඇති අතර, එම තොරතුරු ඉල්ලීම් අතරින් 70 ක් සඳහා තොරතුරු ලබා දීම සම්පූර්ණ කර ඇත. තොරතුරු ඉල්ලීම් 04 ක් සඳහා තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කර ඇත.

- පහත දක්වා ඇති දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙතින් තොරතුරු පනතට අදාළව උපදෙස් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර, එකී ලිපි සඳහා **ඇමුණුම 37** පරිදි උපදෙස් ලබා දීම සිදු කර ඇත.

### 19. කාර්ය මණ්ඩල තොරතුරු

කාර්ය මණ්ඩල විස්තර ( මාණ්ඩලික නිලධාරීන් )

අනුමත සංඛ්‍යාව - 78

දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව - 67

## 19.1 නව පත් කිරීම්.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6071 හා 2020.02.18 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඩබ්ලිව්.ජී.ඩබ්ලිව්.ඥානදයාලන් මහතා 2020.03.02 දින මැතිවරණ කොමිෂන් සභාවේ සේවයට වාර්තා කරන ලද අතර 2020.06.06 දින සිට කිලිනොච්චිය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5398 හා 2020.03.03 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය 2020.03.10 දින සිට පොලොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක R/1/1/POSTING/2020 හා 2020.03.05 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ටී.හෙන්ස්මන් මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන් පත් කරන ලදි.

- ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 1/104/662 (G) හා 2020.08.04 දිනැති ලිපිය මඟින් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කරන ලද භාෂා පරිවර්තන සේවයේ I පන්තියේ එම්.එන්.මුම්තාජ් මහත්මිය 2020.09.02 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ භාෂා පරිවර්තක (සිංහල/ දෙමළ) වශයෙන් පත් කරන ලදි.

## 19.2 ස්ථාන මාරු

### 19.2.1 අභ්‍යන්තර ස්ථාන මාරු

- ශ්‍රී ලං.ප.සේ. I ශ්‍රේණියේ ඩබ්ලිව්.එච්.ආර්.විජයකුමාර මහතා 2020.03.02 දින සිට කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

### 19.2.2 කොමිෂන් සභාවෙන් පිටතට ලබා දෙන ලද ස්ථාන මාරු

- මැතිවරණ කොමිෂන් සභාවේ පොලොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ ඩබ්ලිව්.ඒ.එල්.වික්‍රම ආරච්චි මහතා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5273 හා 2020.03.02 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එම්.ජෙපමයුරන් මහතා රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අංක R/1/1/POSTING/2020 හා 2020.03.11 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රාජකාරී භාර ගැනීම සඳහා 2020.03.11 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවේ කිලිනොච්චිය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ ඩී.සී.අරවින්දරාජ් මහතා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5579 හා 2020.03.02 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත නිදහස් කරන ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවේ කොළඹ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එස්.ඩී.එස්.ඒ.රූපසිංහ මහතා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5138(2010) හා 2020.9.10 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරී භාර ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවේ වවුනියාව දිස්ත්‍රික් පරිපාලන නිලධාරී වශයෙන් වශයෙන් සේවය කරන ලද ටී.ශක්තිරාජ් මහතා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/42884 2020.12.01 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රාජකාරී භාර ගැනීම සඳහා වහාම ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් සේවය කළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ එම්.ජී.සී.එස්.රණසිංහ මහතා රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5520(2012) හා 2020.12.18 දිනැති ස්ථාන මාරු නියෝගයට අනුව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ රාජකාරී භාර ගැනීම සඳහා 2020.12.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කරන ලදි.

ඉහත නම් සඳහන් සියලු නිලධරයන් මැතිවරණ දෙපාර්තමේන්තුව / මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් ඉටු කරන ලද සේවය අගය කරමු.

## 20. විදෙස් පුහුණු හා නිල චාරිකා

### 20.1. නිල චාරිකා

2020.01.22 දින සිට 2020.01.26 දින දක්වා ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති දකුණු ආසියාතික මැතිවරණ බලධාරීන්ගේ සංසදයේ 10 වන සමුළුවට සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා සහ සභාපති සම්බන්ධීකරණ ලේකම් රිසාන් එම්.ඒ.හමීඩ් මහතා සහභාගී විය.

### 20.2. පුහුණු

- ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට (2020.01.01 දින සිට 2021.08.07 දින දක්වා), සහභාගී වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු සහකාර මැතිවරණ කොමසාරිස් ඩී. සී අරවින්දරාජ් මහතා ඕස්ට්‍රේලියාව බලා පිටත්විය.

- මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු සහකාර මැතිවරණ කොමසාරිස් ඩබ්. ඒ. එල්. වික්‍රම ආරච්චි මහතා ඕස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා (2020.01.06 දින සිට 2022.01.07 දින දක්වා) සහභාගීවීමට විදේශගත විය.

- 2020.02.10 දින සිට 2020.02.11 දින දක්වා එක්සත් රාජධානියේ පැවති Commonwealth Political Finance Regulation Validation සාකච්ඡාව සඳහා, මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරමින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික එන්. ජේ. අබේසේකර මහතා සහභාගී විය.

- 2020.02.24 දින සිට 2020.02.28 දින දක්වා ඕස්ට්‍රේලියාවේ පැවති, ඕස්ට්‍රේලියානු මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමේ වැඩසටහන සඳහා රසික පීරිස් මහතා (අතිරේක මැතිවරණ කොමසාරිස් - ජාතික මැතිවරණ), ටී. ඒ. සී. එන්. තලංගම මහතා (නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් - මහනුවර), එස්. ඒකනායක මහතා (අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ), ජේ.ඒ.එස්.පී. ජයසිංහ මහතා (නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් - පාලන), ආර්. සසීලන් මහතා (සහකාර මැතිවරණ කොමසාරිස් - මඩකලපුව), ආර්. සී. අමල්රාජ් මහතා (සහකාර මැතිවරණ කොමසාරිස් - යාපනය), ටී. ඩබ්. පෝෂිතා කෞමදී මෙනවිය (සහකාර මැතිවරණ කොමසාරිස් - මාතර) සහ ඒ.එන්.එන්. නුස්රත් මෙනවිය (සහකාර මැතිවරණ කොමසාරිස් - පළාත් පාලන) සහභාගී විය.

- 2020 වර්ෂයේ මාර්තු මස දෙවැනි සතියේ සිට ගෝලීය වශයෙන් වූ නිරෝධායන ඇඳිරි නීති හේතුවෙන් රටවල් වැසීයාම හා ගුවන් ගමන් අත්හිටුවීම නිසා 2020 මාර්තු මස සිට 2020.12.31 දින දක්වාම මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා, සාමාජික මහත්වරුන්ට හෝ නිලධරයන්ට විදේශ පුහුණු හෝ වැඩමුළු සඳහා සහභාගී වීමට අවස්ථාව නොලැබීම හේතුවෙන්, මැතිවරණ කළමනාකරණය මෙන්ම, මැතිවරණ ක්‍රමවේද පිළිබඳ අත්දැකීම් බෙදා ගැනීමට තිබූ අවස්ථාව අහිමිවී ඇත.

## 21. පාලන අංශයේ කටයුතු

### 21.1 කාර්ය මණ්ඩල කටයුතු

#### 21.1.1 කළමනාකරණ සේවා නිලධාරි සේවය.

- 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ කළමනාකරණ සේවා නිලධාරීන් තිදෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය අතර, ඔවුනගේ අනුප්‍රාප්තික නිලධරයන් තිදෙනෙකු සේවය සඳහා වාර්තා කරන ලදි.

- අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කළමනාකරණ සේවා නිලධාරයන් 11 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදි.

- මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවයේ නිලධරයන් 11 නෙකු ස්ථාන මාරු ලබා යන ලදි.

#### 21.1.2 සංවර්ධන නිලධාරි සේවය

සංවර්ධන නිලධාරි සේවයේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2020.01.01 දින සිට සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ නවක නිලධරයන් 05 දෙනෙකු රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙතින් ලබා දෙන ලදි.

#### 21.1.3 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ III ශ්‍රේණියේ පැවති පුරප්පාඩුව සඳහා ස්ථාන මාරුවීමට කැමැත්ත පල කළ තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරිණියක මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදි.

#### 21.1.4 රියදුරු සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ රියදුරු සේවයේ 01 අයෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදි.

#### 21.1.5 රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලැබීම මත නිදහස් කිරීම

මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කළ ලේඛන සහකාර III ආර්.එම්.ඩී. රත්නායක මහත්මිය ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) තනතුරකට පත්වීමක් ලැබීම නිසා ලේඛන සහකාර තනතුරින් සම්පූර්ණයෙන්ම ඉවත්වී ගුරු සේවයේ තනතුරේ රාජකාරි භාර ගැනීමට හැකිවන පරිදි 2020.03.04 දින සේවයෙන් පසු නිදහස් කර යවන ලදි.

**21.1.6 කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම.**

- මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු ලේඛන සහකාර III ශ්‍රේණියේ විභාගයට පෙනී නොසිටි නිලධරයන් 02 දෙනා සහ අසමත් නිලධරයා සඳහා 2020.07.16 දින කාර්යක්ෂතා කඩඉම් විභාගය ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හරහා පැවැත්වීමට කටයුතු කරන ලදි.

- කාර්යාල සේවක සේවයේ I, II හා III ශ්‍රේණිවල සේවක මහත්ම/ මහත්මින් 60 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2020.12.17 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පැවැත්වීමට කටයුතු කරන ලදි.

**21.1.7 පුරප්පාඩු තනතුරුවල රාජකාරි කටයුතු ආවරණය කිරීම.**

මැතිවරණ කොමිෂන් සභාවේ පැවති පුරප්පාඩුවල රාජකාරි කටයුතු ඉටු කර ගෙන යාම, ඡන්දහිමි නාම ලේඛන ප්‍රතිශෝධන කටයුතු සඳහා සහ 2020.08.05 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයට අදාල මූලික කටයුතු හා පශ්චාත් කටයුතු සඳහා සහායටද කඩින් කඩ අනියම් සේවක / සේවිකාවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරන ලදි.

**21.1.8 විශ්‍රාම ගැන්වීම්**

මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් 03 දෙනෙකු හා රියදුරු සේවයේ සේවක මහතුන් 02 කෙනෙකුද, 2020 වර්ෂය තුල විශ්‍රාම ගන්නා ලදි. මෙලෙස විශ්‍රාම ලබා ගත් 05 දෙනාගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු පැවති කොවිඩ් වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද සිදු කර අවසන් කරන ලදි. විශ්‍රාම ගත් නිලධාරීන් හා සේවක මහතුන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව **ඇමුණුම 38** ලෙස යා කර ඇත. මැතිවරණ දෙපාර්තමේන්තුවට/ මැතිවරණ කොමිෂන් සභාවට ඔවුන් ලබා දුන් අනගි සේවය බෙහෙවින් අගය කරමු.

**21.2 පවිත්‍රතා කටයුතු**

මැතිවරණ මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු කරන ලද සුපර් ෂයින් සර්විස් ආයතනය සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2020.02.29 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසි ධ පුවත්පත් දැන්වීමක් මගින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ දිප්ති ක්ලිනින් සර්විස් ආයතනයයි. එබැවින් 2020.03.01 දින සිට 2021.02.28 දින දක්වා වූ කාලය සඳහා දිප්ති ක්ලිනින් සර්විස් ආයතනය සමඟ පවිත්‍රතා කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදි.

## 21.3 ආරක්ෂක කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා යුනයිටඩ් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2020.02.29 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ යුනයිටඩ් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගමයි. ඒ අනුව 2020.03.01 දින සිට 2021.02.28 දින දක්වා වූ කාලය සඳහා යුනයිටඩ් ෆීල්ඩ් සිකියුරිටි සර්විස් (පුද්) සමාගම සමඟ ආරක්ෂක කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදි.

## 21.4 පුහුණු හා වැඩමුළු

- ගිණුම්කරණ මෘදුකාංගය හඳුන්වාදීමේ පුහුණු වැඩමුළුව 2020.01.16 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදී හා රත්නපුර, මහනුවර, වවුනියාව යන දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලදී පිළිවෙලින් 2020.01. 17,20 හා 21 යන දිනවලදී පවත්වන ලදි.
- පසුගිය ජනාධිපතිවරණයේ උගත් පාඩම්, උපාය මාර්ගික සැලැස්මේ ක්‍රියාකාරකම් සහ ඡන්ද මධ්‍යස්ථාන ගූගල් සිතියම්ගත කිරීම (Google Mapping ) පිළිබඳ වැඩමුළුව - 2020.01.29 හා 30 අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී මැතිවරණ කොමිෂන් සභාවේ සියළුම මාණ්ඩලික නිළධාරින් සඳහා පැවැත්විය.
- Higher National Diploma in Public Procurement and Contract Administration පාඨමාලාව සඳහා 2020.01.28 දින සිට වසරක කාලයක් සඳහා ගණකාධිකාරි (ගෙවීම්) පී.ආර්.බී. සුමංගලී මෙනවිය සහභාගි විය.
- දැනට මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා මයුරි තෙන්නකෝන් මෙය Wordpress පිටු සැකසුම් පාඨමාලාව සඳහා 2020.01.18 දින සිට දින 10ක කාලයක් සඳහා සහභාගී කරවන ලදි.
- සබරගමුව විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යාව හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වූ දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2020.02.03 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී සංවිධානය කරන ලදි.
- SLIIT web program development පුහුණුව සඳහා 2020.02.15 වන දින තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර එම්. අරුල්කුමරන් මහතා සහභාගි විය.
- එක් එක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලකින් දෙදෙනෙකු බැගින් සහභාගී කරවමින් IFES ආයතනයේ සහය ඇතිව 2020.02.28 දින පරිගණක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව පැවැත්විණි.
- මිලෝදා පුහුණු ආයතනයේ පැවැති Project proposal writing skills පුහුණුව සඳහා 2020.02.13 හා 14 දිනවලදී සහකාර අධ්‍යක්ෂ (තො.ත.) රංජන් නිශාන්ත මහතා සහභාගී විය.
- 2020.02.19 හා 20 දිනවලදී පැවති වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය වැඩමුළුව සඳහා ක.සේ.නි.I බී.තිනකරන් මහතා සහ ක.සේ.නි.III පී.එල්.වයි.එම්. ලියනගේ මහතා සහභාගි විය.

- සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) ශ්‍රීන් යාපා බොරලැස්ස මහතාගේ හා සහකාර මැතිවරණ කොමසාරිස් (කෑගල්ල) සජිත් අසංග වෙල්ගම යන මහත්වරුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම වෙනුවෙන් රු. 172,500.00 බැගින්ද, නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (රත්නපුර) සුරංග අඹගහතැන්නේ මහතාගේ පශ්චාත් උපාධි පාඨමාලාව වෙනුවෙන් අවසන් වාරිකය ලෙස රු. 50,000.00ක මුදලක් ද ගෙවීමට කටයුතු කරන ලදි.

- CMEV ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් 2020.09.25 හා 26 දෙදින ප්‍රධාන කාර්යාලයේ සහ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් වෙනුවෙන් 2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව උගත් පාඩම් පිළිබඳ දෙදින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි.

- CMEV ආයතනයේ මූල්‍ය දායකත්වයෙන් 2020.09.27 හා 28 දෙදින ප්‍රධාන කාර්යාලයේ සහ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් වෙනුවෙන් මැතිවරණ ප්‍රචාරණ වියදම්, මැතිවරණ පැමිණිලි කළමනාකරණය හා සිවිල් සංවිධානවල දායකත්වය ලබා ගැනීම පිළිබඳව මැතිවරණ කළමනාකරණ ආයතනවල කාර්ය භාරය පිළිබඳ පුහුණු වැඩමුළුවක් පවත්වන ලදි.

- ප්‍රාග් ආයතනය විසින් පවත්වන්නට යෙදුනු රජයේ දේපළ පුහුණු වැඩමුළුව 2020.09.12 දින ක.සේ.නි.III ආර්.එම්.කේ.ජී.එල්.බී. රාජනායක මහතා සහභාගි විය.

- SLIDA ආයතනයේ පැවැත්වෙන විගණනය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක එස්.ටී. බුලත්සිංහල මහතා සහභාගි කරවීම සඳහා රු. 100,000.00 ක මුදලක් ගෙවීම් සිදුකිරීම.

- සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වන ආර්. සී. අමල්රාජ් මහතා, ආර්. සසීලන් මහතා, කේ. කාන්දීපන් මහතා, එන්. රේගන් මහතා හා ඩබ්.ජී.ඩබ්. ඥාණදයාලන් මහතා හට කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා රු. 150,000 බැගින් ලබාදීම සිදු කරන ලදි.

- SLIDA ආයතනයේ පැවැත්වෙන විගණනය පිළිබඳ ඩිප්ලෝමාව සඳහා ගණකාධිකාරි (ගෙවීම්) පී.ආර්.බී. සුමංගලී මෙනවිය සහභාගි කරවීම සඳහා රු. 100,000.00 ක මුදලක් ගෙවීම් සිදු කරන ලදි.

- ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය මගින් මාර්ගගතව පවත්වන ලද ඡන්ද දායකයින් ලියාපදිංචිය පිළිබඳ නිලධාරී ධාරිතා සංවර්ධන වැඩමුළුව සඳහා සහකාර කොමසාරිස්වරුන් වන පී.ආටිගල මෙනවිය, පී.කෞමදී මෙනවිය, එන්.රේගන් මහතා සහ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) කේ.රත්නායක මහත්මිය 2020.11.23 සිට 2020.11.27 දක්වා සහභාගී විය.

## 21.5 වාහන හා පාලනය

2020.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාව සතුව පැවැති වාහන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | වාහන වර්ගය | සංඛ්‍යාව | කාර්යාලය | | | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන කාර්යාලය | | දිස්ත්‍රික් කාර්යාල | |
| | | | සංචිත | වෙන්කල | සංචිත | වෙන්කල |
| 1 | කැබ් | *37 | 10 | - | 27 | - |
| 2 | කාර් | 19 | 9 | 7 | - | 3 |
| 3 | වෑන් | 03 | 3 | - | - | - |
| 4 | ජීප් | 02 | - | 2 | - | - |
| 5 | ලොරි | 01 | 1 | - | - | - |
| 6 | කෘ කැබ් | 01 | 1 | - | - | - |
| 7 | මෝටර් සයිකල් | **02 | 2 | - | - | - |
| 8 | බස් | 01 | 1 | - | - | - |
| එකතුව | | 66 | 27 | 9 | 27 | 3 |

ඉහත වාහන අතුරින් කැබ් රථ 02ක් හා ජීප් රථ 01ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන ඇත.

පහත වාහන අපහරණය කිරීමට යෝජිත බැවින් ධාවනයෙන් ඉවත් කර ඇත.

* GB - 9487 කැබ් රථය

** UI - 9835 මෝටර් සයිකලය

2019 වර්ෂය අවසානයේදී නව වාහන මිලදී ගැනීමට කටයුතු කර තිබුණද, රජයේ ආයතනවලට නව වාහන මිලදී ගැනීම අත්හිටුවන ලෙසට මුදල් අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් නිකුත් කිරීම නිසා එම කටයුතු සිදු කිරීමට නොහැකි විය. එසේ වුවද වෙනත් රාජ්‍ය ආයතනවල තිබූ අතිරික්ත වාහන, වාහන අවශ්‍යතාව ඇති වෙනත් ආයතන වෙත ලබාදීමට කටයුතු කරන ලද අතර, එහිදි මෙම කොමිෂන් සභාව වෙත වාහන 11 ක් පහත පරිදි ලබා ගැනීමට හැකි විය. මෙම වාහන ලැබීම 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළදී සිදු විය.

බස් රථ - 01

වෑන් රථ - 01

කාර් රථ - 05

කැබ් රථ - 04

## 21.6 ඡන්ද විමසීම සඳහා ලබා දුන් දායකත්වය

රට තුළ පැතිරෙමින් තිබූ Covid-19 තත්ත්වය යටතේ 2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම අනුගමනය කරමින් ඡන්ද විමසීමට අදාලව කරන ලද මූලික සංවිධාන කටයුතු වල, සියළුම ප්‍රවාහන කටයුතු සඳහා අදාල චක්‍රලේඛ නිකුත් කරමින් සම්බන්ධීකරණ කටයුතු හා මෙහෙයවීමේ කටයුතු ආයතන අංශය මගින් සිදු කරන ලදි.මීට අමතරව එකී ඡන්ද විමසීමට අදාලව ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කටයුතු හා සුභසාධන කටයුතු ආයතන අංශයේ දායකත්වයෙන් සිදු කරන ලදි.

## 22. ඉදිකිරීම් හා වත්කම්

### 22.1 ඉදිකිරීම් හා අළුත්වැඩියා

#### 22.1.1 වැය විෂය - 2001

මැතිවරණ මහ ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ලේ සහ ග්ලේන් ආබර් නිල නිවසේ වහල අලුත්වැඩියා කිරීම, තොරතුරු තාක්ෂණ අංශය නවීකරණය කිරිම , ආපන ශාලාව නවීකරණය කිරිම සහ කොමිෂන් සභා කාර්යාලය නවීකරණය කිරීම ඇතුළු මැතිවරණ කොමිෂන් සභා පරිශ්‍රයේ හදිසි හා අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.

ගම්පහ, කළුතර, මාතර, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හදිසි හා අතවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.

මහනුවර, ගාල්ල, වව්නියාව, කුරුණෑගල, රත්නපුර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාස හා මාතලේ, කිලිනොච්චිය, මොණරාගල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවාසවල හදිසි හා අතවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකිරීම.

#### 22.1.2 වැය විෂය - 2104

යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය සඳහා ඉදිවන නව සිව්මහල් ගොඩනැගිල්ලේ පළමු අදියරයේ කටයුතු සිදුකිරීම සහා එහි දෙවනි අදියරයට හා ග්ලේන් ආබර් පෙදෙස නිල නිවාස සංකීර්ණය ඉදිකිරීම සඳහා වූ යෝජනා ජනාධිපති ලේකම්වරයා මඟින් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

## 23. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අළුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

### 23.1 ඡන්ද විමසීම්වලට අදාළව

2020 වර්ෂයේ මාර්තු මස නාමයෝජනා කැඳවීමෙන් අනතුරුව රටේ ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතු කොටගෙන අගොස්තු මස 10 දින පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට සිදුවුණි.

- පාර්ලිමේන්තු මැතිවරණයට අදාලව ලිපිද්‍රව්‍ය හා මුද්‍රිත ආකෘති පත්‍ර ඇතුළු අනෙකුත් භාණ්ඩ, ස්ථාවර භාණ්ඩ සහ ඡන්ද මධ්‍යස්ථාන හා ගණන් කිරීමේ මධ්‍යස්ථාවලට අදාළ වූ භාණ්ඩ නිවැරදි ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් මිලදී ගෙන දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට බෙදාහැරීමේ කටයුතු සාර්ථකව ඉටුකරන ලදි.
- පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ජාතික මැතිවරණ අංශය විසින් රජයේ මුද්‍රණාලය වෙත ලබාදුන් ඇනවුම් පරිදි සියළු ලිපිලේඛන මුද්‍රණය කරවා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ආරක්ෂා සහිතව නියමිත කාලයතුළ බෙදාහැරීමට කටයුතු කරන ලදි.
- පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ඡන්ද දැන්වීම් පත්‍රිකා මුද්‍රණය කිරීමට රු.මිලයන 41.28ක් පමණ වියදම් කරන ලදි.

- පාර්ලිමේන්තු මැතිවරණය සඳහා අපේක්ෂකයින්ගේ වැඩිවීම හේතුවෙන් පසුගිය ජනාධිපතිවරණය සඳහා භාවිතා කරන ලද මාදිලියේ කාඩ්බෝඩ්වලින් සාධන ලද විශේෂ ඡන්ද පෙට්ටි භාවිතා කිරීමට කටයුතු කරන ලදි. ඒ වෙනුවෙන් රු.මිලියන 10ක් පමණ වැය කිරීමට සිදුවිය.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා තාවකාලික දුරකථන සම්බන්ධතාව ලබාගැනීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඒ බව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට දැනුම් දීම සිදුකරන ලදි.
- පාර්ලිමේන්තු මැතිවරණය මුළු රටම කොරෝනා වසංගත රෝගය ව්‍යාප්තවීමේ අවධානම් තත්ත්වයට මුහුණු පා තිබියදී පැවැත්වූ මැතිවරණයකි. ඒ හේතුවෙන් ඡන්ද දායකයින් ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් යොදාගැනීමට සිදුවිය. ඒ සඳහා විවිධ සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීමටත්, අත්සේදුම් දියර, විෂබීජ නාශක දියර, මුව ආවරණ, මුව ආරක්ෂක වැනි ද්‍රව්‍ය මිලදී ගැනීමටත් ඒවා නිලධාරීන් සහ මැතිවරණ කාර්ය මණ්ඩලය වෙත නිවැරදිව බෙදාහැරීමට කටයුතු කර ඇත.

## 23.2 ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමට අදාළ

- වාර්ෂිකව පවත්වනු ලබන ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා සියළුම දිස්ත්‍රික් සඳහා අවශ්‍ය දත්ත සහිත හා දත්ත රහිත බීසී ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදි. බීසී ආකෘති පත්‍ර දත්ත සහිත ලක්ෂ 50 ක් හා දත්ත රහිත බීසී ආකෘති පත්‍ර ලක්ෂ 4 ක් පමණ රජයේ මුද්‍රණාලයෙන් ද දත්ත සහිත ලක්ෂ 11.75ක් පමණ පෞද්ගලික ආයතනය විසින් ද මුද්‍රණය කිරීමෙන් පසුව දිස්ත්‍රික් කාර්යාල විසින් කරන ලද ඉල්ලීම පදනම් කරමින් බෙදාහැරීමට කටයුතු කරන ලදි.
- ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා රු.ලක්ෂ 10ක් වැය කර අවශ්‍ය ලිපිද්‍රව්‍ය සහ ලිපිලේඛන මිලදී ගෙන නිකුත් කිරීමට කටයුතු කර ඇත.

## 23.3 ඡන්ද හිමි නාමලේඛන මුද්‍රණය

- 2019 ඡන්දහිමි නාමලේඛනය මුද්‍රණය කර අවසන් කිරීමෙන් පසුව අදාළ දිස්ත්‍රික් කාර්යාලවලට බෙදාහැරීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා අදාළ මුද්‍රණ ආයතනය වෙත රු. මිලියන 10ක් පමණ ගෙවීම් කරන ලදි. 2020 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ කටයුතු පාර්ලිමේන්තු මැතිවරණ අවසන් වීමත් සමග ආරම්භ කළ අතර ඡන්දහිමි නාමලේඛන මුද්‍රණයෙන් පසුව පරීක්ෂා කර බලා අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට බෙදාහැරීමට නියමිතය.

## 23.4 යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම/අළුත්වැඩියා කිරීම/නඩත්තු කිරීමට අදාළව

- ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අවශ්‍යතාවය සඳහා පරිගණක 30ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 05ක්, ඩීසීපී යන්ත්‍ර 04ක්, ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර 08ක් සහ ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 05ක් ඇතුළු යන්ත්‍ර උපකරණ මිලදී ගෙන නිකුත් කර ඇති අතර මේ සඳහා රු. මිලියන 10.65 ක් වියදම් කරන ලදි.
- ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වායුසමීකරණය කිරීම සඳහා වායුසමීකරණ යන්ත්‍ර 19ක් මිලදී ගෙන සවිකරන ලද අතර ඒ සඳහා රු. මිලියන 4.14 ක් වැය කිරීමට සිදුවිය.

- ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඇති වගකීම් කාලය සම්පූර්ණ වූ පරිගණක, පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර සඳහා අවශ්‍ය අළුත්වැඩියා කටයුතු සිදුකරන ලදි. ඒ සඳහා රු. මිලියන 0.92 ක පමණ මුදල වැයකිරීමට සිදුවිය.
- කාර්යාලවල භාවිතා කරන පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් හා ඩ්‍රම් යුනිට් මිලදී ගැනීමට රු. මිලියන 11.5ක මුදලක් වැය කර ඇත. මෙම වියදම පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු හේතුවෙන් වැඩි වී ඇත.
- QR Code කියවීමේ යන්ත්‍ර 70 ක් ඇතුළුව අනෙකුත් ඉන්වෙන්ට්‍රි අයිතමයන් මිලදී ගැනීම සඳහා රු. ලක්ෂ 78.6ක් පමණ වියදම් දරන ලදි.
- ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාල දුරකථන,අන්තර්ජාල පහසුකම් සමඟ ජාලගත කිරීමට අවශ්‍ය භාණ්ඩ, උපකරණ සහ මෘදුකාංග මිලදී ගෙන සැපයීමට කටයුතු කරන ලදි. ඒ සඳහා රු. මිලියන 4.5ක මුදලක් වැය කර ඇත.
- ප්‍රධාන කාර්යාලය සහ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ඇති පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සහ වායුසමීකරණ යන්ත්‍ර සඳහා සේවා ගිවිසුම් ගතවීමට රු. මිලයන 1.6ක් වැය කරන ලදි.
- ඡන්දවිමසීමේදී අවශ්‍යතාව මත පරිගණක මුද්‍රණ යන්ත්‍ර, ලැප්ටොප් පරිගණක යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර වැනි යන්ත්‍ර උපකරණ කුලී පදනම මත දිස්ත්‍රික් කාර්යාලවලට මෙන්ම ප්‍රධාන කාර්යාලයට ද ලබාදීමට සිදුවිය. එම යන්ත්‍රවලට කුලී වශයෙන් රු. මිලියන 6.7 ක් පමණ ගෙවීමට සිදුවිය.

## 23.5 කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන් සහ කාර්ය මණ්ඩල සඳහා අවශ්‍ය විධායක මේස, පුටු, කැබිනට්, අල්මාරි, රාක්ක, පරිගණක මේස වැනි විවිධ කාර්යාල භාණ්ඩ මිලදී ගෙන ලබාදීමට කටයුතු කරන ලදි. ඒ සඳහා රු. මිලයන 3.6ක් වියදම් කිරීමට සිදුවිය. මැතිවරණ කාලයේදී දිස්ත්‍රික් කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ අවශ්‍යතාවය හා නිර්දේශය පරිදි ප්‍රාදේශිය මට්ටමින් කාර්යාල භාණ්ඩ මිලදී ගැනීමටද අනුමැතිය ලබාදීමට කටයුතු කරන ලදි.

## 23.6 පොදු

- පාර්ලිමේන්තු මැතිවරණය, ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කාර්යාලයේ අනෙකුත් ලිපිද්‍රව්‍ය අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා විශාල ප්‍රමාණයේ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට ද සිදුවිය. ඒ සඳහා රු. මිලියන 157ක පමණ වියදම් කරන ලදි.
- දිස්ත්‍රික් කාර්යාලවල ඇති අළුත්වැඩියා කළයුතු ඡන්ද පෙට්ටි ගෙන්වා ගෙන රජයේ කර්මාන්ත ශාලාවට භාරදී අළුත්වැඩියා කර නැවත එම කාර්යාලවලට ලබාදීම සිදුකළ අතර ඒ සඳහා රුපියල් මිලයනයක් පමණ වියදම් කර ඇත.
- ප්‍රධාන කාර්යාලයේ පානීය ජල අවශ්‍යතාවය සඳහා පානීය ජල මිලදී ගැනීමට රු. ලක්ෂ 4.9 ක් වියදම් කරන ලදි.

- අභ්‍යන්තර දුරකථන සම්බන්ධතාවය හා එහි අවශ්‍ය උපාංග හා අළුත්වැඩියා කටයුතු සඳහා රු. මිලියන 0.16ක් පමණ වියදම් කිරීමට සිදුවිය.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අදාළ ටයර් මිලදී ගැනීමේ කටයුතු ප්‍රාදේශිය මට්ටමින් සිදුකිරීමට අනුමැතිය ලබාදීමේ පදනම මත කටයුතු කරන ලද අතර මැතිවරණ මහලේකම් කාර්යාලයේ වාහන සඳහා අවශ්‍යතාව මත ටයර් මිලදී ගෙන සැපයීමද සාර්ථකව ඉටු කරන ලදි. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් රු. මිලියන 2.5 ක් පමණ වියදම් කරන ලදි.
- ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාලවල පාවිච්චි කළ ඡන්ද පත්‍රිකා හා භාවිතයෙන් ඉවත්කළ කඩදාසි විකිණීමට කටයුතු කරන ලදි. ඒ වෙනුවෙන් රු. මිලියන 7.99 ක පමණ මුදලක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.
- ඡන්දවිමසීමට අදාළ ඡන්ද පත්‍රිකා ඇතුළු ලියවිලි මුද්‍රණය සහ අනෙකුත් ලිපිලේඛන මුද්‍රණ කටයුතු සඳහා 2020 වර්ෂයේදී රජයේ මුද්‍රණාලයට රු. මිලියන 131 ක් පමණ ගෙවීම් කරන ලදි.
- ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂාව, නිරීක්ෂණය සඳහා CCTV පද්ධතිය අලුතෙන් සවිකරන ලදි. ඒ සඳහා රු. මිලයන 2.5ක් වියදම් කරන ලදි.
- ඡන්දදායකයන්ගේ සහ මැතිවරණ නිලධාරීන්ගේ සෞඛ්‍යාරක්ෂාව සඳහා මුව ආවරණ, මුව ආරක්ෂක, අත්ආවරණ, අත් පිරිසිදුකාරක, අත්සේදුම් දියර වැනි ද්‍රව්‍ය මිලදී ගෙන සැපයීමට සිදුවිය. ඒ සඳහා රු. මිලියන 165.9ක මුදල වියදම් දැරීමට සිදුවිය. තවද උෂ්ණත්වමාන 650ක් මිලදීගෙන් නිකුත් කිරීමට සිදුවූ බැවින් ඒ සඳහා රු. ලක්ෂ 13 ක් පමණ වියදම් දරන ලදි.

## 24. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය

තොරතුරු තාක්ෂණ අංශය විසින් නිර්මාණය කර සංවර්ධනය කරනු ලබන “ElectionS” පරිගණක වැඩසටහනේ වැඩි දියුණු කිරීම සිදු කරන ලදි.

### 24.1 2020 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව,

ඡන්දහිමි නාමලේඛනයේ කටයුතු සඳහා බී.සී පත් මුද්‍රණයට අවශ්‍ය ලියාපදිංචි ඡන්දදායකයින්ගේ තොරතුරු ඇතුළත් පරිගණක වැඩසටහනක් සකස් කර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ලබා දීම, බහු ලියාපදිංචි තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය පරිගණක වැඩසටහන සැකසීම, පරිගණක වැඩසටහන මගින් ඡන්ද හිමි නාම ලේඛණ ප්‍රතිශෝධනයේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ලබා දීම, ඡන්ද හිමි නාම ලේඛණ ප්‍රතිශෝධනයේදී ඡන්ද ප්‍රදේශ නිලධාරීන් අතින් සිදුවන පරිගණක වැඩසටහනෙහි දෝෂ නිවැරදි කිරීම හා පැරණි ඡන්දහිමි නාමලේඛන වල ඇතිවී තිබූ දෝෂ සකස් කර නිවැරදි කිරීම, ඡන්ද හිමි නාමලේඛණ උපුටන ලබා ගැනීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලීය නිලධාරීන්ට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම, 2019 ඡන්ද හිමි නාමලේඛණ ප්‍රතිශෝධනයේදී පරිගණක ගත කරන ලද වයස අවුරුදු 18 සම්පූර්ණ නොවූ පුද්ගලයන්ගේ දත්ත මගින් 2020.05.31 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ ලැයිස්තුව ලබා ගැනීමේ පරිගණක වැඩසටහන සැකසීම හා අවශ්‍ය මග පෙන්වීම් සිදු කිරීම, එයට අමතරව ඡන්දදායකයින් මාර්ගගතව ලියාපදිංචි කිරීමේ පරිගණක වැඩසටහන වැඩිදියුණු කෙරෙමින් පවතී.

### 24.2 ඡන්දහිමි නාමලේඛන පරීක්ෂාව සඳහා ඊ–සේවාව ලබාදීමට අදාළව,

- පාසල්, කළාප අධ්‍යාපන කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නිලධාරීන් සඳහා ප්‍රවර්තන වර්ෂයේ හා පැරණි වර්ෂ වල නාමලේඛන පරීක්ෂාවට ඊ-සේවාව ලබාදීම.

- තැපැල් ඡන්ද අයදුම්පත් පිරවීමට තොරතුරු ලබා දීම සඳහා රජයේ කාර්යාල වල නිලධාරීන් සඳහා ඊ-සේවා පහසුකම් ලබා දීම.
- ඊ සේවා භාවිතයේදී පාසල් හා කළාප අධ්‍යාපන කාර්යාල නිලධාරීන් හට අවශ්‍ය සහාය ලබා දීම හා මතුවන ගැටළු විසඳා දීම.
- ග්‍රාම නිලධාරීන් සඳහා ඊ සේවාව මගින් ඡන්ද හිමි නාමලේඛණයේ කටයුතු සිදුකිරීම සඳහා වන පරිගණක වැඩසටහන සැකසීම. (තවමත් සිදු කෙරෙමින් පවතී)
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව යනාදියට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා කටයුතු සම්පාදනය කිරීම.

## 24.3 පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාළව,

මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම් කිරීමේ පරිගණක වැඩසටහනක් නිර්මාණය කර භාවිතා කිරීම, තැපැල් ජන්ද සහතික කිරීමේ නිලධාරීන් පරිගණක ගත කිරීමේ වැඩසටහන වැඩිදියුණු කිරීම, තැපැල් ජන්ද දායකයින්ගේ ලිපිනයන් සහිත ලේඛනයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහනක් සකස් කිරීම, අවතැන් වූ ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ පරිගණක වැඩසටහනක් සකස් කිරීම, පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ලබා ගැනීම සඳහා පරිගණක වැඩසටහනක් සකස් කිරීම, නිලධාරී සංගණනයට අදාළ දත්ත පත්‍රවල තොරතුරු (ARO, SPO, CCO හා අනිකුත් කාර්ය මණ්ඩලය) පරිගණක ගත කිරීම සඳහා සකසන ලද වැඩසටහන පරිශීලක පහසුව සඳහා වැඩිදියුණු කිරීම

## 24.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් නිර්මාණය කර සංවර්ධනය කරනු ලබන අනෙකුත් තොරතුරු තාක්ෂණ යෙදුම්

- ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ගේ නිවාඩු ඉල්ලුම්පත් **online** ක්‍රමයට ඇතුලත් කිරීම,අනුමත කිරීම යනාදිය ඉටුකිරීම සඳහා තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.
- දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල ගිණුම් සාරාංශ ඇතුලත් කිරීම සඳහා සකස් කල පරිගණක වැඩසටහන (Expenditure Management System) වැඩිදියුණු කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ සහ සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල භාවිතා කරන පරිගණක හා පරිගණක උපාංග තොරතුරු ඇතුලත් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම.
- මැතිවරණ කොමිෂන් සභාවේ රථවාහන කළමණාකරනය සඳහා පරිගණක වැඩසටහනක් සකස් කිරීම. (තවමත් සිදු කෙරෙමින් පවතී)
- මැතිවරණ කොමිෂන් සභාවේ තැපැල කළමණාකරණ සඳහා පරිගණක වැඩසටහක් සකස් කිරීම. (තවමත් සිදු කෙරෙමින් පවතී)
- ප්‍රධාන කාර්යාලයේ ශ්‍රවණාගාරයන් වෙන් කර ගැනීමට හා නුවරඑළිය නිවාඩු නිකේතනය වෙන් කරගැනීම සඳහා පරිගණක වැඩසටහන් සකස් කිරීම. (තවමත් සිදු කෙරෙමින් පවතී)
- කොවිඩ් 19 වසංගතය ඉදිරියේදී තවදුරටත් ව්‍යාප්ත වී දිස්ත්‍රික් කාර්යාල වලට පැමිණ කටයුතු කිරීමට නොහැකි වුවහොත් ආරක්ෂාකාරීව දත්ත පද්ධතිය පරිහරණය කිරීම සඳහා ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන්ට නිවසේ සිට රාජකාරි කිරීමට අවශ්‍ය තාක්ෂණික පහසුකම් ලබා දීමට අදාළ කටයුතු සිදු කිරීම.

## 24.5 පද්ධති නඩත්තු කටයුතු

ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සහ හම්බන්තොට මැතිවරණ කාර්යාලයේ පිහිටුවා ඇති දත්ත ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු ඉටුකිරීම සහ අදාළ නඩත්තු කටයුතු එම ආයතන මගින් ඉටු කරවා ගැනීම, මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංශ ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල, වී.පී.එන්. ජාලය සහ **ADSL** අන්තර්ජාල පද්ධතියේ නඩත්තු කටයුතු ඉටු කිරීම, **Video Conference** පද්ධතිය යනාදී තොරතුරු උප පද්ධතිවල නඩත්තු කටයුතු කිරීම, අදාල ගිවිසුම් යාවත්කාලීනව

පවත්වා ගනිමින් මැතිවරණ කොමිසම සතු සම්පූර්ණ තොරතුරු පද්ධතිය කාර්යක්ෂමව හා සඵලදායීව පවත්වා ගනිමින් නිලධාරීන්ට හා අනිකුත් පාර්ශවකරුවන්ට අවශ්‍ය සේවය ලබා දීම.

### 24.5.1 මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය/ සමාජ මාධ්‍ය ජාල/ ඊ මේල්/ පද්ධතීන් හා සම්බන්ධ කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ නිලවෙබ් අඩවිය සම්පූර්ණයෙන්ම අළුතින් නිර්මාණය කිරීම හා එය භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වාගෙන යෑම. එයට අමතරව නිල ෆේස් බුක් පිටුව ඇතුළු සමාජ මාධ්‍ය ජාලා පද්ධති යාවත්කාලීන කිරීම, කාර්යාලයීය ඊ මේල් සේවාව පවත්වාගෙන යාම,වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය ජාලා හරහා ලැබෙන මහජන පැමිණිලි නියමිත පාර්ශව වෙත යොමු කර ඒ සඳහා පිළිතුරු ලබා දීම.

## 24.6 2020.08.05 වන දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ තොරතුරු තාක්ෂණ අංශයේ කටයුතු සිදු කිරීම.

### 24.6.1 නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා හා තැපැල් ඡන්ද කටයුතු

නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ගොනු පරීක්ෂාව සහ මුද්‍රණය සඳහා පිළියෙල කර ප්‍රසම්පාදන අංශයට ලබාදීම, තැපැල් ඡන්ද අයදුම්පත් පිරවීමට තොරතුරු ලබා දීම සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය හා සිවිල් බලකා සඳහා පළාත් මට්ටමින් සකස් කරන ලද සංයුක්ත තැටි ලබාදීම, තැපැල් ඡන්ද පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් දිස්ත්‍රික්ක මැතිවරණ කාර්යාල වලට ලබා දීම, නිලධාරී සංගණනයට අදාළ දත්ත පත්‍රවල තොරතුරු පරිගණක ගත කිරීම සඳහා සකසන ලද වැඩසටහන වැඩිදියුණු කිරීම හා භාවිතය සඳහා සහය ලබාදීම, තැපැල් ඡන්ද ලේඛනය හා තැපැල් ඡන්ද ලිපිනයන් සහිත ලේඛන සකස් කිරීම, මිය ගිය හා විදේශගත ඡන්දහිමියන්ගේ ලේඛනය සකස් කිරීම, ඡන්ද මධ්‍යස්ථාන වෙත යැවීම සඳහා බහු ලියාපදිංචි තොරතුරු ඡන්දහිමි නාමලේඛනයේ සලකුණු කිරීමේ කටයුතු සිදු කිරීම, තැපැල් ඡන්ද "ඩී" හා "ඒ" කවර වල මුද්‍රණය කෙරෙන ස්ටිකර් සඳහා අවශ්‍ය දත්ත සකස් කර ලබා දීම,

### 24.6.2 ප්‍රතිඵල සකස් කිරීම හා මාධ්‍ය වෙත නිකුත් කිරීම

තොරතුරු තාක්ෂණ අංශයේ අධීක්ෂණය යටතේ ලංකා මෘදුකාංග පදනම මගින් නිර්මාණය කරන ලද පරිගණක වැඩසටහන පසුගිය මැතිවරණ ප්‍රතිඵල හෝ පරීක්ෂණ මට්ටමේ දත්ත යොදා දිස්ත්‍රික් සියල්ලම සම්බන්ධ කර පරීක්ෂා කිරීම හා අදාළ නිලධාරීන් පුහුණු කිරීම, සහතික කළ මැතිවරණ ප්‍රතිඵල විකාශන අයිතිය මැතිවරණ කොමිෂන් සභාවෙන් ලබාගත් මාධ්‍ය ආයතන හා විද්‍යුත් මාධ්‍ය වෙත එසැනින් ලබාදීමේ ක්‍රියාවලිය සිදුකිරීම, එම ප්‍රතිඵල පද්ධතියෙහි හදිසි බිඳවැටීමක් සිදු වුවහොත් අඛණ්ඩව ප්‍රතිඵල මාධ්‍ය වෙත ලබාදීමට අවශ්‍ය අමතර පරිගණක වැඩසටහන (Backup System) වැඩිදියුණු කිරීම, දිස්ත්‍රික් ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථානයේ භාවිතය සඳහා අවශ්‍ය ප්‍රතිඵල සැකසුම් පද්ධතිය ලබා දීම සහ අදාළ නිලධාරීන් පුහුණු කිරීම, දිස්ත්‍රික් ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථාන වල හා ප්‍රධාන කාර්යාලයේ ප්‍රතිඵල සැකසුම් අංශයේ කටයුතු සඳහා යොදවා ගත් තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂවරුන් හා තොරතුරු තාක්ෂණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, දිස්ත්‍රික් මැතිවරණ ප්‍රතිඵල සටහන් පරිලෝකනය (Scan) කර තොරතුරු තාක්ෂණ අංශය වෙත එම අවස්ථාවේම ලබා ගෙන අමතර පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම, ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිගෙන් ඡන්දය භාවිත කිරීමේ ප්‍රගතිය ලබාගැනීම සඳහා මධ්‍යගත ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණ කෙටි පණිවුඩ සේවාව වැඩිදියුණු කිරීම, ඡන්ද මධ්‍යස්ථාන වල තත්වය හා ප්‍රතිඵල නිකුත් කිරීමේ තත්වය පිළිබඳ ඩිජිටල් ප්‍රදර්ශක පුවරු (Dash board) සඳහා පරිගණක වැඩසටහනක් සකස් කිරීම සහ එය දිස්ත්‍රික් ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථාන වලත් ප්‍රධාන කාර්යාලයේත් ප්‍රදර්ශනය කිරීම.

**24.6.3 දේශපාලන පක්ෂ සහ තරඟ කරනු ලබන ස්වාධීන කණ්ඩායම් සඳහා අදාළ කටයුතු**

- තැපැල් ඡන්ද දායකයන්ගේ ලිපිනයන් සහිත ලැයිස්තුවක් සකස් කර තරඟ කරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වලට ලබා දීම.
- ඡන්දහිමි නාමලේඛන සහ ඡන්ද දායකයින්ගේ ලිපිනයන් සහිත සංයුක්ත තැටි සකස් කිරීම හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලබා දීම.
- 2019 ඡන්ද හිමි නාමලේඛන ඇතුළත් සංයුක්ත තැටි සකස් කර, අනුමැතිය ලැබෙන පරිදි විවිධ පාර්ශව වෙත අලෙවි කිරීම/ නොමිලයේ ලබාදීම සඳහා කටයුතු කිරීම.
- පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ සියළුම ගැසට්, මාධ්‍ය නිවේදන හා මැතිවරණ ප්‍රතිඵල නිල වෙබ් අඩවියේ භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීන කිරීම.
- අවශ්‍ය තොරතුරු පක්ෂ ලේකම්වරුන් සඳහා ඊ මේල් මඟින් ලබා දීම.

**24.6.4 නියමු ව්‍යාපෘති (**Pilot Projects)

ඡන්ද මධ්‍යස්ථාන වල නිකුත් කිරීම් / භාරගැනීම් කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහනක් සකස් කර නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ භාවිතා කිරීම. (මැද කොළඹ, රත්මලාන හා මොරටුව ඡන්ද ප්‍රදේශ), විද්‍යුත් ඡන්ද හිමි නාමලේඛණය **(e Poll Book)** නියමු ව්‍යාපෘතියක් ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 05ක භාවිතා කිරීම. (බටහිර කොළඹ හා කඩුවෙල ඡන්ද ප්‍රදේශ)

දුරකථන සංඥා නොමැති ඡන්ද මධ්‍යස්ථාන සඳහා සන්නිවේදන පහසුකම් ලබා ගැනීමට වාර්තාවක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ලබා දීම, 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී මධ්‍යගත ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණ පද්ධතියෙහි කෙටි පණිවුඩ සේවාව මගින් ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණය පිළිබඳ වැඩසටහනේදී ලද දත්ත ඇසුරෙන් වාර්තාවක් සැකසීම.

මධ්‍යගත ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණ පද්ධතියෙහි කෙටි පණිවුඩ සේවාව මගින් ඡන්ද මධ්‍යස්ථාන නිරීක්ෂණය පිළිබඳ 2020 පාර්ලිමේන්තු මැතිවරණයේදී එය භාවිතා කල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල නිලධාරීන් ගේ හා මෙහෙයුම් මැදිරියේ නිලධාරීන්ගේ අත්දැකීම් අදහස් යෝජනා හා භාවිතයේ මතුවූ ගැටළු පිළිබඳ තොරතුරු එක් රැස් කොට වාර්තාගත කිරිම හා ඉදිරි කටයුතු සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කිරිම.

## 25. මූල්‍ය හා විගණන තොරතුරු

2020.08.05 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2020.12.31 දිනට රුපියල් මිලියන 5700.7ක් වැය වී ඇත. එදිනට එම ඡන්ද විමසීමේ නොපියවූ බිල්පත්/වවුචර්වල වටිනාකම රුපියල් මිලියන 23ක් පමණ තවදුරටත් බැරකම් වශයෙන් ගෙවීමට ඇති අතර ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණය සඳහා වැය වෙතැයි අපේක්ෂිත වියදම රුපියල් මිලියන 5724ක් පමණ වනු ඇත.

2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරිම සඳහා රුපියල් මිලියන 163.9 ක් පමණ වැය වී ඇති අතර නාමලේඛනය මුද්‍රණය කිරීම සඳහා වැය වෙතැයි අපේක්ෂිත මුදල වූ රුපියල් මිලියන 08 ද එකතු වූ විට වියදම රුපියල් මිලියන 172 ක් පමණ වේ. 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීමේ වියදම වූ රුපියල් මිලියන 146.3ක වියදම සමඟ සසඳා බලනවිට මෙම වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පිළියෙල කිරීමේ වියදම රුපියල් මිලියන 26 ක පමණ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. ඡන්ද හිමියන් ගණන් ගන්නා නිලධරයන්ගේ දීමනාව වැඩිකිරීම මෙම වියදම් වැඩිවීමට බලපා ඇත.

2020 වර්ෂයේ පුනරාවර්තන වියදම රුපියල් මිලියන 7300.8ක් වූ අතර 2019 වර්ෂයේදී එම වියදම රුපියල් මිලියන 3989.4ක් විය. සමස්ථයක් වශයෙන් පසුගිය වර්ෂය සමඟ සසඳා බලනවිට පුනරාවර්තන වියදමේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ. කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ,සෞඛ්‍ය ආරක්ෂණ උපදෙස් වලට අනුකූලව පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම නිසා පුනරාවර්තන වියදම් වැඩි වීමට බලපා ඇත.

සෑම වර්ෂයකම ජුනි 01 දින යෙදී ඇති ඡන්ද හිමියන්ගේ දිනය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඇතුළු දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රුපියල් මිලියන 13.71 ක් වැය කර ඇත.

2020 වර්ෂයේ මූලධන වියදම රුපියල් මිලියන 71.2ක් වූ අතර 2019 වර්ෂය හා සසඳා බලන විට එම වියදම රුපියල් මිලියන 53.1ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. කොවිඩ් වසංගත තත්වය හමුවේ මිලදී ගැනීම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සීමාවීම මෙලෙස මූලධන වියදම් අඩුවීමට බලපා ඇත.

මෙම වර්ෂයේදී ආපදා ණය අත්තිකාරම් ඉල්ලුම් කළ නිලධාරීන්/ සේවකයින් 136 දෙනෙකුගෙන් නිලධාරීන්/ සේවකයින් 117 දෙනෙකු වෙනුවෙන් රුපියල් මිලියන 15.9 ක ණය අත්තිකාරම් ලබාදී ඇත. පසුගිය වර්ෂය හා සසඳා බලන විට මෙම වර්ෂයේ ලබාදී ඇති ණය මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 11.35 ක අඩු වීමක් පෙන්නුම් කෙරේ.

2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායම රුපියල් මිලියන 2.8කි. 2019 වර්ෂයේ මෙම අදායම රුපියල් මිලියන 5.9ක් වූ අතර එම වර්ෂය සමඟ සසඳා බලනවිට උපුටන නිකුත් කිරීමෙන් ලද ආදායම රුපියල් මිලියන 3.2කින් පහළගොස් ඇත. කොරෝනා වසංගත තත්වය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සහ ඡන්ද හිමි නාමලේඛන උපුටන නිකුත් කිරීම සීමාවීම ඊට බලපා ඇත.

ඡන්දහිමි නාමලේඛනය පොත් වශයෙන් සකස් කිරීම සීමා කර සංයුක්ත තැටි වශයෙන් පිළියෙල කරනු ලබන අතර ඒවා අලෙවි කිරීමෙන් මෙම වර්ෂයේ උපයාගත් ආදායම රුපියල් මිලියන 3.4කි. මෙම වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර තිබූ බැවින් දේශපාලන පක්ෂවලට සංයුක්ත තැටි අලෙවි කිරීම නිසා මෙම ආදායම පසුගිය වර්ෂයේ ආදායම වූ රුපියල් මිලියන 3.2 හා සසඳා බලන විට සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරේ.

කොමිෂන් සභාවේ කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා නිලධාරීන්/ සේවයකයින් පුහුණු කිරීමේ කටයුතු වෙනුවෙන් දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා රුපියල් මිලියන 3.4ක් වැයකොට ඇත. 2019 වර්ෂය හා සසඳා බලන විට රුපියල් මිලියන 0.6කට ආසන්න ප්‍රමාණයකින් මෙම වියදම වැඩි වී ඇත.

2020 වර්ෂය තුළ දී අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන කාර්යයන් 12ක් සිදු කරන ලද අතර විගණන වාර්තා 12ක් ඉදිරිපත් කර ඇත. ඒවා සියල්ලටම පිළිතුරු එවා තිබුණි. එසේම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත.

2020 වර්ෂය වෙනුවෙන් විවිධ විෂයයන් යටතේ 2020.12.31 දින දක්වා විගණන විමසුම් 17ක් ඉදිරිපත් කර ඇත. ඉන් විමසුම් 13ක් 2019 ගිණුම් වර්ෂයට අදාළ වන අතර විමසුම් 04ක් 2020 ගිණුම් වර්ෂයට අදාළ වේ. එම විගණන විමසුම් වලින් එකකට හැර අනෙකුත් ඒවා සඳහා නියමිත කාල සීමා තුළ පිළිතුරු සැපයීමට කටයුතු කරන ඇත.

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | **-** | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 5,460,888,000 | 2,988,720,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 15,618,686 | 7,371,282 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 23,108,068 | 28,454,712 | ඒසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 53,187,629 | 95,536,927 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **5,552,802,383** | 3,120,082,921 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **5,552,802,383** | 3,120,082,921 | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | - | ඒසීඒ-2(ii) |
| - | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 503,595,835 | 446,026,291 | ඒසීඒ-2(ii) |
| - | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 7,296,630,204 | 3,533,797,651 | ඒසීඒ-2(ii) |
| - | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 4,209,529 | - | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | 4,225,560 | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| - | **මුළු පුනරාවර්තන වියදම් (ඇ)** | | **7,804,435,568** | 3,984,049,502 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මූලධන වියදම් | | | | |
| - | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 26,649,087 | 28,185,581 | ඒසීඒ-2(ii) |
| | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 41,199,528 | 93,285,901 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| - | හැකියා වර්ධනය | **14** | 3,434,479 | 2,735,788 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| - | **මුළු මූලධන වියදම් (ඉ)** | | **71,283,094** | 124,207,269 | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **37,925,293** | 102,166,231 | |
| | **තැන්පතු ගෙවීම්** | | 18,311,539 | 63,057,238 | **ඒසීඒ-4** |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 19,613,754 | 39,108,993 | **ඒසීඒ-5** |
| | **මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)** | | 7,913,643,955 | 4,210,423,001 | |
| - | **..........දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | (2,360,841,571) | (1,090,340,080) | |

## 2020 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,978,748,281 | 1,970,538,536 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 103,012,625 | 106,506,939 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | 2,081,760,906 | 2,077,045,475 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 97,145,044 | 97,946,505 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,978,748,281 | 1,970,538,536 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 5,867,581 | 8,560,434 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | 2,081,760,906 | 2,077,045,475 |

පිටු අංක...01....සිට ..36... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...37... සිට ..46... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.......................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනිෂ් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය

.......................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය

.......................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2021.02.25
ජී. ඒ. වීරසේන
ප්‍රධාන මූල්‍ය නිලධාරි (වැ.බ.)
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය

## 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | තතය 2020 රු. | 2019 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | 33,613,763 | 32,208,984 |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 897,558 | 734,943 |
| අග්‍රිම ලැබීම් | 5,460,888,000 | 2,988,720,000 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **5,495,399,321** | 3,021,663,927 |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 5,433,751,913 | 2,878,151,114 |
| සහනාධාර සහ මාරුකිරීම් | - | - |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 215,718 | 4,640,000 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **5,433,967,631** | **2,882,791,114** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **61,431,690** | **138,872,813** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | 2,838,397 | 3,259,646 |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 771,150 | 808,189 |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 14,474,555 | 18,575,884 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **18,084,102** | **22,643,719** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 68,983,765 | 124,207,269 |
| අත්තිකාරම් ගෙවීම් | 15,890,044 | 32,624,896 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **84,873,809** | **156,832,165** |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(66,789,707)** | **(134,188,446)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඈ) + (ඊ)** | **(5,358,017)** | **4,684,367** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 15,233,372 | 6,757,059 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **15,233,372** | **6,757,059** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 9,875,355 | 10,168,118 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **9,875,355** | **10,168,118** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **5,358,017** | **(3,411,059)** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **-** | **8,095,425** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

## අක්මුදල් ගැලපුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| උපාධිධාරි දීමනා | 215,718 | දුම්රිය දෙපාර්තමේන්තුව | 466,895 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය විෂය යටතේ ගෙවීම් | 1,446,773 | මැතිවරණ කටයුතු වෙනුවෙන් වෙනත් දෙපාර්තමේන්තු විසින් කරන ලද හර කිරීම් වල එකතුව | 2,358,937,869 |
| වෙනත් දෙපාර්තමේන්තු විසින් අත්තිකාරම් ගිණුමට කරන ලද බැර | 2,688,902 | ගොඩනැගිලි අළුත් වැඩියා වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දරන ලද වියදම් | 2,064,490 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය | 2,360,841,571 | වෙනත් දෙපාර්තමේන්තු වලින් අත්තිකාරම් ගිණුමට කරන ලද හර කිරීම් | 32,397 |
| | | වෙනත් දෙපාර්තමේන්තු වල අත්තිකාරම් ගිණුම් වලට කරන ලද බැර කිරීම් | 3,691,313 |
| | 2,365,192,964 | | 2,365,192,964 |

## 26. මූල්‍ය ප්‍රකාශ සටහන්

### 26.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව රු. | අවසන් ඇස්තමේන්තුව රු. | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තු වේ ලෙස % |
| 20.02.02.99 | පොලිය අනෙකුත් - | මිලියන 4 | මිලියන 4 | මිලියන 3.8 | 95% |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් | මිලියන 0.05 | මිලියන 0.05 | මිලියන 0.05 | 100% |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - ලැබීම් අනෙකුත් | මිලියන 13.50 | මිලියන 12 | මිලියන 28* | 100% |
| 20.02.01.01 | නිල නිවාස කුලී | මිලියන 1.50 | මිලියන 1.50 | මිලියන 1.2 | 80% |
| 20.04.01.00 | වැන්දඹු අනත්දරු | මිලියන 19 | මිලියන 19 | මිලියන 19 | 100% |
| 20.06.02.02 | ප්‍රාග්ධන විකුණුම් (අනෙකුත්) | මිලියන 1 | මිලියන 1 | මිලියන 0.08 | 80% |

*මේ තුළ ඇප තැන්පත් රජයේ ආදායමට ගැනීම රුපියල් මිලියන 16 ක් ඇතුළත්ය.

**26.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන රු. | අවසාන ප්‍රතිපාදනය රු. | | |
| පුනරාවර්තන | 9,664,150 | 9,648,050 | 7,300,839 | 76% |
| ප්‍රාග්ධන | 64,000 | 80,100 | 71,283 | 89% |

**26.3 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | | 178 | 178 | 178 | 100% |
| 02 | රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන ආයතන | | 37 | 37 | 37 | 100% |
| 03 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | 1446 | 1446 | 1446 | 100% |

**26.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | දිනට 31.12.2020 තත්ත්ව මූල්‍ය වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | රු.251,360 | රු.251,360 | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | රු.594,264 | රු.594,264 | - | 100% |
| 9153 | ඉඩම් | රු.1,091,916 | රු.1,091,916 | - | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | රු.41,208 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

**26.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව**

මැතිවරණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව **ඇමුණුම 39** ලෙස යා කර ඇත.

**26.6 කාර්ය සාධන දර්ශකය**

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් නිමැවුමලෙස තත්‍ය (%) | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| | | 75% | |

**26.6.1. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**26.6.2. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

අදාළ නොවේ.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ | | | |

**26.6.3.** **තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

අදාළ නොවේ.

**26.7.** **මානව සම්පත් පැතිකඩ**

**26.7.1.** **සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 57 | 51 | 09<br>03** } 06 |
| තෘතීයික | 21 | 16 | 05 |
| ද්විතියික | 485 | 448 | 37 |
| ප්‍රාථමික | 225 | 211 | 14 |

**26.7.2** **මානව සම්පත් සංවර්ධනය**

**2020 වර්ෂය අනුව**

- 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| **මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්** | | | | | | |
| ඡන්ද මධ්‍යස්ථාන ගූගල් සිතියම්ගත කිරීම (Google Mapping) පිළිබඳ වැඩමුළුව | 53 | 2020.01.29 සිට 2020.01.30 | රු. 313,995.00 | | ඉදිරි ඡන්ද විමසීමකදී ඡන්ද පොළ සිතියම්ගත කිරීම | 100 % |
| Project proposal writing skills | 01 | 2020.02.13 හා 2020.02.14 | රු. 13,000.00 | | ව්‍යාපෘතිය සඳහා වාර්තා සකස් කිරීමට | 100 % |
| Diploma in Diplomacy & World affairs | 01 | 2020.02.15 | රු. 30,600.00 | | විදේශීය පාර්ශවයන් සමඟ ක්‍රියා කිරීම | 100 % |
| පශ්චාත් උපාධි පාඨමාලා | 08 | 2020.03.31 සිට එක් වසරක් සඳහා | රු. 395,000.00 | | | 50% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Diploma in Auditing | 02 | 2020.09.27 හා 28 | රු. 200,000.00 | | රජයේ විගණන ක්‍රියාවලිය | 100% |
| Diploma in Public Procument | 01 | 2020.09.10 | රු. 120,000.00 | | රජයේ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය | 100% |
| | | | | | | |
| **රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරී හා අනෙකුත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්** | | | | | | |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ භාණ්ඩ අපහරණය | 02 | 2020.02.19 හා 2020.02.20 | රු. 17,000.00 | | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අදාළ කටයුතු | 100 % |
| රජයේ දේපළ පිළිබඳ පුහුණු වැඩමුළුව | 01 | 2020.09.10 | රු. 7,000.00 | | | 100 % |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුව | 25 | 2020.12.21 | රු. 52,000.00 | | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා | 100 % |
| **පොදු වැඩමුළු** | | | | | | |
| ගිණුම්කරණ මෘදුකාංග පුහුණුව | 57 | 2020.01.19 සිට 2020.01.21 | රු. 170,440.00 | | ගිණුම් කටයුතු හා පොදු කටයුතු පුහුණුව | 100% |
| මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්ම පිළිබඳ පුහුණුව | 56 | 2020.02.27 | රු. 13,700,000.00 | | උපාය මාර්ගික සැලැස්ම | 100% |

## 26.8. අනුකූලතා වාර්තාව

| අංකය | අදාල කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් නියමිත / දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | - | - |
| **2** | **පොත්පත් ලේඛන නඩත්තු කිරීම(445.රෙ.මු)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 3 | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (135.රෙ.මු)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවත් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | පිළිතුරු ලබාදෙන ලෙස දැනුම්වත් කර තිබේ | මේ පිළිබඳ විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කර කඩිනමින් පිළිතුරු ලබාගැනීම අපේක්ෂා කෙරේ. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) ඉ උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධරයෙකු පත්කර එම නිලධරයා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂනයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | - | - |
| 12 | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පදිරි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| 15 | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල නොවේ | - | ක්‍රියාකරමින් පවතී |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය කට නොඅඩු 12 පුහුණු අවස්ථාවක් ඉහත සඳහන්මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

**27. සමාප්තිය**

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විධි විධාන අනුව, මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය වීමෙන් පසු එතෙක් පැවති මූලික අරමුණ වූ ඡන්ද හිමි නාමලේඛන සකස් කිරීම හා ඡන්ද විමසීම් පැවැත්වීමට පමණක් සීමා නොවී සිව් අවුරුදු උපාය මාර්ගික සැලැස්මට අනුව **"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්"** යන පුළුල් දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙවර ප්‍රකාශයෙන් දක්වා ඇති ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියලුම පාර්ශව දැනුවත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලතාවයෙන් යුතුව මෙහෙයවීමේ දැඩි අභියෝගාත්මක වගකීම නිවැරදිව මෙහෙයවීම වර්තමානයේදී කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයක් වී තිබෙන අතර 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමඟ ඉහත කාර්යය තවදුරටත් සාර්ථකව ඉටුකරමින් 2020 වර්ෂයේදී මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරුණු කාර්යයය සහ කර්තව්‍ය සාර්ථකව ඉටු කිරීම තුළ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධනය අත්පත් කර ඇති බව සතුටින් සඳහන් කරමු.

මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත,
රාජගිරිය.
2021.06.29 දින දීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2159/40 - 2020 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2020.01.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 1 - කොළඹ***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඒ. එස්. සේනාරත්න,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 1 - කොළඹ.

2020 ජනවාරි මස 24 වැනි දින,
කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/1

---

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 2 - ගම්පහ***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. ජේ. එස්. මාධව,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක 2 - ගම්පහ.

2020 ජනවාරි මස 24 වැනි දින,
ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/2

1A - G 31860 — 57 (2020/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 3 - කළුතර***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක. 3 - කළුතර.

2020 ජනවාරි මස 24 වැනි දින,
කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/3

---

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 4 - මහනුවර***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. ඒ. සී. එන්. තලංගම,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක. 4 - මහනුවර.

2020 ජනවාරි මස 24 වැනි දින,
මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/4

---

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 5 - මාතලේ***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කුමරිනී ප්‍රතාපසිංහ,
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,
මැතිවරණ කොට්ඨාස අංක. 5 - මාතලේ.

2020 ජනවාරි මස 24 වැනි දින,
මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/5

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 6 - නුවරඑළිය***

ඉහත සඳහන් මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්දහිමි නාමලේඛන සහතික කර ඇති බවත්, එම නාමලේඛන කාර්යාල වේලාවන්හි දී, පරීක්ෂා කර බැලීම පිණිස නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ තබා ඇති බවත්, 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ, 20(1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. එස්. පතිරණ,<br>
සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී,<br>
මැතිවරණ කොට්ඨාස අංක. 6 - නුවරඑළිය.

2020 ජනවාරි මස 24 වැනි දින,<br>
නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

113/6

---

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත**

2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

***මැතිවරණ කොට්ඨාස අංක : 7 - ගාල්ල***

|---|---|---|---|---|---|---|---|---|
| කැගල්ල දිස්ත්‍රික්කය | | | | | | | | |
| මාවනැල්ල ප්‍රාදේශීය සභාව | | මුහන්දිරම් රාලලාගේ ධම්මිකා උදයංගනී පුෂ්පකුමාරි | සභික | එ.ජ.නි.ස. | පක්ෂ සාමාජිකත්වය අහිමි වීම | 2020.02.25 | අබයරත්න හේරත් මුදියන්සේලාගේ ශ්‍රියානි සුමිත්‍ර කුමාරිහාමි අබයරත්න | 2164/24 2020.02.26 |
| මාවනැල්ල ප්‍රාදේශීය සභාව | | කරපෙන් මහආරච්චිලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර | සභික | එ.ජ.නි.ස. | පක්ෂ සාමාජිකත්වය අහිමි වීම | 2020.01.01 | මුහම්මදු රාෆික් මුහම්මදු නව්සාද් | 2156/23 2020.01.02 |
| කැගල්ල ප්‍රාදේශීය සභාව | | මොහොම්මඩ් ඉම්ටියාස් කාදර් | සභික | ඒ.ජ.නි.ස. | මියයාම | 2020.02.10 | හපන් පේඩිගේ නිෂාල් සමීර තිලකරත්න | 2162/23 2020.02.10 |
| රඹුක්කන ප්‍රාදේශීය සභාව | 02-හේවාදිවෙල | පෙරුම්බඩගේ මංජුල බෝගහවත්ත | සභික | එ.ජා.ප. | ඉල්ලා අස්වීම | 2020.09.07 | හේරත් ගෙදර ලයනල් සරත් කුමාර | 2192/5 2020.09.07 |
| වරකාපොල ප්‍රාදේශීය සභාව | 23-පහල ලෙනගල | සමරසිංහගේ සේන සමරසිංහ | සභික | ශ්‍රී.ලං.පො.පෙ. | මියයාම | 2020.11.06 | අගම්පොඩිගේ රුවනි තරංගා විමර්ශනි | 2201/7 2020.11.10 |
| දැරණියගල ප්‍රාදේශීය සභාව | | නානාවිතාරමලාගේ මාලනී නන්දා හාමිනේ | සභික | එ.ජා.ප. | ඉල්ලා අස්වීම | 2020.10.05 | මඩප්පුලි ආරච්චිලාගේ උෂානි නිතින් ශ්‍රී තාරකා ප්‍රනාන්දු | 2196/45 2020.10.08 |
| රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව | 03-ලෙවන්ගම | ලොකුහෙලපිටියගේ සුදත් මංජුල | සභික | ශ්‍රී.ලං.පො.පෙ. | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම | 2020.11.27 | හල්ගොල්ලන්ගේ නයනජිත් පුෂ්පකුමාර | 2204/21 2020.12.03 |
| රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව | | ලොකුහෙලපිටියගේ සුදත් මංජුල | සභාපති | ශ්‍රී.ලං.පො.පෙ. | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම | 2020.11.18 | නාරංගොඩ රාලලාගේ මංජුල ප්‍රියශාන්ත නවරත්න | 2202/16 2020.11.18 |

ඇමුණුම 36

**මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ පෙරකලාසි යොමු කිරීම**

- Ceylon Petroleum Storage terminals Limited ආයතනය විසින් පත්වීම් ලබා දීම සම්බන්ධව පී. තරිඳු ප්‍රසාද් ඇතුළු 49 දෙනෙකු විසින් ගොනු කර ඇති SC/FR/494/2019 දරන නඩුව සඳහා මැතිවරණ කොමිෂන් සභාවෙන් නම් කර ඇති වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙරකලාසි හා නිරීක්ෂ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ස්ථාන මාරුවීමක් සම්බන්ධව ශානි අබේසේකර මහතා විසින් ගොනු කර ඇති SC/FR/495/2019 නඩුවට අදාළව මැතිවරණ කොමිෂන් සභාවෙන් නම් කර ඇති වගඋත්තරකරුවන් වෙනුවෙන් පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට එරෙහිව පී.එල්.දේශප්‍රිය මහතා විසින් ගොනු කරන ලද DSP/08/2020 නඩුවට අදාළව පෙරකලාසි හා නිරීක්ෂණ නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ඡන්දහිමි නාමලේඛනයට නම ලියාපදිංචි නොකිරීම සම්බන්ධව කැරොලයින් නෝනා අබේවික්‍රම විසින් ගොනු කරන ලද SC/FR/25/2020 නඩුවට අදාළ පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- වෛද්‍යා විමලා ඉන්ද්‍රානි අමරකෝන් විසින් ගොනු කර ඇති 1414/18/SPL නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- Ceylon Petroleum Storage terminals Limited ආයතනයේ තනතුරුවලට බඳවා ගැනීම් සම්බන්ධයෙන් ආර්.ඩබ්ලිව්.එම්.එන්.එස්.වනිගසේකර විසින් ගොනු කර ඇති SC/FR/430/2019, පී.ජී.ඒ.එස්.ඩී. අතාවුද ඇතුළු තවත් අයෙක් ගොනු කර ඇති SC/FR/491/2019, ආර්.එච්.ගුණරත්න හා තවත් අයෙක් ගොනු කර ඇති SC/FR/492/2019, ඩබ්ලිව්.ඒ.ටී.පී. වික්‍රමරත්න සහ 09 දෙනෙකු ගොනු කර ඇති SC/FR/493/2019, නඩු සඳහා පෙරකලාසි සහ නිරීක්ෂණ නතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ආණමඩුව ප්‍රාදේශීය සභාවේ සභිකධුරයක් සම්බන්ධයෙන් ගුණසේකර ආරච්චිගේ ආරියදාස විසින් ගොනු කර ඇති SC/FR/237/2018 නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට එරෙහිව බාලගේ ආතර් සිල්වා විසින් ගොනු කරන ලද CA/Writ/554/2019 නඩුවට අදාළව 5 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය, දිවුරුම් ප්‍රකාශය සහ නිරීක්ෂණ සමඟ නඩුවට අදාළ අනෙකුත් ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරෝධය පාමින් සතාසිවම් වියාලේන්ද්‍රන් මහතා විසින් ගොනු කර ඇති SC/Expulsion/3/2019 නඩුවට අදාළ පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ඒ.එච්.එම්.ෆවුසි මහතා විසින් පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අදාළව ගොනු කර ඇති SC/Expulsion/02/2019 නඩුවට අදාළ පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරෝධය පාමින් ෆෙඩී ඩෙක්ස්ටර් ප්‍රනාන්දු මහතා විසින් ගොනු කර ඇති CA/ Writ/110/2019 නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- බන්ධනාගාරගතව සිටින තැනැත්තන්ට ඡන්ද අයිතිය ලබා දෙන ලෙස ඉල්ලමින් Committee for Protecting Rights of Prisoners (Guaranteed) Limited ආයතනය විසින් ගොනු කර ඇති SC/Writ/7/2019 නඩුවට අදාළව පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව එම්.එම්.එම්. බින්කාස් මහතා විසින් ගොනු කර ඇති CA/Writ/462/2019 නඩුවට අදාළ පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ජාතික කොංග්‍රසය විසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට ලබා දුන් නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/Writ/07/2020 නඩුවට අදාළව 1වන, 2 වන හා 3 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනාද 4 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. එම නඩුවට අදාළව අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සඳහා ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/ Writ/02/2020 නඩුවට අදාළව 1වන, 2 වන හා 3 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනාද 4 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස් ජනරාල් ද, 5 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. එම වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- අපේ ජනබල පක්ෂය විසින් කළුතර දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/Writ/06/2020 අංක දරන නඩුවෙහි 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද, 3 වන , 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන්

දෙදෙනා ද , 6 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස් ද නම් කර ඇත. එකී වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි, නිරීක්ෂණ සහ නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. ( මෙම නඩුව පෙත්සම්කාර පාර්ශවය විසින් ඉල්ලා අස් කරගෙන ඇත)

- අපේ ජනබල පක්ෂය විසින් මොණරාගල දිස්ත්‍රික්කයට ලබා දන් නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/ Writ/ 05/2020 අංක දරන නඩුවෙහි 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද, 3 වන , 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනා ද , 6 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස් ද නම් කර ඇත. එම වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි, නිරීක්ෂණ හා නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. (මෙම නඩුව පෙත්සම්කාර පාර්ශවය විසින් ඉල්ලා අස් කරගෙන ඇත)

- අපේ ජනබල පක්ෂය විසින් කොළඹ දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද SC/Writ/04/2020 නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද, 3 වන , 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනා ද , 6 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස් ද නම් කර ඇත. එම වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි, නිරීක්ෂණ සහ නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. ( මෙම නඩුව පෙත්සම්කාර පාර්ශවය විසින් ඉල්ලා අස් කරගෙන ඇත)

- අපේ ජනබල පක්ෂය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/Writ/03/2020 නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද, 3 වන , 4 වන සහ 5 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනා ද , 6 වන වගඋත්තරකරු ලෙස මැතිවරණ කොමසාරිස් ද නම් කර ඇත. එම වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි, නිරීක්ෂණ සහ අනෙකුත් ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. ( මෙම නඩුව පෙත්සම්කාර පාර්ශවය විසින් ඉල්ලා අස් කරගෙන ඇත)

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට එරෙහිව එම්.එම්.එම්.ජවුෆර් සහ එම්.එෆ්.එම්. ෆස්ලාන් යන විසින් අභියාචනාධිකරණයේ ගොනු කර ඇති අංක රහිතව අප වෙත ලැබී ඇති නඩු පෙත්සමට අදාළ ඉදිරි කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාළ ලේඛන ලබා දීම.

- ඇල්කඩුව වැව්ලි සමාගමට අයත් මිල්ලවාන වතුයායේ ජ්‍යෙෂ්ඨ වතු අධිකාරී ස්ථානමාරු කිරීම සම්බන්ධව ඩී.එස්.එන්. පෙරේරා මහතා විසින් අභියාචනාධිකරණයේ ගොනු කර ඇති

CA/Writ/94/2020 නඩුවෙහි 12 වන, 13 වන සහ 14 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනා නම් කර ඇත. එකී වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි, නිරීක්ෂණ සහ අනෙකුත් ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 ජුනි 20 දින පැවැත්වීමට එරෙහිව චරිත ගුණරත්න මහතා විසින් ගොනු කළ SC/ FR/83/2020, වික්ටර් අයිවන් ඇතුළු 8 දෙනෙකු විසින් ගොනු කළ SC/FR/85/2020, ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු විසින් ගොනු කළ SC/ FR/86/2020, පාඨලී චම්පික රණවක මහතා හා කුමාර වෙල්ගම මහතා විසින් ගොනු කළ SC/ FR/88/2020, රංජිත් මද්දුමබණ්ඩාර මහතා විසින් ගොනු කළ SC/ FR/87/2020, අබ්දුල් සරූර් මහතා සහ එස්.සී.සී.ඉලංකෝවන් මහතා විසින් ගොනු කළ SC/ FR/89/2020, ආරියවංශ දිසානායක මහතා විසින් ගොනු කළ SC/ FR/115/2020 සහ රාවුෆ් හකීම් මහතා විසින් ගොනු කළ SC/ FR/92/2020 යන නඩු සඳහා වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් ද, සාමාජික මහතුන් දෙදෙනා ද නම් කර ඇත. එකී නඩු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී නොසිටීමට තීරණය කළ නිසා පෞද්ගලික නීතිඥවරුන්ගේ සහය ලබා ගන්නා ලදී. එකී නඩු සඳහා ජනාධිපති නීතිඥ සාලිය පීරිස් සහ ජනාධිපති නීතිඥ වි. චොක්සි යන මහත්වරුන් මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින ලදී. එබැවින් ඒ මහතුන් වෙත අදාළ පෙරකලාසි, නිරීක්ෂණ සහ නඩුවට අදාළ අනෙකුත් ලේඛන යොමු කිරීම සිදු කරන ලදී.

- බී.ඒ.බී. සුමනසිරි ජයවර්ධන මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති SC/FR/320/2019 ට අදාළව පෙරකලාසි සකස් විය යුතු ආකාරය සම්බන්ධව උපදෙස් විමසමින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කරන ලදී.

- බාලක්‍රිෂ්ණන් කුගාජනී විසින් TULF පක්ෂයෙන් ඉවත් කිරීමට එරෙහිව ගොනු කර ඇති MIS/168/2018 නඩුවට අදාළව සකස් කරන ලද නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ජයතුරෙයි සිරිදරන් යන අය විසින් TULF පක්ෂයෙන් ඉවත් කිරීමට විරුද්ධව ගොනු කර ඇති MIS/167/2018 නඩුවට අදාළව නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- අපේ ජනබල පක්ෂය විසින් කළුතර දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති CA/ Writ/ 89/2020 අංක දරන නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. එකී වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. ( මෙම නඩුව ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කර ඇත)

- අපේ ජනබල පක්ෂය විසින් කුරුණෑගල දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති CA/ Writ/ 86/2020

නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. එකී වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. (මෙම නඩුව ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී)

- අපේ ජනබල පක්ෂය විසින් කොළඹ දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති CA/ Writ/87/2020 නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. (මෙම නඩුව ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී)

- අපේ ජනබල පක්ෂය විසින් මොණරාගල දිස්ත්‍රික්කයට ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අභියාචනාධිකරණයේ ගොනු කර ඇති CA/ Writ/ 88/2020 අංක දරන නඩුවෙහි 1 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ද, 2 වන වගඋත්තරකරු ලෙස දිස්ත්‍රික් සහකාර තේරීම්භාර නිලධාරී ද නම් කර ඇත. වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. (මෙම නඩුව ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී)

- සමඟි ජනබලවේගයේ නාමයෝජනා ප්‍රතික්ෂේප කරන ලෙසට ඉල්ලමින් ඔෂල හේරත් මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද SC/ Writ/01/2020 නඩුවෙහි 1 වන , 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් ලෙස මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමන් සහ සාමාජික මහතුන් දෙදෙනා ද, 4 වන වගඋත්ත්රකරු ලෙස මැතිවරණ කොමසාරිස් ජනරාල් ද නම් කර ඇත. එකී වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. (මෙම නඩුව ගරු අධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී)

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ඡන්ද ප්‍රදේශයේ මනාප ගණන් කිරීම සම්බන්ධව සනී රෝහණ කොඩිතුවක්කු යන අය විසින් ගොනු කර ඇති CA/Writ/237/2020 නඩුවට අදාළව 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන සහ 6 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අදාළව ආර්.සී.ඩබ්ලිව් ජයවික්‍රම යන අය විසින් ගොනු කර ඇති CA/Writ/254/2020 නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු විසින් අතුසන් තබන ලද පෙරකලාසිය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ස්ථානමාරු වීමක් සම්බන්ධව ශානි අබේසේකර විසින් ගොනු කර ඇති SC/FR/221/2020 යන නඩුවට අදාළව 10 වන, 11 වන සහ 13 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ශ්‍රී ලංකා පොලීසියේ උසස්වීම්වලට අදාළව කේ.ඒ. කාවින්ද පියසේකර සහ තවත් 32 දෙනෙකු විසින් ගොනු කර ඇති SC/FR/209/2020 නඩුවට අදාළව 17 වන, 18 වන සහ 19 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 වන්නි දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ලබා ගත් මනාප සම්බන්ධව ඒ. ජනක නන්ද කුමාර යන අය විසින් ගොනු කර ඇති SC/FR/266/2020 යන නඩුවට අදාළව 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන සහ 10 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම. එමෙන්ම නව මැතිවරණ කොමිෂන් සභාවක් පත් වීමෙන් අනතුරුව සංශෝධිත පෙත්සම සඳහා 2A, 3A, 4B සහ 4C වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ඡන්දහිමි නාමලේඛනයේ නම ඇතුළත් නොවීම සම්බන්ධව කේ.ඒ. වින්සන්ට් ලියෝ ධර්මරත්න සහ තවත් තිදෙනෙකු විසින් ගොනු කර ඇති SC/FR/189/2020 යන නඩුවට අදාළව 4 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 අපේ ජනබල පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සම්බන්ධව ඩබ්ලිව්. සමන් ප්‍රසන්න පෙරේරා සහ තවත් දෙදෙනෙකු විසින් ගොනු කර ඇති SC/Writ/09/2020 නඩුවට අදාළව 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 අපේ ජනබල පක්ෂයේ ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරය සම්බන්ධව ඩබ්ලිව්. සමන් ප්‍රසන්න පෙරේරා සහ තවත් දෙදෙනෙකු විසින් ගොනු කර ඇති SC/FR/274/2020 නඩුවට අදාළව 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ලලිත දර්ශන පලිහක්කාර සහ ඩිල්ශානි නිසංසලා කරුණාතිලක යන විසින් ගොනු කර ඇති DSP/10/2020 නඩුවට අදාළව මහනුවර නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් විසින් අත්සන් තබන ලද පෙරකලාසිය හා නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව පී.එම්.අරුණ සමන්ත කුමාර යන අය විසින් ගොනු කර ඇති CA/Writ/238/20 නඩුවට අදාළව 1 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අදාළව යූ.ඊ. දයාරත්න යන අය විසින් කඩුවෙල දිසා අධිකරනයේ ගොනු කර ඇති 539/SPL යන නඩුව සම්බන්ධව සහ නියෝගය සම්බන්ධව කොළඹ නාගරික මැතිවරණ කාර්යයාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් දැනුම්වත් කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව ඩී.එම්.ලක්ෂ්මන් දිසානායක යන අය විසින් ගොනු කර ඇති DSP/167/20 නඩුවට අදාළව 06 වන සහ 07 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව එච්.ඩබ්ලිව්.එස්.එස්.සංජීව යන අය විසින් ගොනු කර ඇති CA/Writ/239/20 නඩුවට අදාළව 01 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධව කේ.එන්.හසිත විජේසිංහ යන අය විසින් ගොනු කර ඇති CA/Writ/241/20 නඩුවට අදාළව 01 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 ප්‍රචාරක කාර්යයාල සම්බන්ධව ක්‍රිෂ්මාල් වර්ණසූරිය යන අය විසින් ගොනු කර ඇති SC/Writ/08/2020 අදාළව 1 වන, 2 වන සහ 3 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ශ්‍රී ලංකා පොලීසියේ උසස් කිරීම්වලට අදාළව කේ.කේ.එම්. පෙර්රා ඇතුළු 123 දෙනෙකු විසින් ගොනු කර ඇති SC/FR/193/2020 නඩුවට අදාළව 17 වන, 18 වන සහ 19 වන වගඋත්තරකරුවන් විසින් අත්සන් තබන ලද පෙරකලාසි නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට අදාළව එස්.ඒ.එන්.එල්.එස්. සේනසිංහ යන අය විසින් ගොනු කර ඇති DSP/13/2020 නඩුවට අදාළව 9 වන වගඋත්තරකරු විසින් අත්සන් තබන ලද පෙරකලාසිය සහ නඩුවට අදාළ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ජනසෙත පෙරමුණ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි විසින් ගොනු කර ඇති 566/ SP/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නිතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව මොහොමඩ් නවාස් මොහොමඩ් සිහාන් ගොනු කරන ලද 1497/20/SPL අදාළව පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව තංගරාසා ජයසන්දිරන් යන අය විසින් ගොනු කර ඇති MIs/ 263/20 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව මහේන්දිරන් මයුරන් යන අය විසින් ගොනු කර ඇති SPL/11/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- පාර්ලිමේන්තු මැතිවරණය 2020 ට අදාළව මාතලේ දිස්ත්‍රික්කයේ සමඟ ජන බල වේගයේ මනාප නැවත ගණන් කරන ලෙසට ඉල්ලමින් අලුවිහාරේ රන්ජිත් ජිනතිස්ස යන අය විසින් ගොනු කර ඇති CA/ Writ/317/2020 නඩුවට අදාළ පෙරකලාසි සහ නිරීක්ෂණ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව විශ්වලිංගම් මනිවන්නන් යන අය විසින් ගොනු කර ඇති SPL/12/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේනතුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව ලකීශන් දර්ශිබා යන අය විසින් ගොනු කර ඇති SPL/13/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේනතුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව පිලිප් ජයරන්ඩන් ඩෙයිසි යන අය විසින් ගොනු කර ඇති SPL/14/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේනතුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව ජයකුමාර් නිදර්ශන් යන අය විසින් ගොනු කර ඇති SPL/15/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේනතුව වෙත යොමු කිරීම.

- ALL Ceylon Tamil Congress පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව සිවකුමාර් ගජේන් යන අය විසින් ගොනු කර ඇති SPL/16/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේනතුව වෙත යොමු කිරීම.

- ප්‍රජාතන්ත්‍රවාදී ජනතා පෙරමුණ පක්ෂයේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට විරුද්ධව එම්.පී. විග්නේෂ්වරම් යන අය විසින් ගොනු කර ඇති CA/ EXP/01/2020 නඩු පෙත්සමෙහි පිටපතක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානයෙන් ඉවත් කිරීමට විරුද්ධව එම්.එම්.එම්. බින්කාස් යන අය විසින් ගොනු කර ඇති CA/ Writ/462/2019 නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

- අක්මීමන දයාරත්න හිමි විසින් සිංහල රාවය පක්ෂය ලියාපදිංචි කිරීම සම්බන්ධව ගොනු කර ඇති SC/FR/324/2017 නඩුවට අදාළ ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

ඇමුණුම 37

**2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ ක්‍රියාකිරීම්**

| දිස්ත්‍රික්කය | උපදෙස් ලිපි සංඛ්‍යාව |
|---|---|
| මහනුවර | 12 |
| කළුතර | 2 |
| යාපනය | 8 |
| රත්නපුර | 2 |
| ත්‍රිකුණාමලය | 3 |
| වවුනියාව | 2 |
| කුරුණෑගල | 1 |
| මන්නාරම | 1 |
| මාතර | 2 |
| නුවරඑළිය | 2 |
| බදුල්ල | 1 |
| අම්පාර | 1 |
| කෑගල්ල | 2 |
| ගාල්ල | 2 |
| කිලිනොච්චිය | 1 |
| අනුරාධපුරය | 2 |

ඇමුණුම 38

**2020 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගන්වන ලද නිලධරයින්ගේ / සේවකයන්ගේ නාම ලේඛනය**

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | මැතිවරණ කොමිෂන් සභාවේ සේවයට පැමිණි දිනය | විශ්‍රාම ගන්නා අවස්ථාවේ සේවය කළ කාර්යාලය | විශ්‍රාම ගිය දිනය | සේවා කාලය | | මුල් පත්වීමේ දිනය | උපන් දිනය | විශ්‍රාම / මියගිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සම්පූර්ණ රාජ්‍ය සේවා කාලය | මැතිවරණ කොමිෂන් සභාවේ සේවා කාලය | | | |
| | | | | | | අවු/මාස/දින | අවු/මාස/දින | | | |
| 1 | ටී.පී.ජී.කේ. නානායක්කාර මිය | ක:සේ:නි: I | 2/15/1999 | ප්‍රධාන කාර්යාලය | 3/8/2020 | 31 / 06 / 07 | 21 / 00 / 22 | 9/1/1988 | 3/8/1960 | විශ්‍රාම |
| 2 | එස.□උඩුනුවරගේ මහතා | ක:සේ:නි: II | 2/2/2009 | ප්‍රධාන කාර්යාලය | 5/7/2020 | 20 / 09 / 05 | 11 / 03 / 05 | 8/2/1999 | 5/7/1960 | විශ්‍රාම |
| 3 | ඒ.ඒ. ධර්මරත්න මහතා | රියදුරු - විශේෂ | 3/8/1993 | ප්‍රධාන කාර්යාලය | 9/25/2020 | 27 / 06 / 17 | 27 / 06 / 17 | 3/8/1993 | 9/25/1960 | විශ්‍රාම |
| 4 | ඩබ්.ආර්.කේ. බණ්ඩාර මහතා | ක:සේ:නි: III | 1/13/2014 | කෑගල්ල | 9/26/2020 | 28 / 00 / 08 | 06 / 08 / 13 | 9/18/1992 | 9/26/1960 | විශ්‍රාම |
| 5 | පී.සී.කේ. සපුතන්ත්‍රි මහතා | රියදුරු - I | 7/15/1997 | ප්‍රධාන කාර්යාලය | 11/12/2020 | 23 / 03 / 26 | 23 / 03 / 26 | 7/15/1997 | 11/12/1960 | විශ්‍රාම |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ජේපීඒ/ඊ/ඊසී/2020/එෆ්ඒ/31 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2021 ජුනි 14 දින

මැතිවරණ කොමිෂන් සභාව පාලන ශාඛාවට ලැබුණු දිනය 25 JUN 2021 රාජගිරිය

මැතිවරණ කොමසාරිස් ජනරාල්,

මැතිවරණ කොමිෂන් සභාව

**මැතිවරණ කොමිෂන් සභාව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

මැතිවරණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වීන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5** වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප නොවන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

| **ඡේද යොමුව** | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** |
|---|---|---|
| 1.4.3.1 (අ) | කොමිෂන් සභාව විසින් 20-1-1-2105 වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂය තුල රු.985,613 ක වියදමක් ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම් වෙනුවෙන් වැය කර තිබූ අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂය තුල ප්‍රාග්ධනිත කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ අන්තර්ගත කර නොතිබුණි. | 20-1-1-2105 වැය විෂයය යටතේ වර්ෂය තුල වැයකර තිබූ වියදම් ප්‍රාග්ධනිත කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ සටහන් කළ යුතුය. |

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

1.6.1.1 **පුනරාවර්තන වියදම්**

කොමිෂන් සභාව විසින් පවිත්‍රතා සේවා හා ආරක්ෂක සේවා සපයා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබූ එකතුව රු.1,465,847 ක් එම විෂයයන් සඳහා අදාළ

නොවන පාර්ලිමේන්තු මැතිවරණ වියදම් වලට අදාළ වන 20-01-1409-(2)-10M වැය විෂයය යටතේ දරා තිබුණි.

**1.6.2** මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

----------------------------------

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට වාහනවල පිරිවැය රු.143,032,850 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.150,586,977 ක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල වටිනාකම රු.1,455,823,908 ක් වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 ජනවාරි 01 දිනට ශේෂය රු.251,359,839 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) තමන්කඩුව ප්‍රදේශයේ පවතින නිල නිවසක් හා ඉඩමක් වෙනුවෙන් රු.5,500,000 ක් ප්‍රාග්ධනිත කර මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබූ නමුත් ස්ථාවර වත්කම් ලේඛනය අනුව මෙවැනි නිල නිවසක් කොමිෂන් සභාව සතුව නොපැවතුණි.

(ඈ) බදුල්ල දිස්ත්‍රික්කයේ පවත්නා ඉඩම් හා ගොඩනැගිලි යටතේ රු.55,900,000 කින් යුතු ඉඩම් හා ගොඩනැගිලි අයිතම 03 ක් ප්‍රාග්ධනිත කර තිබූ නමුත් ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.46,000,000 ක වටිනාකමකින් යුත් ඉඩම් හා ගොඩනැගිලි අයිතම 02 ක් පමණක් පැවතුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව නුවරඑළිය සංචාරක බංගලාවේ වටිනාකම රු.62,688,175 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එය රු.19,744,008 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඊ) නුවරඑළිය මැතිවරණ කාර්යාලයේ වටිනාකම ලෙස රු.37,655,991 ක අගයක් ප්‍රාග්ධනිත කර තිබුණද, ස්ථාවර වත්කම් ලේඛනය අනුව එහි වටිනාකම රු.32,777,500 ක් විය.

(උ) 2010 සැප්තැම්බර් 03 දින මඩකලපුව දිස්ත්‍රික් ලේකම් විසින් කොමිෂන් සභාවට පවරා දී තිබූ මඩකලපුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවස හා ඉඩම 2020 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව මාතලේ සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවසේ වටිනාකම රු.14,501,000 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ එය රු.13,400,000 ක් ලෙස දක්වා තිබුණි.

(එ) කොමිෂන් සභාවේ ස්ථාවර වත්කම් ලේඛනය අනුව මහනුවර දිස්ත්‍රික් නිල නිවාස ඉඩමේ වටිනාකම රු.25,755,000 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනයන්හි එය රු.25,812,500 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) ගම්පහ බැණ්ඩියමුල්ල නිල නිවස, කාර්යාල ගොඩනැගිල්ල හා ගරාජයේ වටිනාකම ලෙස ගිණුම් ගත කර ඇති වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයේ වටිනාකමට වඩා රු.942,315 කින් අධිතක්සේරු වී තිබුණි.

(ඔ) කොමිෂන් සභාව විසින් ප්‍රාග්ධනිත කර තිබූ රු.1,175,185,612 ක්වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වන නිරවුල් අයිතිය පිළිබඳව තහවුරු කිරීම් නොතිබුණි.

(ඕ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වෙනත් යන්ත්‍ර හා කාර්යාල උපකරණවල වටිනාකම රු.394,831,778 ක් වුවත්, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය රු.420,544,037 ක් ලෙස සටහන් කර තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය සඳහා 020-1-1-02102 හා 020-1-1-02103 යන වැය විෂයයන්වල මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.33,199,528 ක් වුවද ඉන් රු.33,126,828 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ග) අපහරණයන් පිළිබඳ උපලේඛනය අනුව ප්‍රවර්තන වර්ෂයේ අපහරණය කළ වත්කම්වල පිරිවැය රු.1,890,235 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වත්කම් අපහරණ පිරිවැය රු.13,197,516 ක් ලෙස දක්වා තිබුණි. තවද 2018 හා 2019 වර්ෂවල අපහරණයන් පිළිබඳ උපලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල සඳහන් අපහරණ පිරිවැයන් අතර පිළිවෙලින් රු. 3,883,977 ක හා රු. 4,953,979 ක වෙනස්කම් පැවතුණි.

**1.6.3** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

------------------------

**1.6.3.1** මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු.5,468,840,351 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.5,433,751,913 ලෙස සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය ලෙජරය අනුව භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිල දී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් වෙනුවෙන් දරන ලද වියදම් රු.41,199,528ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 68,983,765 ලෙස සටහන් කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තුල සහනාධාර හා මාරුකිරීම් රු. 4,209,529 ක් සටහන් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ අග්‍රිම නොවන ලැබීම් රු.53,187,629 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.38,120,868 ක් ලෙස දක්වා තිබුණි.

**1.6.3.2** ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ තුල අත්තිකාරම් අය කර ගැනීම් රු.20,419,166 ක් වුවත් එය රු.14,474,555 ලෙස සටහන් කර තිබුණි.

**1.6.3.3** මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ තැන්පතු ලැබීම් රු.15,618,686 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 15,233,372 ලෙස සටහන් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ තැන්පතු ගෙවීම් රු. 18,311,539 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු. 9,875,355 ලෙස සටහන් කර තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාහන පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය හා වාහන අනතුරු ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

(ඇ) මාතර දිස්ත්‍රික් කාර්යාලය විසින් නිවාඩු ලේඛනය හා බැහැර යෑමේ ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ආයතන සංග්‍රහයේ xix වැනි පරිච්ඡේදය | |
| (i) 5.2 හා 5.3 ඡේදය | උපලේඛනගත නිවාස හිමිකමක් ඇති නිලධාරින්ගේ වැටුපෙන් සියයට 10 ක්ද උපලේඛනගත නිවාස ලබා ගැනීමට හිමිකමක් නොමැති විවාහක නිලධාරින්ගේ වැටුපෙන් සියට 12 ½ ක්ද වශයෙන් නිවාස කුලී අය කළ යුතු වුවත් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළු නිලධාරින් සිව්දෙනෙකුගෙන් ආයතන සංග්‍රහය පරිදි නිවාස කුලී අයකිරීමට කටයුතු නොකර මසකට රු.2,000 බැගින්ද කොමිෂන් සභාවේ එක් සාමාජිකයෙකුගෙන් මසකට රු.1,500 ක්ද වශයෙන් ආර්ථික කුලී අයකර ගෙන තිබුණි. |

| | |
|---|---|
| (ii) 5.6 ඡේදය | නිශ්චිත නිවාස සඳහා කුලී අයකර ගැනීමේ දී ප්‍රාදේශියලේකම්වරයාට ඇති බලතල මත ක්‍රියා කළ යුතු වුවත් කොමිෂන් සභාව ආර්ථික කුලිය අය කිරීමේදී එවැනි අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 137 | • කොමිෂන් සභා පරිශ්‍රයේ පැවති ගසක් කපා ඉවත් කිරීම සඳහා රු 32,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර තිබියදී ගස කපා ඉවත් නොකර ගසේ අතු ඉවත් කිරීම වෙනුවෙන් එම මුළු මුදලම ගෙවා තිබුණි.<br>• ආයතන ප්‍රධානියා විසින් cctv කැමරා 20 ක් පමණක් මිලදී ගැනීමට අනුමත කර තිබියදී cctv කැමරා 52 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.2,542,004 ක් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 138 (8) | මාතර දිස්ත්‍රික් කාර්යාලය විසින් සිදු කළ ගෙවීම්වලට අදාල වවුචර්වල ලිපිගොනු සම්බන්ධතාවය දක්වා නොතිබුණි. |
| (ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ iv ඡේදය | වේලා සටහන් යන්ත්‍රයේ ඇඟිලි සලකුණු තැබීමකින් තොරව තාවකාලික පදනම යටතේ පූර්ණකාලීනව සේවයේ නියුතු එක් නිලධාරියෙකුට නිවාඩු දින දීමනා ලෙස රු.82,392 ක් ගෙවා තිබුණි. |
| (ඇ) 2018 අගොස්තු 16 දිනැති අංක PS/ACU/CCU/01/02 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | • ස්වාධීන කොමිෂන් සභාවන්හි සභාපතිවරුන්ට නිලවාහනයක් හා ඉන්ධන ලීටර 225 ක් හෝ |

වෙළෙඳපොළ මිල ගණන් අනුව ඉන්ධන දීමනාවක් හිමි වුවද ඊට පරිබාහිරව කොමිෂන් සභාවේ සභාපතිවරයාට 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුල රු.374,460 ක් වටිනා ඩීසල් ලීටර 1,456 ක් හා පෙට්‍රල් ලීටර 1,628 ක් ලබා දී තිබුණි.

- කොමිෂන් සභාවන්හි සභාපතිවරුන්ට හා සාමාජිකයින්ට නිල නිවාස හිමිකමක් නොමැති වුවද සභාපතිවරයාට හා එක් සාමාජිකයෙකුට ආර්ථික කුලියක් ලබා ගනිමින් නවාතැන් පහසුකම් ලබා දී තිබුණි.

- කොමිෂන් සභාවේ සභාපතිවරයාට චක්‍රලේඛයේ ඉඩ දී ඇති දුරකථන දීමනාවට අතිරේකව සමාලෝචිත වර්ෂයේ ජුනි, ජුලි හා අගෝස්තු මාස සඳහා විශේෂ දුරකථන දීමනාව ලෙස රු.60,000ක් ගෙවා තිබුණි.

| | |
|---|---|
| (ඉ) 2004 ජුලි 22 දිනැති අංක අමප/04/0716/001/018 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය | නිල කාලය සම්පූර්ණවීම හේතුවෙන් ඡන්ද විමසීම පැවැත්වීමට සිදුවන අවස්ථාවලදී එම ඡන්ද විමසීමට අදාල නාමයෝජනා භාරදීමේ දිනයට පෙරාතුවම වන එක් මාසයක කාලයකින් ආරම්භව ඡන්ද විමසීම නිමවී මාස 04 ක් දක්වා මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලබන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් සීමිත සංඛ්‍යාවකට රාජ්‍ය |

| | |
|---|---|
| | පරිපාලන චක්‍රලේඛයන්හි දක්වා ඇති සීමාවන් අභිබවා නිවාඩු දින දීමනා ගෙවිය හැකි වුවත්, 2020 ජනාධිපතිවරණයට අදාල නිවාඩු දින දීමනා ගෙවිමේදී ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් සියළුම මාණ්ඩලික නිලධාරින්ට 2020 මාර්තු 02 දින සිට අගෝස්තු 05 දින දක්වා කාලය තුල පැවති සියළු නිවාඩු සඳහා නිවාඩු දින දීමනා ලෙස රු.2,583,019 ක් ගෙවා තිබුණි. |
| (ඊ) 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛය 5 ඡේදය | එකාබද්ධ අරමුදලේ හෝ වෙනත් කිසිදු ව්‍යවස්ථාපිත අරමුදලක මුදල් උපයෝගී කරගෙන 2020 වර්ෂය සඳහා දින පොත් හා කැලැන්ඩර් මුද්‍රණය කිරීම සිදු නොකළ යුතු වුවත් 2020 වර්ෂය සඳහා රු.199,500 ක වියදමක් දරමින් දින සැලසුම් පොත් 300 ක් මුද්‍රණය කර තිබුණි. |
| (උ) 2020 අගෝස්තු 12 දිනැති අංක 2020/03 දරන මැතිවරණ කොමිෂන් සභා චක්‍රලේඛය | මැතිවරණ රාජකාරි සඳහා දීමනා ගෙවීමේදී ඒ සඳහා පත්වීමේ ලිපියක් හා රාජකාරි ඉටු කළ බවට පැමිණීමේ සහතිකයකින් සනාථ කළ යුතු වුවත් රු.1,284,757 ක්වූ මැතිවරණ දීමනා එවැනි සනාථ කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |

## 2.2 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා, එක් සාමාජිකයෙකු සහ නිලධාරීන් දෙදෙනෙකු විසින් කොමිෂන් සභාව සතු රජයේ දේපළක් පදනම් කරගෙන පෞද්ගලික ගනුදෙනුවක් සිදු කර මෙට්‍රෝ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් රු.5,200,000 ක් ලබා ගෙන තිබුණි.

(ආ) 2016 ජුලි 05 සිට අනුමැතිය ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කොමිෂන් සභා සාමාජිකයින්ට තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යෑමට ඇති දුර කි.මී.350 ට වැඩි ප්‍රමාණයක් නම් ඒ වෙනුවෙන් රු.50,000 ක ප්‍රවාහන දීමනාවක් ලබා දිය හැකි වුවත් බම්බලපිටිය ග්ලේන් ආබර් ගොඩනැගිල්ලෙහි ආර්ථික කුලියක් ගෙවමින් පදිංචිව සිටි කොමිෂන් සභා සාමාජිකයෙකුට වසර 04ක කාලපරිච්ඡේදයක් සඳහා රු.50,000 බැගින් රු.2,400,000 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 3.1 ප්‍රසම්පාදනයන්

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 ඡේදය ප්‍රකාරව ලංසු කැඳවීමේ ආරාධනයෙහි ජයග්‍රාහී ලංසුකරුට තිබිය යුතු, සෘජුවම සුදුසු බව තහවුරු කෙරෙන උපමාන සහ සුදුසුකම් පිළිබඳව අවශ්‍යතා ඇතුලු ලංසු හෝ මිල සැඳැහුම් පිළියෙල කිරීමට ලංසුකරුට අවශ්‍ය වන උචිත හා අදාළ මූලික තොරතුරු ඇතුළත් කළ යුතු වුවත් රු.374,058 ක පිරිවැය වූ 100ml හා 500ml අත් පිරිසිදු කාරක මිල දී ගැනීමේ හා රු.223,560 ක පිරිවැය වූ අත් පිරිසිදු කාරක දියර කෑන් (5l ) මිල දී ගැනිමේ ප්‍රසම්පාදනවලදී එපරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ඡේදය ප්‍රකාරව භාණ්ඩ ලබා ගැනීම සඳහා මූලාශ්‍ර කිහිපයක් පමණක් පවතින අවස්ථාවලදී සීමිත ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ ක්‍රමවේදය භාවිතා කළ යුතු වුවත්, වෙළඳපොල මිල සැඳැහුම් ක්‍රමය භාවිත කළ යුතු, සැපයුම්කරුවන් විශාල සංඛ්‍යාවක් පවතින සම්මත පිරිවිතරයන්ගෙන් යුත් අඩු වටිනාකමින් යුත් භාණ්ඩ මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන අවස්ථා 12ක දී සීමිත ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ ක්‍රමවේදය භාවිතා කර තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.2.2 ඡේදය ප්‍රකාරව සීමිත ජාතික තරඟකාරි ලංසු කැඳවීමේදී, ලංසු කැඳවීමේ අවම කාලය දින 21 ක් වුවත් ප්‍රසම්පාදන අවස්ථා 05 කදී ලංසු කැඳවීම සඳහා එම අවම කාලය ලබා දී නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 32 අතිරේකයට පටහැනිව, තාක්ෂණික ඇගයීම් කමිටු හා ප්‍රසම්පාදන කමිටු පැවැත්වූ වේලාව පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව ප්‍රසම්පාදන කාර්යයන් 17කට අදාලව රු.1,010,500 ක් කමිටු සාමාජිකයින් හා කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

(ඉ) සීමිත තරඟකාරී මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කළද ඒ සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අනුගමනය නොකරන ලද ප්‍රසම්පාදන වටිනාකම රු. මිලියන 12 ට අඩු ප්‍රසම්පාදන කාර්යයන් 04 ක් සඳහා කමිටු සාමාජිකයින් හා කාර්ය මණ්ඩලයට රු.123,000 ක් ගෙවා තිබුණි.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 32 අතිරේකයට පටහැනිව, වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් සිදු කරන ලද ප්‍රසම්පාදන කාර්යයන් 17 කට අදාළව කමිටු සාමාජිකයින් සහ අනෙකුත් කාර්ය මණ්ඩලයට රු.399,500ක් ගෙවා තිබුණි.

(උ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුව විෂය පිළිබඳ විශේෂඥයකුගෙන් හෝ විශේෂඥයන්ගෙන් සහ ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැනුම ඇති අවම වශයෙන් එක් සාමාජිකයෙක්ගෙන්ද සමන්විත විය යුතු වුවත් රු.89,319,056 ක වියදමින් අත් පිරිසිදුකාරක මිල දී ගැනීමේ දී ඊට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයකු පත් කර නොතිබුණි.

(ඌ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) ඡේදය ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ සමාන හා උපරිම අවස්ථාව ලබා දීම සිදු කළ යුතු වුවත් 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා රු.89,319,056 ක වියදමින් අත් පිරිසිදුකාරක මිලදී ගැනීමේදී ආයතන 37 ක් ලංසු ඉදිරිපත් කර තිබු අතර ඉන් ආයතන 11 ක පමණක් සාම්පල් පරීක්ෂණ වාර්තා ඇගයීමට භාජනය කර තිබුණි.

(එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8 (අ) ඡේදය ප්‍රකාරව ලංසුව සමඟ අවශ්‍ය ලංසු සුරක්ෂණය ඉදිරිපත් කර නැත්නම් ලංසුව ප්‍රතික්ෂේප කර තවදුරටත් සලකා බැලීමෙන් බැහැර කරනු ලැබිය යුතු නමුත්, ලංසු සුරක්ෂණය ඉදිරිපත් නොකළ ආයතනයකට විඡු කඩදාසි මිලදී ගැනීමට අදාළව රු.8,175,492 ක වටිනාකමකින් යුත් ප්‍රසම්පාදනයක් පිරිනමා තිබුණි.

(ඒ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.13 ඡේදය ප්‍රකාරව භාණ්ඩ සම්බන්ධයෙන්, සපයන ලද භාණ්ඩ, පිරිවිතරවලට හා වෙනත් එකඟ වූ නියමයන්ට අනුකුල බව, සපයා

ඇති භාණ්ඩ ප්‍රමාණය කොන්ත්‍රාත් විධිවිධානවලට අනුකූල බව හා එම භාණ්ඩ සඳහා සාමාන්‍යයෙන් සපයනු ලබන වගකීම් සහතික, සුරක්ෂණ සහතික හා අත්පොත් විශේෂයෙන් එකඟ වූ අයුරු සපයා ඇති බවට ස්ථාන භාර නිලධාරියා විසින් සහතිකයක් නිකුත් කළ යුතු වුවත් එකතුව රු 8,402,292 ක්වූ ටිෂු කඩදාසි මිලදී ගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පිරිවැය රු.144,900 ක්වූ යතුරු පැදියක් භාවිතයෙන් තොරව කොමිෂන් සභා පරිශ්‍රයේ ගාල් කර පැවතුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයට යාබදව පිහිටි හීන් ඇල පරිශ්‍රයේ, කොමිෂන් සභාවට අයත් නොවූ ඉඩමක රජයේ වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි.

(ඇ) ඉදිරි පස පිළිගැනීමේ කවුන්ටරය අසල බිත්තියේ ආයතනයේ දැක්ම හා මෙහෙවර සඳහන් පුවරු සකස් කිරීමේදී එය නිසි සැලසුමකින් තොරව සිදු කිරීම හේතුවෙන් එක් වරක් සවි කළ අකුරු එහි වර්ණ නොගැලපීම මත නැවත වරක් සවි කිරීමට රු.38,500 ක අතිරේක වියදමක් දරා තිබුණි.

**3.3 පාඩු හා හානි**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ 2018 හා 2019 වර්ෂවල සිට පැවත එන එකතුව රු.122,900 ක්වූ අලාභ 2020 දෙසැම්බර් 31 දින වන විටත් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොමිෂන් සභාව සතු කැබ් රථයක් සමාලෝචිත වර්ෂය තුල අවස්ථා දෙකකදී අනතුරට ලක් වීම හේතුවෙන් අයකර ගත නොහැකි වූ අලාභය රු.35,417 ක් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී මෙට්ට 27ක් අතුරුදහන් වීමෙන් සිදුවූ රු.15,000 ක අලාභය 2020 වර්ෂයේදී හානි පිළිබඳ ලේඛනයට ඇතුළත් කර තිබූ නමුත් පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.

3.4 අනාර්ථික ගනුදෙනු

---

කැමරා 32 කින් යුතුව රු.976,361 ක වියදමක් දරමින් කොමිෂන් සභා කාර්යාලයෙහි 2018 වර්ෂයේ දී ස්ථාපිත කරන ලද CCTV කැමරා පද්ධතිය මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව 2020 වර්ෂයේදී ගලවා ඉවත් කොට කැමරා 52 කින් යුතු නව පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. පැරණි පද්ධතියෙන් ඉවත් කරන ලද කැමරා 12 ක් පමණක් මේ වන විට ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ස්ථාපිත කර ඇති අතර පැරණි පද්ධතියේ තවත් කැමරා 20 ක් භාවිතයකින් තොරව පැවතුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

---

2020 දෙසැම්බර් 31 දිනට කල් බදු කාලය අවසන්ව ඇති වාහන 13 ක් පවරා ගෙන නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

---

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

---

කොමිෂන් සභාව විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන් හදුනා ගැනීම සිදු කර නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් අනුමත කර ගෙන තිබූ තනතුරු 06 ක්, වසර 2 ත් වසර 6 ත් අතර කාලයක සිට පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා දිගින් දිගටම වැඩබැලීමට/රාජකාරි ඉටු කිරීමට නිලධාරීන් පත් කර තිබුණි.

(ආ) අනුමත සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරු සංඛ්‍යාව 20ක් වුවත් තත්‍ය සංඛ්‍යාව 23ක් විය.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2019 සැප්තැම්බර් 30 දින සිට වසරක කාලයක් සඳහා තාවකාලික පදනම මත තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරක් අනුමත කර තිබුණි. ආයතනය විසින් කොළඹ මහ නගර සභාවෙන් සැලසුම් ශිල්පී I සේවයේ නියුතු නිලධාරියෙකු නිදහස් කරගෙන එම නිලධාරියා කාර්මික නිලධාරි තනතුරට අනුයුක්ත කර තොරතුරු හා සංනිවේදන තාක්ෂණ නිලධාරි තනතුරේ වැඩ බැලීමට පත්කර වසරකට අධික කාලයක් සේවයේ යොදවා ගෙන තිබූ අතර කාර්මික නිලධාරී තනතුරට කොන්ත්‍රාත් පදනමින් විශ්‍රාමික නිලධාරියෙක් පත්කර තිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් අනුමත තනතුරු 05කට අදාළව වැඩබැලීම/රාජකාරි ඉටු කිරීම සඳහා නිලධාරීන් පත් කර තිබූ අතර එම නිලධාරීන්ගේ නිත්‍ය තනතුර ද විගණනයට තහවුරු කර නොතිබුණි.

එම්.ජී.ටී.ජී.පී.ප්‍රනාන්දු,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.